

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

# වාර්ෂික වාර්තාව

# 2013

"පොල් වගාකිරීමේ මණ්ඩලය
කප්තුරුපියස
9/428,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.



# දැක්ම



ශ්‍රී ලංකාව ලෝකයේ වඩාත්ම කාර්යක්ෂම පොල් නිෂ්පාදකයා කරවීම

# මෙහෙවර



ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම සහ අපනයන අවශ්‍යතාවය සපුරාලමින් , ස්වයංපෝෂිත තත්වයක් ළඟාකර ගැනීම පිණිස ඵලදායී උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මඟින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමත්, පොල් ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීමත් තුලින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම අපගේ මෙහෙවර වේ.



# ඇතුලත පිටු


හැඳින්වීම

පොල් වගාකිරීමේ මණ්ඩලය ගැන සැකෙවින්

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සුවිශේෂී කාර්යයන්

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යුහය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

අධ්‍යක්ෂ මණ්ඩලය 2013

සභාපතිතුමාගේ පණිවිඩය

පොල් සංවර්ධන වැඩසටහන - 2013

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති කටයුතු

වැලිගම කොළ මැළවීමේ හා කුණුවීමේ රෝග මර්ධන වැඩසටහන

ආදර්ශ පොල් උයන්

මානව සම්පත් කළමනාකරණය

අභ්‍යන්තර විගණනය

ගිණුම් ප්‍රකාශනය

විගණකාධිපතිගේ වාර්තාව

විගණකාධිපතිගේ වාර්තාව ගැන පැහැදිලි කිරීම්

දමිළ පරිවර්තනය

ඉංග්‍රීසි පරිවර්තනය

# වාර්ෂික වාර්තාව -2013

## හැඳින්වීම

2013 ජනවාරි මස 01 වෙනි දින සිට 2013දෙසැම්බර් 31 වෙනි දින දක්වා කාලය තුළ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මෙම වාර්තාවට ඇතුළත් කොට ඇත.

පොල් වගාකිරීමේ මණ්ඩලය, 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ අංක 02 යටතේ දිවයිනේ පොල් වගාවේ සංවර්ධනය අරමුණු කොට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 1972 මාර්තු මස 30 වෙනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයකින් පිහිටුවනු ලැබීය.

එකී පනතේ ප්‍රකාරව මණ්ඩලයේ කාර්ය භාරය පහත දැක්වෙන අයුරු අර්ථ දක්වා ඇත.

★ පොල් වගා කළ ඉඩම්වල ඵලදාව වර්ධනය කිරීම හා එලෙස වර්ධනය කිරීමේලා සහාය වීම.

★ ඉඩම්වල පොල් වගාකිරීම, ඒවා වගාකිරීම වැඩිදියුණු කිරීම හා විධිමත් කිරීමට සහාය වීම. (තෘණ ඇතුළුව)වෙනත් වගාවන්ගෙන් අතුරු වගාව සඳහා සුදුසු පොල් වගා කළ ඉඩම් තෝරා ගැනීම හා එකී ඉඩම්වල අතුරු වගා වැඩපිළිවෙල වැඩි දියුණු කිරීම, මෙහෙයවීම, පවත්වාගෙන යාම සහ පවත්වාගෙන යාමට සහාය වීම. පොල් වගා කළ ඉඩම්වල සත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම හා විධිමත් කිරීම, ඊට සහාය වීම හා එහි නියුක්ත වීම.

★ පොල් වගාකළ ඉඩම්වල පොල් හා වෙනත් බෝග වැවීම සම්බන්ධයෙන් නිසි වගා ක්‍රම විස්තර කිරීම, ජනප්‍රිය කිරීම, වැඩි දියුණු කිරීම හා මෙහෙයවීම.

★ පොල් කර්මාන්තයට සහාය වීම, උපදේශක හා ව්‍යාප්ති සේවකයින් පුහුණු කිරීම.



## ඉලක්ක

පොල් පරිභෝජනය කරන්නන්ගේ හා සැකසුම්කරුවන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් වන ලෙස ගෙඩි ඵලදාවේ තිරසාරභාවය තහවුරු කිරීම සඳහා පොල් ගස් ගහණය වැඩි කිරීම.

සත්ත්ව පාලන/ අතුරු බෝග විවිධාංගීකරණය හරහා පොල් ඉඩම්වල ඵලදායීතාවය හා ගොවිපළ ආදායම වැඩි කිරීම.

පොල් වගා සහ සුළු හා මධ්‍ය පරිමාණ පොල් ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි යොමු කරනු වස් කුඩා ඉඩම් හිමියන් ප්‍රජා මූල සංවිධාන ගත කර ඔවුන් සඳහා රැකියා අවස්ථා ජනිත කර දිළිඳුකම පිටු දැකීම.

රටේ ආහාරමය හා කර්මාන්ත ඉල්ලුම සපුරාලීම සඳහා 2016 වන විට වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3650 දක්වා ඉහළ නැංවීම.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සියලු පොල් වතු ආදර්ශ පොල් උයන් තත්වයට පත් කිරීම හා 2016 වන විට ලාභය 20%කින් වැඩි කිරීම.

## අරමුණු

ශ්‍රී ලංකාව තුළ තිරසාර පොල් වගාවක් ස්ථාපනය කිරීම

පොල් ඉඩම් සඳහා සුදුසු අතුරුබෝග වගාකිරීමෙන් පොල් ඉඩම්වල උපයෝගීතාවය ඉහළ දැමීම.

කප්රුක පුරවර වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම.

කාබනික හා අකාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම.

පොල් ඉඩම් තුළ පාංශු හා ජල සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම.

පලිබෝධ හා රෝගවලින් පොල් වගාවට වන හානිය අඩු කිරීම.

පොල් වගාකරුවන්ගේ කුසලතා සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්, වගාකරුවන් දැනුවත් කිරීම සඳහා යොදා ගැනීම.

ඉල්ලුම පදනම් කරගත් ව්‍යාප්ති සේවාවන් පවත්වාගෙන යාම සහ උසස් තත්ත්වයේ යෙදවුම් ලබාදීම.

ගෘහස්ථ පරිභෝජනයට, පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ට හා විදේශීය වෙළඳපලට අවශ්‍ය වන පොල් ප්‍රමාණය රට තුළ නිෂ්පාදනය කිරීම.

# පොල් වගාකිරීමේ මණ්ඩලය ගැන තොරතුරු......

1971 අංක 46 දරණ පොල් සංවර්ධන ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ ඇති බලතල අනුව 1972 මාර්තු 30 වෙනි දින නිකුත් කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව පොල් වගාකිරීමේ මණ්ඩලය ස්ථාපිත කරන ලදී. දිවයිනේ පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර වඩාත් විධිමත්ව හා ඵලදායිතාවයෙන් යුක්තව සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල 18 ක්, පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන 03 ක්, තවාන් 38 ක්, ආදර්ශ පොල් උයන් 12 ක් හා බීජ නිෂ්පාදන ඒකකයකින් පොල් වගාකිරීමේ මණ්ඩලය සමන්විත වේ.

| | |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 9/428, පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>කප්රුක පියස,<br>ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>බත්තරමුල්ල.<br>දුරකථන - 0115 639833, 0115 548998, 0115 549504<br>ෆැක්ස් - 0115 549507<br>විද්‍යුත් තැපැල - ccb@sltnet.lk<br>වෙබ් අඩවිය - www.coconut.gov.lk |
| පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයන් | ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය<br>බැණ්ඩියමුල්ල,<br>ගම්පහ.<br>033-2222037<br><br>කළුතර ප්‍රාදේශීය කාර්යාලය<br>නාගොඩ,<br>කළුතර.<br>034-2222732<br><br>රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය<br>නව නගරය,<br>කෙළින් වීදිය,<br>රත්නපුරය.<br>045-2228561<br><br>මාරවිල ප්‍රාදේශීය කාර්යාලය<br>මුදුකටුව,<br>මාරවිල.<br>032-2254237<br><br>මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය<br>හුලංදාව දකුණ,<br>මොණරාගල.<br>055-2276058<br><br>අම්පාර ප්‍රාදේශීය කාර්යාලය<br>ධර්මපාල මාවත,<br>කච්චේරිය ඉදිරිපිට,<br>අම්පාර.<br>063-2222477<br><br>මාතලේ ප්‍රාදේශීය කාර්යාලය<br>කච්චේරි සංකීර්ණය,<br>මාතලේ.<br>066-2222047<br><br>මාතර ප්‍රාදේශීය කාර්යාලය<br>අංක 331/9,<br>අනගාරික ධර්මපාල මාවත,<br>නූපේ,<br>මාතර.<br>041-2222060<br><br>යාපනය ප්‍රාදේශීය කාර්යාලය<br>අංක 596 / 10,<br>නාවලර් පාර,<br>නල්ලූර්,<br>යාපනය.<br>021-2226014 |

## පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයන්

කුලියාපිටිය ප්‍රාදේශීය කාර්යාලය
අංක 20,
පන්නල පාර,
කුලියාපිටිය.
037-2281169

කැගල්ල ප්‍රාදේශීය කාර්යාලය
නුවර පාර,
කරඬුපන,
කැගල්ල.
035-2222120

කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය
වෑහැර,
කුරුණෑගල.
037-2222534

ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය
ලබුදූව,
අක්මීමන,
ගාල්ල.
091-2234501

අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය
111 පියර,
දහයියාගගම හන්දිය,
අනුරාධපුරය.
025-2222543

මඩකළපුව ප්‍රාදේශීය කාර්යාලය
මයිලම්බවෙලි,
තන්නමුනෙයි,
මඩකළපුව.
065-2240103

හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය
අංක 27,
තංගල්ල පාර,
හම්බන්තොට.
047-2220144

පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය
නව නගරය,
පොළොන්නරුව.
027-2222377

ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය
පුල්මුඩේ පාර,
කුඹුරුප්පිඩ්ඩි,
ත්‍රිකුණාමලය.
026-3207044

## පොල් සංවර්ධන නිලධාරී කොට්ඨාශ 225ක්

පොල් සංවර්ධන නිලධාරීන් 325ක්

# පොල් පැළ තවාන් 38ක්

වැලිපිටිය පොල් පැළ තවාන,
වැලිපිටිය වත්ත,
නන්නපුරව.
055-2265720

මයිලම්බවේලි පොල් පැළ තවාන,
මයිලම්බවේලි,
වෙන්කලඩි,
තන්නමුනෙයි.
065-2240924

කුඹුරුප්පිඩ්ඩි පොල් පැළ තවාන,
ප්‍රධාන පාර,
කුඹුරුප්පිඩ්ඩි,
ත්‍රිකුණාමලය.
026-3207042

අච්චුවේලි පොල් පැළ තවාන,
වාසවිලාන් පාර,
අච්චුවේලි,
යාපනය.

වල්ලිපුනම් පොල් පැළ තවාන,
වල්ලිපුනම්,
පුදුකුඩිඉරුප්පු.

අලම්පිල් පොල් පැළ තවාන,
අලම්පිල්,
මුලතිව්.

පල්ලෙකැලේ පොල් පැළ තවාන,
පල්ලෙකැලේ,
කෙන්ගල්ල.
081-5740595

මයුරපුර පොල් පැළ තවාන,
හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය,
අංක 27,
තංගල්ල පාර,
හම්බන්තොට.
047-2220144

උල්හිටිය පොල් පැළ තවාන,
උල්හිටිය,
ගිරාදුරුකෝට්ටේ.
027-2179230

පරාක්‍රම සමුද්‍රය පොල් පැළ තවාන,
රිවඩ් අලුවිහාරේ උද්‍යානය,
පොළොන්නරුව.
027-2224304

මැදමුලන පොල් පැළ තවාන,
මැදමුලන,
වීරකැටිය.
047-2246359

ඇඹිලිපිටිය පොල් පැළ තවාන,
තුංකම,
ඇඹිලිපිටිය.
047-2230569

වැලිගම පොල් පැළ තවාන,
පාතේගම,
වැලිගම.
041-2252336

බද්දේගම පොල් පැළ තවාන,
පෙඩ්රුවත්ත,
හල්පතොට,
බද්දේගම.
091-2292745

ලබුදූව පොල් පැළ තවාන,
ලබුදූව,
අක්මීමන.
091-2234501

මහයාය පොල් පැළ තවාන,
මාකඳුර,
ගෝනවිල.

උහන පොල් පැළ තවාන,
පාලම් කඳවුර,
උහන.
063-2224167

# පොල් පැළ තවාන් 38ක්

වල්පිට පොල් පැළ තවාන
වල්පිට,
කොටදෙණියාව.
033-2272559

කිරිදිවැල පොල් පැළ තවාන
කිරිදිවැල.
033-2267704

එරමිණිගොල්ල පොල් පැළ තවාන
හිරිවඩුන්න.
035-2265806

මත්තමගොඩ පොල් පැළ තවාන
මත්තමගොඩ,
කනන්තොට.
035-2289105

කොරොස්දූව පොල් පැළ තවාන
කොරොස්දූව,
වාද්දූව.
038-2295126

ඉබ්බාගමුව පොල් පැළ තවාන
තෝරයාය,
ඉබ්බාගමුව.
037-2235776

දොඩම්ගස්ලන්ද පොල් පැළ තවාන
බලවත්තල වත්ත,
දොඩම්ගස්ලන්ද.
037-2252625

වාරියපොල පොල් පැළ තවාන
වාරියපොල.
037-2267691

නිකවැරටිය පොල් පැළ තවාන
නිකවැරටිය.
037-3988035

වෙන්නෝරුව පොල් පැළ තවාන
මුතුගල වත්ත,
වෙන්නෝරුව.
037-2249836

පොල්ගහවෙල පොල් පැළ තවාන
සෙරපීස් වත්ත,
කෑගල්ල පාර,
පනලීය,
පොල්ගහවෙල.
037-2244367

# පොල් පැළ තවාන් 38ක්

දියදොර පොල් පැළ තවාන
පහළ දියදොර.
037-2282537

බිංගිරිය පොල් පැළ තවාන
ප්‍රසන්නගම,
බිංගිරිය.
032-2246425

හෙට්ටිපොළ පොල් පැළ තවාන
මලගනේ,
හෙට්ටිපොළ.
037-2291332

කන්දෙටිය පොල් පැළ තවාන
කන්දෙටිය,
මාකඳුර,
ගෝනවිල.
031-2299386

කිරිමැටියාන පොල් පැළ තවාන
කිරිමැටියාන,
ලුණුවිල.
031-2257504

කලාවැව පොල් පැළ තවාන
කලාවැව,
විජිතපුර.
025-2264194

විල්පොත පොල් පැළ තවාන
විල්පොත,
බත්තුළුඔය.
032-5671077

හඳපානාගල පොල් පැළ තවාන
ඇතිලිවැව,
හඳපානාගල.
055-2274665

අට්ටවිල්ලුව පොල් පැළ තවාන
අට්ටවිල්ලුව,
පුත්තලම.
032-5670793

කිලිනොච්චි පොල් පැළ තවාන,
පන්නණ්කන්ඩි,
කිලිනොච්චිය.

| | |
|---|---|
| ආදර්ශ බීජ පොල් උයන් 12ක් | මහයාය ආදර්ශ පොල් උයන,<br>මාකඳුර,<br>ගෝනවිල.<br>031-2299781<br><br>ඩේසිවැලි ආදර්ශ පොල් උයන,<br>මාවතගම.<br>037-2288601<br><br>රත්දෙණිය ආදර්ශ පොල් උයන,<br>වාරියපොල.<br>037-4923041<br><br>බෝපිටිය ආදර්ශ පොල් උයන,<br>කු/ බෝපිටිය.<br>037-2288601<br><br>නාගන්සෝල ආදර්ශ පොල් උයන,<br>වන්නි,<br>රස්නායකපුර.<br>037-4944464<br><br>කොහොඹාන ආදර්ශ පොල් උයන,<br>ගොනාගොල්ල.<br>063-3632186<br><br>මුන්දලම ආදර්ශ පොල්උයන,<br>මුන්දලම<br>032-2052355<br><br>ගර්ට්ලන්ඩ් ආදර්ශ පොල් උයන,<br>නාඹිරිත්තන්කඩවල,<br>වැලිපැන්නගහමුල්ල.<br>037-4930928<br><br>ලේනව ආදර්ශ පොල් උයන,<br>හිරියාල,<br>ලේනව.<br>037-4944425<br><br>පාසිකුඩා ආදර්ශ පොල් උයන,<br>කල්කුඩා.<br>065-3659028<br><br>පලෙයි ආදර්ශ පොල් උයන,<br>පලෙයි.<br>0212050013<br><br>කොරෙයි ආදර්ශ පොල් උයන,<br>තිරුක්කෝවිල්.<br>067-3694530 |
| පුහුණු මධ්‍යස්ථාන 03ක් | පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය<br>බණ්ඩිරිප්පුව වත්ත,<br>ලුණුවිල.<br>031-2255048<br><br>දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය<br>මැදමුලන,<br>වීරකැටිය.<br>047-2257534<br><br>නැගෙනහිර පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය<br>පාසිකුඩා ආදර්ශ පොල් උයන,<br>කල්කුඩා.<br>065-2050224 |

| | |
|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය 925ක් | සාමාන්‍යාධිකාරී 01<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී 04<br>සහකාර සාමාන්‍යාධිකාරී 08<br>ප්‍රාදේශීය කළමනාකරුවන් හා<br>විෂය භාර කළමනාකරුවන් 36<br>සහකාර කළමනාකරුවන් 82<br>භාෂා පරිවර්ථකයින් 02<br>කළමනාකරණ සහකාර<br>(තාක්ෂණික) 365<br>කළමනාකරණ සහකාර<br>(තාක්ෂණික නොවන) 276<br>ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් 151 |
| බීජ නිෂ්පාදන ඒකකයක් | බීජ නිෂ්පාදන ඒකකය<br>අංක 19,<br>තම්මිට පාර,<br>මීගමුව.<br>031-2226119 |
| නිළධාරී නිවාස | අනුරාධපුර නිලධාරී නිවාසය<br>අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය,<br>පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>111 පියවර, දහයියාගම හන්දිය,<br>අනුරාධපුරය.<br>025-3243554<br><br>බෝපිටිය නිලධාරී නිවාසය<br>බෝපිටිය ආදර්ශ පොල් උයන,<br>කු/ බෝපිටිය.<br>037-2288601<br><br>පලෙයි නිලධාරී නිවාසය<br>පලෙයි ආදර්ශ පොල් උයන,<br>පලෙයි.<br>021-2050013 |







| | |
|---|---|
| නිළධාරී නිවාස | හඳපානාගල නිලධාරී නිවාසය<br>හඳපානාගල පොල් පැළ තවාන,<br>වෙහෙරයාය.<br>055-2274665<br><br>පාසිකුඩා නිලධාරී නිවාසය<br>පාසිකුඩා ආදර්ශ පොල් උයන,<br>කල්කුඩා.<br>065-2050224<br><br>කතරගම සහ නිලාවේලි හි නිලධාරී නිවාසයන් විවෘත කිරීමට ආසන්නයේ පවතී. |
| පොල් සංස්කෘතික උද්‍යානයක් | පොල් සංස්කෘතික උද්‍යානය<br>පාසිකුඩා ආදර්ශ පොල් උයන,<br>කල්කුඩා.<br>065-2050224 |
| “කප්තුරුපාය” වෙළඳ, ව්‍යාප්ති හා සේවා මධ්‍යස්ථාන | මහයාය ආදර්ශ පොල් උයන<br>මාකඳුර,<br>ගෝනවිල.<br>031-2299781<br><br>පොල් වගාකිරීමේ මණ්ඩලය,<br>කප්රුක පියස,<br>ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>බත්තරමුල්ල.<br>011-5639833 |

# 2013 වසරේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ සුවිශේෂී කාර්යයන්

| | |
|---|---|
| දැයට කිරුළෙන් පළමු තැනට | 2013 අම්පාරේ දී පවත්වන ලද දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේදී රාජ්‍ය හා පෞද්ගලික අංශ ප්‍රදර්ශන කුටි 1000කට ආසන්න සංඛ්‍යාවක් අතුරින් පළමු ස්ථානය පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයට ලබා ගැනීමට පොල් වගාකිරීමේ මණ්ඩලයේ අම්පාර ප්‍රාදේශීය කළමනාකරු ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය දරන ලද උත්සාහය අතිමහත්ය. |
| රුපියල් මිලියන 50ක ශුද්ධ ලාභයක් රාජ්‍ය මුදල් ප්‍රවාහයට | මනා කළමනාකාරීත්වය තවදුරටත් ඉහළ දමමින් පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන් 12ක් මඟින් මෙම වර්ෂය තුළ රුපියල් මිලියන 50ක පමණ ශුද්ධ ලාභයක් ලබා එය රාජ්‍ය මුදල් ප්‍රවාහයට එක් කරන ලදී. |
| පොල් පැළ මිලියන 7 ක නිෂ්පාදනයක් මෙම වර්ෂයේදීත් | පසුගිය වසරේ පැවති දැඩි නියං තත්ත්වය යටතේ පොල් බීජ ලබා ගැනීමේ අපහසුතාවය මැද්දේත් පොල් පැළ මිලියන 8ක් රට පුරා සිටුවීමට පොල් වගාකිරීමේ මණ්ඩලයට හැකිවිය. |
| වැලිගම රෝගය මර්ධනයේ ජයග්‍රහණය | 2008 වසරේ සිට ක්‍රමානුකූලව වැලිගම රෝගී ගස් ඉවත් කිරීමේ වැඩසටහනට ජයග්‍රාහීව සනිටුහනක් කරමින් ලකුණු කළ සියලු රෝගී ගස් 245,512ක් මෙම වසරේදී ඉවත් කිරීමට පොල් වගාකිරීමේ මණ්ඩලයට හැකිවිය. |
| කප්රුක සමිති 5,000ක් ඉක්මවයි | රට පුරා සිටින පොල් වගාකරුවන් ඒකරාශී කිරීමේ කප්රුක පුරවර සංකල්පය අනුව, 2013 වන විට පිහිටුවා ඇති කප්රුක පුරවර සංඛ්‍යාව 5,185කි. |

| | |
|---|---|
| රතු කුරුමිණි මර්ධන වැඩසටහන තවදුරටත් | රතු කුරුමිණි මර්ධනය සඳහා විශාල ප්‍රදේශයකට එකවර රතු කුරුමිණි පෙරමෝන බෙදා හැරීමේ වැඩසටහන පාදක කරගත් රතු කුරුමිණි මර්ධන ව්‍යාපාරය කුරුණෑගල, ඇඹිලිපිටිය, මොණරාගල යන ප්‍රදේශවල පවත්වන ලදී. |
| කාබනික පොහොර ප්‍රවර්ධනයට අලුත් පියවරක් | අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් 2013 අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයට ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන යටතේ පොල් වගාකරුවන්ට හා කාබනික පොහොර නිෂ්පාදකයින්ට කාබනික පොහොර ප්‍රවර්ධන සහනාධාර ක්‍රමයක් ආරම්භ කරන ලදී. |
| පුරප්පාඩු පිරවීමේ කැපීපෙනෙන වර්ධනයක් | 2013 වසරේදී බඳවාගැනීම් හා උසස්වීම් ලබාදීමේ කැපීපෙනෙන වර්ධනයක් සනිටුවහන් කරමින් නව තනතුරු 97ක් සඳහා නිලධාරීන් බඳවාගෙන ඇති අතර උසස්වීම් 34ක් ලබාදී ඇත. |
| පුහුණු කටයුතු තවදුරටත් පුළුල් වේ | ලුණුවිල,මැදමුලන හා පාසිකුඩා පුහුණු මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලැබූ අභ්‍යන්තර සහ බාහිර පුහුණු වැඩසටහන් තවදුරටත් පුළුල් කරමින් වැඩසටහන් 326ක් පවත්වා වගාකරුවන් සහ නිලධාරීන් 18,418ක් පුහුණු කොට ඇත. |
| උතුරු නැගෙනහිර තවත් ඉඩම් පොල් වගාකිරීමේ මණ්ඩලයට | ලාභදායක මට්ටමින් පවත්වාගෙන යනු ලබන පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ බීජ උයන් කළමනාකරණය ඇගයීමකට ලක් කරමින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල බීජ පොල් තවාන් සහ ආදර්ශ බීජ උයන් පවත්වාගෙන යෑම සඳහා හෙක්ටයාර් 1023.55කින් යුක්ත ඉඩම් 12ක් රජය මඟින් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබාදෙන ලදී. |
| පාසිකුඩා ආදර්ශ පොල් උයන පොල් සංස්කෘතික මධ්‍යස්ථානයක් බවට පත්වෙයි | නැගෙනහිර පළාතේ සුන්දර පාසිකුඩා වෙරළ තීරයෙහි පිහිටි පාසිකුඩා ආදර්ශ පොල් උයන, සංචාරක ආකර්ශනයක් සහිතව පොල් ඉඩමක හා පොල් කර්මාන්තයේ කළ හැකි සියලු දේ එක්තැන් කරමින් පොල් ආශ්‍රිත සංස්කෘතික මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ වැඩකටයුතු බොහෝ දුරට නිමා කරන්නට හැකිවිය. |

# පොල් වගාකිරීමේ මණ්ඩලයේ කාර්ය මණ්ඩල ව්‍යුහය



# පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය



# අධ්‍යක්ෂ මණ්ඩලය 2013

2013 වසරේදී මෙම මණ්ඩලයේ සභාපති වශයෙන් සරත් කීර්තිරත්න මහතා කටයුතු කළ අතර පහත නම් සඳහන් අය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වශයෙන් කටයුතු කරන ලදී.

| | | |
|---|---|---|
| සරත් කීර්තිරත්න මහතා | - | සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය |
| ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා | - | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිත |
| මුදිතා අන්ද්‍රාහන්නදි මිය | - | මුදල් අමාත්‍යාංශයේ නියෝජිත |
| එච්.ඒ.විමලසූරිය මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| මොන්ටේගු සරත්චන්ද්‍ර මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| මහාචාර්ය එච්. පී. එම්. ගුණසේන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| රමල් අශෝක් සූරගේ මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| පූජ්‍ය ලංකාතිලක අරියධම්ම ස්වාමීන් වහන්සේ | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| කේ.ඩී.ජී. ප්‍රේමරත්න මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| යූ. මහින්ද සිල්වා මහතා | | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

2013 අප්‍රේල් මාසය වන තෙක් පමණක් ඉහත අධ්‍යක්ෂ මණ්ඩලය පොල් වගාකිරීමේ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස රාජකාරී කටයුතු කළ අතර, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අවුරුදු 03ක පත්වීම් කාලය අවසන් වීමෙන් පසු පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මගින් නව අධ්‍යක්ෂ මණ්ඩලයක් 2013 ඔක්තෝබර් මස පත් කරන ලදී.

# 2013 ඔක්තෝබර් මස පත්වීම් ලැබූ නව අධ්‍යක්ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| සරත් කීර්තිරත්න මහතා | - | සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය |
| ඩී.එම්.එල්. බණ්ඩාරනායක මහතා | - | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජිත |
| ඒ.එච්.එස්. ෆරීදා මෙය | - | මුදල් අමාත්‍යාංශයේ නියෝජිත (2013 ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා) |
| ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | - | මුදල් අමාත්‍යාංශයේ නියෝජිත (2013 නොවැම්බර් මස සිට) |
| මංජුල නාරායන මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| නිස්සංක ද මෙල් මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| කීර්ති බණ්ඩාර කොටගම මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| එච්.ඩබ්. ජගත් හේමන්ත මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ඩී.ජේ.බී ද සිල්වා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ඩබ්.එම්.සී.එස්. වලිසිංහ මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |





# සභාපතිතුමාගේ පණිවිඩය

*පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ “කප්රුක නවෝදාව” සංයුක්ත සැලැස්ම හරහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ සංවර්ධන සැලැස්මට අවතීර්ණ වූ අප ආයතනය 2013 වසර තුළ ඉටු කරගත් ජයග්‍රහණයන් බොහෝය.*

පසුගිය වසර කිහිපය හා සංසන්දනය කරන විට ඉහළම ක්ෂේත්‍ර සංවර්ධන ප්‍රගතියක් මෙම වර්ෂය තුළදී ඉටුකරගෙන ඇත. වසර 2016 වන විට ශ්‍රී ලංකාව පුරා පොල් පැළ ලක්ෂ 320ක් සිටුවීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා මෙම වසරේ නිෂ්පාදනය කළ පොල් පැළ ප්‍රමාණය මිලියන 7කට ආසන්නය.

දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේදී පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් සුවිශේෂීතම කාර්ය භාරයක් ඉටු කළ පොල් වගාකිරීමේ මණ්ඩලය මෙම වසරේ අම්පාරේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකාවේ ආයතන 1000කට අධික සංඛ්‍යාවක් අභිභවා හොඳම ප්‍රදර්ශන ඒකකයට හිමි සම්මානය ලබා ගැනීමට දායකවීමට හැකිවීම අපගේ සුවිශේෂීතම ජයග්‍රහණයකි.

ශ්‍රී ලංකාවේ පොල් වගාවට අභියෝගයක් වූ වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගයෙහි තීරණාත්මක ඉසව්වක් පසු කරමින් පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශය පරිදි රටෙහි පොල් වගාව බේරා ගැනීම සඳහා රෝගී ගස් 245,000කට අධික සංඛ්‍යාවක් ඉවත් කිරීමට පොල් වගාකිරීමේ මණ්ඩලයට හැකිවිය.

පොල් වගාකරුවන් ඒකරාශී කිරීමේ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ වැඩපිළිවෙල යටතේ පිහිටුවනු ලැබූ කප්රුක පුරවර සමිති සංඛ්‍යාව දිවයින පුරා 5000ක සීමාවක් ඉක්මවා පිහිටුවීමට අපගේ කාර්ය මණ්ඩලය මෙම වසරේදී සමත්විය.

අතිගරු ජනාධිපතිතුමා විසින් 2013 අයවැයෙන් යෝජනා කළ පරිදි පොල් වගා ක්ෂේත්‍රයේ කප්රුක පොහොර ප්‍රවර්ධනය කිරීම සඳහා වන වැඩසටහනට සාර්ථක ආරම්භයක් ලබා දෙමින් වසරේ අවසාන කාර්තුවේදී රුපියල් මිලියන 09ක මුදලක් පොල් වගාකරුවන්ට ලබාදීමට පොල් වගාකිරීමේ මණ්ඩලයට හැකිවිය.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ලාභදායී වතු කළමනාකරණ ප්‍රතිපත්තිය ඇගයීමට ලක්කරමින් උතුරු නැගෙනහිර ප්‍රදේශවල අක්කර 3000කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් පොල් වගාකිරීමේ මණ්ඩලයට වෙන් කරන ලද්දේ මෙම වර්ෂය තුළදීය.

“පොල් ඉඩමක කළ නොහැක්කක් නොමැත” යන පාඨය සනාථ කරමින් පාසිකුඩා පොල් උයන සංචාරක ආකර්ශනීය පොල් සංස්කෘතික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමේ විශාල වැඩ කොටසක් මෙම වසර තුළ ඉටු කරන ලදී.

දිගු කාලයක් පිරවීමට නොහැකි වූ සේවක පුරප්පාඩු බොහෝ ප්‍රමාණයක් මෙම වසර තුළදී පිරවීමට හැකි වූ අතර, මණ්ඩලයේ යටිතල පහසුකම් දියුණු කිරීමට හැකිවිය.

සමස්ථයක් ලෙස ගැනීමේදී 2013 වර්ෂයේ දී සියලු සංවර්ධන වැඩසටහන්වල ඉතා හොඳ ප්‍රගතියක් දක්නට ලැබූ අතර, ඒ සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු ඇමතිතුමා, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ උපදේශකත්වය හා මගපෙන්වීමත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ සියලු නිලධාරීන් දැක්වූ ක්‍රියාකාරී සහයෝගයත් එම ජයග්‍රහණයන් සඳහා පාදක වූ බව සතුටින් ප්‍රකාශ කරමි.

සරත් කීර්තිරත්න,
සභාපති,
පොල් වගාකිරීමේ මණ්ඩලය.





# 01. පොල් සංවර්ධන වැඩසටහන - 2013

පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත භාණ්ඩාගාරයෙන් වෙන් කෙරෙන ප්‍රතිපාදන අනුව හා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම මත වාර්ෂික පොල් සංවර්ධන වැඩසටහන් සැලසුම් කරන ලද අතර 2013 වර්ෂයේදී පහත සඳහන් පොල් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- පොල් පැළ නිෂ්පාදන වැඩසටහන
- කප්රුකයි සිප්ණැනයි සහනාධාර වැඩසටහන
- අක්කර 5 ට අඩු පොල් වගා සහනාධාර වැඩසටහන
- දිවිනැගුම ගෙවතු වගා සහනාධාර වැඩසටහන
- පූජා භූමිවල පොල් වගාකිරීමේ සහනාධාර වැඩසටහන
- පොල් ඉඩම් පුනරුත්ථාපන හා නියං සහනාධාර වැඩසටහන
- කප්රුක පුරවර වැඩසටහන
- කප්රුක ණය ආයෝජන වැඩසටහන

- කාබනික පොහොර ප්‍රවර්ධනය සඳහා පොල් ඉඩම්වල ගවගාල් ඉදිකිරීමේ සහනාධාර වැඩසටහන
- පොල් වගාව සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා කාබනික පොහොර යෙදීම ප්‍රචලිත කිරීම සහ දිරිගැන්වීමේ සහනාධාර වැඩසටහන
- පොල් ඉඩම්වල නල මගින් ජලය සැපයුම් පද්ධති ඉදිකිරීමේ සහනාධාර වැඩසටහන
- පොල් වගාවේ අතුරු බෝග වගාව පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන
- නාගරික ගෙවතු වගා සංවර්ධන වැඩසටහන
- කප්රුකයි පරපුරයි පොල් වගාකිරීමේ වැඩසටහන
- තැඹිලි වගා ප්‍රවර්ධන වැඩසටහන
- අකාබනික පොහොර සහනාධාර ප්‍රවර්ධන වැඩසටහන



## 1.1 පොල් පැළ නිෂ්පාදන වැඩසටහන

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය විසින් එළිදක්වන ලද "කප්රුක නවෝදාව" ජාතික පොල් සංවර්ධන සැලැස්ම පරිදි 2013 වර්ෂයේ ඉලක්ක සපුරා ගැනීමෙහිලා පොල් වගාකිරීමේ මණ්ඩලයේ කාර්ය භාරයන් අතර පොල් ඉඩම්වල නව වගාව, නැවත වගාව, යටි වගාව සහ පාළු සිටුවීම හා රටේ අනෙකුත් අවශ්‍යතා සඳහා උසස් ගුණාත්මයෙන් යුතු පොල් පැල ප්‍රමාණාත්මකව වගාකරුවන් වෙත ලබාදීමට ප්‍රධාන සංවර්ධන වැඩසටහනකි. මෙම කටයුතු සම්පාදනය, මෙහෙයවීම සහ සම්බන්ධීකරණය ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය මගින් සිදුකෙරේ.



සංවර්ධන වැඩසටහන් සඳහා බෙදා දීමට සූදානම් කර ඇති පොල් පැළ සමූහයක්

මීට අමතරව පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ප්‍රජා තවාන් ඔස්සේ පැල නිෂ්පාදනයත්, පොල් පර්යේෂණ ආයතනය, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, හලාවත වැවිලි සමාගම හා කුරුණෑගල වැවිලි සමාගම යන ආයතන මගින් පැල නිෂ්පාදිත ලබා ගැනීමටත්, උසස් ශාක වලින් බීජ පොල් ලබා ගැනීමත් සම්බන්ධීකරණය කරනු ලබයි.

### 1.1.1 2013 වර්ෂයේ ඉලක්ක

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ "කප්රුක නවෝදාව" ජාතික පොල් සංවර්ධන සැලැස්ම පරිදි 2016 වසර වනවිට පොල් පැළ ලක්ෂ 320 ක් සිටුවීමේ ඉලක්කය යටතේ 2013 වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලය මෙහෙයවීම යටතේ ඉලක්කගත පොල් පැල නිෂ්පාදනය මිලියන 8 ක් වූ අතර, එම ඉලක්කය සපුරාගැනීම සඳහා බීජ පොල් මිලියන 11.4 ක් ලබා ගැනීමට ඇස්තමේන්තුගත කෙරිණි.

### 1.1.2 ඉලක්ක සපුරා ගැනීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය සතුවූ ශක්තිය

අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට පොල් වගාකිරීමේ මණ්ඩලය සතු ප්‍රධාන සම්පත් වන්නේ ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය විසින් පාලනය කෙරෙන ප්‍රාදේශීය තවාන් සහ මීගමුව බීජ පොල් ඒකකයයි. ඊට අමතරව ආදර්ශ පොල් උයන් සතු තවාන් සහ "කප්රුක පුරවර" වැඩසටහන යටතේ පිහිටුවා ඇති ප්‍රජා පොල් පැල තවාන් ද සැලකිය යුතු දායකත්වයන් ලබාදේ.

### 1.1.3 පොල් වගාකිරීමේ මණ්ඩලය සතු පොල් පැල තවාන්

ප්‍රාදේශීය පොල් තවාන්වල කටයුතු ඒ ඒ ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල මගින් මෙහෙයවනු ලබන අතර ආදර්ශ පොල් උයන් සතු තවාන්වල කටයුතු ආදර්ශ පොල් උයන් මගින් සිදු කරනු ලබයි.

සංවර්ධන ඉලක්ක හා සමගාමීව වාර්ෂික පැල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ඒ ඒ තවාන්වල පවතින ධාරිතාවය, මානව සම්පත් හා යටිතල පහසුකම් අනුව මෙම තවාන් සඳහා බීජ පොල් බෙදාහැරීම සිදුවන අතර, පැල අවශ්‍යතාවයන් ප්‍රාදේශීය කාර්යාලවල ඉල්ලුම අනුව සැපයීම හා ප්‍රවාහනය මීගමුව බීජ පොල් ඒකකයේ ක්‍රියාකාරීත්වය යටතේ සිදු කරනු ලබයි.

පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් පාලනය කරනු ලබන පොල් පැල තවාන් පහත පරිදි වේ.

වගුව 1.1.1 - ප්‍රාදේශීය පොල් පැල තවාන් - 38

| පාලනය වන ප්‍රාදේශීය කාර්යාලය | දිස්ත්‍රික්කය | තවාන | ලිපිනය |
|---|---|---|---|
| *ගම්පහ* | *ගම්පහ* | *වල්පිට* | වල්පිට |
| | | *කිරිදිවැල* | කිරිදිවැල |
| *කෑගල්ල* | *කෑගල්ල* | *එරමිණිගොල්ල* | එරමිණිගොල්ල, හිරිවඩුන්න |
| | | *මත්තමගොඩ* | මත්තමගොඩ,කන්නන්තොට |
| *කළුතර* | *කළුතර* | *කොරොස්දූව* | කොරොස්දූව, වාද්දූව |
| කුරුණෑගල | කුරුණෑගල | *ඉබ්බාගමුව* | ඉබ්බාගමුව, තෝරයාය |
| | | *දොඩන්ගස්ලන්ද* | බලවත්තලවත්ත,දොඩන්ගස්ලන්ද |
| | | *වාරියපොල* | වාරියපොල |
| | | *නිකවැරටිය* | නිකවැරටිය |
| | | *වෙන්නෝරුව* | මුතුගලවත්ත, වෙන්නෝරුව |
| | | *පොල්ගහවෙල* | සෙරපීස්වත්ත, පනලිය, පොල්ගහවෙල |
| *කුලියාපිටිය* | | *දියදොර* | පහල දියදොර, දියදොර |
| | | *බිංගිරිය* | ප්‍රසන්නගම, බිංගිරිය |
| | | *හෙට්ටිපොල* | හෙට්ටිපොල |
| | | *කන්දෙටිය* | කන්දෙටිය, මාකඳුර, ගෝනවිල (ව.ප.) |
| | | *මහයාය* | මාකඳුර, ගෝනවිල, (ව.ප.) |
| *මාරවිල* | *පුත්තලම* | *කිරිමැටියාන* | කිරිමැටියාන, ලුණුවිල |
| | | *විල්පොත* | විල්පොත, බත්තුළුඔය |
| | | *අට්ටවිල්ලුව* | අට්ටවිල්ලුව, කුරුණෑගල පාර, පුත්තලම |



වගුව 1.1.2 - ප්‍රාදේශීය පොල් පැළ තවාන් - 38

| පාලනය වන ප්‍රාදේශීය කාර්යාලය | දිස්ත්‍රික්කය | තවාන | ලිපිනය |
|---|---|---|---|
| හම්බන්තොට | හම්බන්තොට | මැදමුලන | මැදමුලන, වීරකැටිය |
| | | මයුරපුර | |
| මාතර | මාතර | වැලිගම | පාතේගම, වැලිගම |
| ගාල්ල | ගාල්ල | බද්දේගම | පෙඩස්රුවත්ත, හල්පාතොට, බද්දේගම |
| | | ලබුදූව | ලබුදූව, අක්මීමන, ගාල්ල |
| මොණරාගල | මොණරාගල | හඳපානාගල | හඳපානාගල, වෙහෙරයාය |
| | | වැලිපිටිය | වැලිපිටිය වත්ත, නන්නපුරාව, බිබිල |
| රත්නපුර | රත්නපුර | ඇඹිලිපිටිය | තුංකම, ඇඹිලිපිටිය |
| මාතලේ | මාතලේ | පල්ලෙකැලේ | පල්ලෙකැලේ, බලගොල්ල, කෙන්ගල්ල |
| අම්පාර | අම්පාර | උහන | පාලම්කඳවුර, උහන |
| පොළොන්නරුව | පොළොන්නරුව | උල්හිටිය | උල්හිටිය, ගිරාඳුරුකෝට්ටේ |
| | | පරාක්‍රම සමුද්‍රය | රිවඩ්අළුවිහාරේ උද්‍යානය, පරාක්‍රම සමුද්‍රය |
| අනුරාධපුරය | අනුරාධපුරය | කලාවැව | කලාවැව, විජිතපුර |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | කුඹුරුපිඩ්ඩි | ප්‍රධාන පාර, කුඹුරුපිඩ්ඩි, ත්‍රිකුණාමලය |
| මඩකලපුව | මඩකලපුව | මයිලම්බවේලි | මයිලම්බවේලි, තන්නමුනායි, මඩකලපුව |
| යාපනය | යාපනය | අච්චුවේලි | වාසවිලාන් පාර, අච්චුවේලි, යාපනය |
| | කිලිනොච්චිය | කිලිනොච්චි | ඩී3, පන්නන්කන්ඩි, කිළිනොච්චි |
| | මුලතිව් | අලම්පිල් | අලම්පිල්, මුලතිව් |
| | | වල්ලිපුනම් | වල්ලිපුනම්, පුදුකුඩුඉරිප්පු |

වගුව **1.1.3 -** ආදර්ශ පොල් උයන්වල ස්ථාපිත තවාන් **- 12**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය කාර්යාලය | පොල් පැළ තවාන | ලිපිනය |
|---|---|---|---|
| කුරුණෑගල | කුරුණෑගල | *ඬේසිවැලි* | *ඬේසිවැලි* ආදර්ශ පොල් උයන, ඉළුක්කේවෙල – වැඋඩ |
| | | ලේනව | ලේනව ආදර්ශ පොල් උයන, හිරියාල – ලේනව |
| | | *රන්දෙනිය* | *රන්දෙනිය* ආදර්ශ පොල් උයන, වාරියපොල |
| | කුලියාපිටිය | *ගර්ට්ලන්ඩ්* | *ගර්ට්ලන්ඩ්* ආදර්ශ පොල් උයන, නාඕිරිත්තන්කඩවර, වැලිපැන්නගහමුල්ල |
| | | බෝපිටිය | බෝපිටිය ආදර්ශ පොල් උයන, කු/බෝපිටිය |
| | | මහයාය | මහයාය ආදර්ශ පොල් උයන, මාකඳුර, ගෝනවිල(ව/ප) |
| අම්පාර | අම්පාර | *කොහොඹාන* | *කොහොඹාන* ආදර්ශ පොල් උයන, කොහොඹාන, ගොනාගොල්ල |
| | | *කොරෙයි* | *කොරෙයි* ආදර්ශ පොල් උයන, තිරුක්කෝවිල් |
| පුත්තලම | මාරවිල | *මුන්දලම* | *මුන්දලම* ආදර්ශ පොල් උයන, මුන්දලම |
| | | නාගන්සෝල | නාගන්සෝල ආදර්ශ පොල් උයන, වන්නි/රස්නායකපුර. |
| යාපනය | යාපනය | පලෙයි | පලෙයි ආදර්ශ පොල් උයන, පලෙයි |
| මඩකලපුව | මඩකලපුව | *පාසිකුඩා* | *පාසිකුඩා* ආදර්ශ පොල් උයන, පාසිකුඩා, කල්කුඩා |



### 1.1.4 මීගමුව බීජ පොල් ඒකකය

ප්‍රමාණවත්ව පැල නිෂ්පාදනයට අවශ්‍ය බීජ පොල් ලබාගෙන නියමිත පැල තවාන් වෙත ප්‍රවාහනය කර සැපයීමත්, වාර්ෂික බීජ පොල් අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීමට දායකත්වය ලබාදී එම සැලසුම් ක්‍රියාත්මක කිරීමත් මෙම ඒකකය සතු ප්‍රධාන කාර්යයකි. එසේම මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෙරෙන පොල් වගාකරුවන්ට අවශ්‍ය යෙදවුම් සැපයීමේ සේවාවන් සඳහා පහසුකම් සැපයීම හා මෙහෙයවීමත් මෙම ඒකකය සතු අනෙකුත් කාර්යයන් අතර වේ. මෙම කාර්යයේදී බීජ පොල් ලබාගැනීමේ කටයුතු සිදු කරනු ලබන්නේ ද බීජ නිෂ්පාදන ඒකකය විසින් වන අතර ඒ සඳහා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයක් ද අනුයුක්තව සිටී.

## 1.1.5. 2013 වර්ෂයේ ප්‍රගතිය.

### 1.1.5.1 මණ්ඩලයේ පැල තවාන් මගින් පැළ නිෂ්පාදනය

වාර්ෂික පැළ අවශ්‍යතාවය පැළ මිලියන 8 ක් වූ අතර, මේ සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන් 38 විසින් 58.66 % ක දායකත්වය ලබාදුන් අතර ඒ ඒ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය වශයෙන් ඇති මණ්ඩලයේ පැළ තවාන් වලින් 2013 වර්ෂයේ තවාන් කළ බීජ පොල්වලින් නිෂ්පාදිත පැළ ප්‍රමාණය 1.1.4 වගුවෙන් දක්වා ඇත.



**වගුව 1.1.4 - පැල තවාන් මගින් 2013 වර්ෂයේ තවාන් කළ බීජ පොල් වලින් නිෂ්පාදිත පැළ ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | තවාන | තවාන් කළ බීජ පොල් ප්‍රමාණය | | නිකුත් කළ පැල ප්‍රමාණය | |
|---|---|---|---|---|---|
| | | බිම් පැල සඳහා | පොලි බෑග් සඳහා | බිම් පැල | පොලි බෑග් |
| ගම්පහ | වල්පිට | 118,368 | 33,850 | 77,964 | 23,140 |
| | කිරිදිවැල | 120,958 | 20,161 | 72,456 | 13,246 |
| කෑගල්ල | එරමිණිගොල්ල | 91,070 | 15,340 | 56,832 | 9,199 |
| | මත්තමගොඩ | 85,910 | 20,500 | 56,582 | 4,944 |
| කළුතර | කොරොස්සුව | 109,500 | 50,185 | 76,326 | 35,861 |
| කුරුණෑගල | ඉබ්බාගමුව | 221,002 | 65,872 | 162,286 | 45,484 |
| | දොඩන්ගස්ලන්ද | 70,268 | 44,110 | 50,743 | 22,721 |
| | වාරියපොල | 90,259 | 24,665 | 64,581 | 11,271 |
| | නිකවැරටිය | 67,993 | 52,395 | 52,220 | 30,062 |
| | වෙන්නෝරුව | 70,651 | 26,360 | 51,885 | 16,586 |
| | පොල්ගහවෙල | 78,224 | 32,335 | 55,594 | 19,176 |
| | දියදොර | 102,539 | 17,872 | 54,686 | 10,884 |
| | බිංගිරිය | 146,076 | 57,461 | 94,591 | 26,625 |
| | හෙට්ටිපොල | 80,085 | 32,918 | 54,016 | 12,665 |
| | කන්දෙටිය | 122,937 | 63,714 | 64,742 | 35,214 |
| | මහයාය | 77,584 | 37,422 | 42,466 | 21,853 |
| පුත්තලම | කිරිමැටියාන | 130,903 | 40,695 | 91,558 | 25,377 |
| | විල්පොත | 93,415 | 52,440 | 67,786 | 38,261 |
| | අට්ටවිල්ලුව | 67,613 | 34,300 | 43,984 | 25,808 |
| හම්බන්තොට | මැදමුලන | 158,150 | 35,295 | 95,052 | 20,702 |
| මාතර | වැලිගම | - | 17,277 | - | 10,062 |
| ගාල්ල | බද්දේගම | 120,360 | 27,750 | 89,499 | 20,128 |
| | ලබුදූව | - | 14,355 | - | 10,213 |
| මොණරාගල | හඳපානාගල | 111,411 | 17,300 | 69,698 | 7,368 |
| | වැලිපිටිය | 53,140 | 17,250 | 31,640 | 7,010 |
| රත්නපුර | ඇඹිලිපිටිය | 163,492 | 29,000 | 119,883 | 21,646 |
| මාතලේ | පල්ලෙකැලේ | 73,655 | 35,750 | 54,676 | 24,697 |
| අම්පාර | උහන | 126,055 | 23,600 | 92,169 | 6,639 |
| පොලොන්නරුව | උල්හිටිය | 105,052 | 24,215 | 56,232 | 3,783 |
| | පරාක්‍රම සමුද්‍රය | 90,995 | 30,003 | 63,959 | 13,705 |
| අනුරාධපුර | කලාවැව | 108,315 | 40,362 | 75,025 | 24,667 |
| ත්‍රිකුණාමලය | කුඹුරුපිඩ්ඩි | 64,089 | 27,085 | 37,013 | 17,399 |
| මඩකලපුව | මයිලම්බවෙලි | 92,865 | 26,200 | 68,049 | 19,212 |
| යාපනය | කිලිනොච්චි | 96,765 | 11,200 | 119,458 | 11,570 |
| | අලම්පිල් | 111,230 | 11,000 | 48,428 | 3,217 |
| | අච්චුවේලි | 91,003 | 16,300 | 60,765 | 11,493 |
| | වල්ලිපුනම් | 31,900 | 5,700 | 1,430 | - |
| එකතුව | | **3,543,832** | **1,132,237** | **2,374,274** | **956,500** |

## 1.1.5.2 ආදර්ශ පොල් උයන්වල තවාන් මඟින් පැළ නිෂ්පාදනය

වාර්ෂික පැළ නිෂ්පාදන ඉලක්ක අත් කරගැනීම සඳහා සියළු ආදර්ශ පොල් උයන්වල ද පැළ තවාන් ඇති කරන ලදී. මේ තුළින් ආදර්ශ පොල් උයන්වල තෝරාගත් ශාකවලින් ලබාගත් පොල් සඳහා ඉහල මිලක්ද, ආදර්ශ පොල් උයන් සඳහා අමතර ආදායමක්ද ලැබිණි. මණ්ඩලයේ මුළු පැළ නිෂ්පාදනයෙන් 15.65% ක් (බිම් පැළ 634,371 ක් සහ බඳුන් පැළ 251,805) ආදර්ශ පොල් උයන් මඟින් සිදුකරන ලදී. ඒ ඒ ආදර්ශ පොල් උයන් මඟින් නිෂ්පාදිත පැළ ප්‍රමාණය පහත පරිදි වේ.

වගුව 1.1.5 ආදර්ශ පොල් උයන් තවාන් වල පැළ නිෂ්පාදනය - 2013

| ආදාර්ශ පොල් උයන | තවාන් කළ බීජ පොල් ප්‍රමාණය | | පැළ නිෂ්පාදනය | |
|---|---|---|---|---|
| | බිම් පැළ සඳහා | බඳුන් පැළ සඳහා | බිම් පැළ | බඳුන් පැළ |
| බෝපිටිය | 127,121 | 84,265 | 88,985 | 58,986 |
| ඩේසිවැලි | 0 | 29,458 | 0 | 20,621 |
| ගර්ට්ලන්ඩ් | 165,677 | 100,844 | 115,974 | 70,591 |
| කොහොඹාන | 64,906 | 47,795 | 45,434 | 33,457 |
| කොරෙයි | 38,550 | 25,500 | 26,985 | 17,850 |
| ලේනව | 96,394 | 0 | 67,476 | 0 |
| මහයාය | 169,803 | 22,480 | 118,862 | 15,736 |
| මුන්දලම | 9,988 | 6,827 | 6,992 | 4,779 |
| නාගන්සෝල | 74,093 | 0 | 51,865 | 0 |
| රන්දෙණිය | 4,832 | 0 | 3,382 | 0 |
| පලෙයි | 41,200 | 0 | 28,840 | 0 |
| පාසිකුඩා | 113,680 | 42,550 | 79,576 | 29,785 |
| එකතුව | 906,244 | 359,719 | 634,371 | 251,805 |



## 1.1.5.3 ප්‍රජා තවාන් මඟින් පැළ නිෂ්පාදනය

ප්‍රාදේශීයව පවතින උසස් ලක්ෂණ සහිත ශාක මඟින් ලබා ගන්නා බීජ පොල් එම ප්‍රදේශයේ පැළ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා යොදාගැනීමත්, කප්රුක සමිති සාමාජික තවාන්කරුවන්ට අමතර ආදායමක් ලබා ගැනීමට අවස්ථාවක් සැලසීමත්, ප්‍රදේශයේ ඉහළ කළමණාකරණය සහිත සාර්ථක පොල් වගාකරුවන්ට බීජ පොල් සැපයීමෙන් තම අස්වැන්න සඳහා ඉහල මිලක් ලබාදීමත් ප්‍රජා පොල් පැල තවාන් සංකල්පයේ අරමුණයි.

මෙම තවාන් අධීක්ෂණය ප්‍රාදේශීය කාර්යාල මඟින් සිදුකරන අතර ලබාදෙන සෑම පැලයකටම නඩත්තු කර සැපයීම වෙනුවෙන් පැලයකට රුපියල් 20ක මුදලක් තවාන්කරුවන් වෙත ලබාදී ඇත.

ප්‍රජා තවාන් 291 මඟින් යල මහ කන්න වල ලබා ගත් මුළු පොල් පැල ප්‍රමාණය 1,454,131 ක් වන අතර එය මණ්ඩලයේ මුලු පැළ නිෂ්පාදනයේන් 25.69% කි. ඒ වෙනුවෙන් රු. 29,082,620.00 ක මුදලක් තවාන්කරුවන්ට ගෙවා ඇත.

මේ සඳහා බිජ පොල් 2,920,732 ක් ප්‍රදේශයේ ඉඩම් හිමියන්ගෙන් ලබා ගෙන ඒ සඳහා රුපියල් 116,829,280.00 ක මුදලක් ඉඩම් හිමියන්ට ලබා දී ඔවුන්ගේ ආර්ථික තත්ත්වය

වගුව 1.1.6 - ප්‍රජා තවාන් මඟින් පැළ නිෂ්පාදනය - 2013

| ප්‍රාදේශීය කාර්යාලය | දිස්ත්‍රික්කය | තවාන් ගණන | තවාන් කර ඇති බීජ පොල් ප්‍රමාණය | නිකුත් කළ පැළ ප්‍රමාණය |
|---|---|---|---|---|
| කළුතර | කොළඹ | 10 | 77,200 | 64,281 |
| | කළුතර | 9 | 47,330 | |
| මාතලේ | මාතලේ | 17 | 108,501 | 56,184 |
| | මහනුවර | 4 | 17,400 | |
| අනුරාධපුරය | අනුරාධපුරය | 17 | 58,911 | 13,948 |
| | මන්නාරම | 2 | 8,000 | |
| ගම්පහ | ගම්පහ | 30 | 584,008 | 317,379 |
| කෑගල්ල | කෑගල්ල | 15 | 71,200 | 26,296 |
| කුරුණෑගල | කුරුණෑගල | 35 | 388,271 | 259,693 |
| කුලියාපිටිය | කුරුණෑගල | 44 | 460,332 | 175,283 |
| මාරවිල | පුත්තලම | 30 | 514,217 | 339,776 |
| මඩකලපුව | මඩකලපුව | 5 | 24,216 | 7,390 |
| රත්නපුරය | රත්නපුරය | 9 | 82,527 | 32,666 |
| හම්බන්තොට | හම්බන්තොට | 18 | 187,050 | 72,780 |
| මොණරාගල | මොනරාගල | 18 | 83,792 | 23,523 |
| මාතර | මාතර | 6 | 35,250 | 13,797 |
| ගාල්ල | ගාල්ල | 7 | 74,910 | 31,867 |
| අම්පාර | අම්පාර | 2 | 4,100 | 2,958 |
| පොලොන්නරුව | පොලොන්නරුව | 7 | 35,467 | 8,890 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | 1 | 5,000 | 3,400 |
| යාපනය | යාපනය | 5 | 26,350 | 4,020 |
| | වව්නියාව | 2 | 10,850 | |
| | කිලිනොච්චි | 3 | 15,850 | |
| එකතුව | | **291** | **2,920,732** | **1,454,131** |

පොල් වගාකිරීමේ මණ්ඩලයේ මෙහෙයවීම යටතේ 2013 වර්ෂයේ නිෂ්පාදනය කර ඇති සමස්ථ පැළ ප්‍රමාණය 5,661,081 ක් වන අතර, එය රටේ සමස්ථ පැළ නිෂ්පාදනයෙන් 97.21% කි.

එම පැළවලින් 58.66%ක් පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන් මගින් ද 15.65%ක් පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන්වලින් ද ඉතිරි 25.69% පොල් වගාකිරීමේ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ප්‍රජා තවාන් මගින් ද නිෂ්පාදනය කරන ලදී. පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ථ පැළ නිෂ්පාදනය වගුව 2.4හි දක්වා ඇත.

**වගුව 1.1.7 - පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ථ පොල් පැල නිෂ්පාදනය - 2013**

| | මණ්ඩලයේ පොල් පැළ තවාන් මඟින් | ආදර්ශ පොල් උයන් මඟින් | ප්‍රජා තවාන් මඟින් | එකතුව |
|---|---|---|---|---|
| ප්‍රමාණය | 3,320,774 | 886,176 | 1,454,131 | 5,661,081 |
| ප්‍රතිශතය | 58.66% | 15.65% | 25.69% | |

**රූපසටහන 1.1.8 - පොල් වගාකිරීමේ මණ්ඩලයේ මෙහෙයවීම යටතේ නිෂ්පාදනය කර ඇති පැළ ප්‍රතිශතයක් ලෙස**




## 1.1.6 රජයට අනුබද්ධ ආයතන මගින් 2013 වර්ෂයේ නිෂ්පාදිත සමස්ථ පොල් පැළ ප්‍රමාණය.

2013 වර්ෂයේදී පොල් වගාකිරීමේ මණ්ඩලයට අමතරව පහත සඳහන් රාජ්‍ය ආයතන ද පොල් පැළ නිෂ්පාදනය සිදුකරන ලදී. ඒ අනුව සියලුම රාජ්‍ය ආයතන මගින් 2013 වර්ෂයේදී නිෂ්පාදිත සමස්ථ පොල් පැළ ප්‍රමාණය 5,823,965ක් වූ අතර එහිදී සමස්ථ පොල් පැළ නිෂ්පාදන ඉලක්කයෙන් 72.8 % ක ප්‍රගතියක් ලඟා කර ගැනීමට හැකිවිය.

**වගුව 1.1.9 - ආයතන අනුව සමස්ථ පොල් පැල නිෂ්පාදනය - 2013**

| ආයතනය | | බිම් පැළ | බඳුන් පැල | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| පොල් වගා කිරීමේ මණ්ඩලය | තවාන් | 2,374,274.00 | 946,500.00 | 3,320,774.00 | 57.02% |
| | ආ.පො.උ. | 634,371.00 | 251,805.00 | 886,176.00 | 15.22% |
| ප්‍රජා පොල් පැල තවාන් | | 1,454,131.00 | - | 1,454,131.00 | 24.97% |
| පොල් පර්යේෂණ ආයතනය | | | 77, 159 | 77,159 | 1.32% |
| හලාවත වැවිලි සමාගම | | 17,872 | 20,740 | 38,612 | 0.66% |
| කුරුණෑගල වැවිලි සමාගම | | | 21,052 | 21,052 | 0.36% |
| ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | | 5,171 | 20,890 | 26,061 | 0.45% |
| එකතුව | | 4,485,819 | 1,260,987 | 5,823,965 | |
| ප්‍රතිශතය | | 77.02% | 21.65% | | |

## 1.1.7 පොල් පැළ නිකුත් කිරීම.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ මෙහෙයවීම යටතේ නිෂ්පාදනය කර ඇති පොල් පැළ ප්‍රමාණය ප්‍රාදේශීය කාර්යාල මඟින් විවිධ සංවර්ධන වැඩසටහන් ඔස්සේ වගාකරුවන් වෙත නිකුත් කරන ලද අතර,එසේ නිකුත් කල සමස්ථ පොල් පැල ප්‍රමාණය 6,817,155 කි. (මින් පැළ 1,156,074 ක් 2012 වර්ෂයේ තවාන් කල පැළ වේ). අනෙකුත් ආයතන නිකුත් කල පැල ප්‍රමාණය 162,884 කි. ඒ අනුව සමස්ථ පොල් පැල නිකුත් කිරීම පැල 6,980,039 කි. එනම් ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රතිශතය 87.25% කි.



## වගුව 1.1.10 - 2013 වර්ෂයේ පොල් සංවර්ධන වැඩසටහන් සඳහා නිකුත් කල පැල ප්‍රමාණය

<table>
<tr><th rowspan="2">දිස්ත්‍රික්කය</th><th>අක්කර 5 ට අඩු පොල් වගා සහනාධාරය</th><th>කප්රුක ආයෝජන වැඩසටහන</th><th>පුරා ශ්‍රී වැඩසටහන</th><th>දිවිනැගුම වැඩසටහන</th><th>පුනරුත්ථාපන හා [illegible] සහනාධාර වැඩසටහන</th><th>නාගරික පොල් වගා වැඩසටහන</th><th>කප්රුක පුරවර පොල් පැළ නිකුත් කිරීම</th><th>මිලට පොල් පැළ නිකුත් කිරීම</th></tr>
<tr><th>පැළ</th><th>පැළ</th><th>පැළ</th><th>පැළ</th><th>පැළ</th><th>පැළ</th><th>පැළ</th><th>පැළ</th></tr>
<tr><td>මොණරාගල</td><td>60,054</td><td>14,361</td><td>305</td><td>54,970</td><td>7,456</td><td>-</td><td>349,826</td><td>8,187</td></tr>
<tr><td>බදුල්ල</td><td>14,351</td><td>10,754</td><td>150</td><td>82,412</td><td>753</td><td>-</td><td>58,409</td><td></td></tr>
<tr><td>මාතර</td><td>5,570</td><td>7,050</td><td>-</td><td>-</td><td>42,166</td><td>-</td><td>10,771</td><td></td></tr>
<tr><td>කුරුණෑගල</td><td>434,349</td><td>41,915</td><td>523</td><td>650,175</td><td>121,400</td><td>-</td><td>509,589</td><td>98,635</td></tr>
<tr><td>කෑගල්ල</td><td>29,429</td><td>16,920</td><td>375</td><td>87,991</td><td>3,451</td><td>-</td><td>58,097</td><td>7,167</td></tr>
<tr><td>ගම්පහ</td><td>100,527</td><td>26,409</td><td>240</td><td>62,958</td><td>11,963</td><td>-</td><td>255,504</td><td>11,646</td></tr>
<tr><td>කොළඹ</td><td>14,689</td><td>12,270</td><td>-</td><td>3,581</td><td>2,568</td><td>-</td><td>24,853</td><td rowspan="2">5,121</td></tr>
<tr><td>කළුතර</td><td>23,075</td><td>18,242</td><td>30</td><td>42,349</td><td>7,144</td><td>1,000</td><td>19,632</td></tr>
<tr><td>පුත්තලම</td><td>153,212</td><td>19,834</td><td>1,700</td><td>252,279</td><td>48,545</td><td>-</td><td>333,160</td><td>63,720</td></tr>
<tr><td>රත්නපුර</td><td>41,800</td><td>21,420</td><td>220</td><td>48,652</td><td>11,349</td><td>-</td><td>97,002</td><td>12,124</td></tr>
<tr><td>හම්බන්තොට</td><td>77,265</td><td>15,110</td><td>240</td><td>98,486</td><td>10,028</td><td>-</td><td>61,237</td><td>9,812</td></tr>
<tr><td>අනුරාධපුර</td><td>50,161</td><td>21,010</td><td>208</td><td>49,914</td><td>3,986</td><td>-</td><td>22,517</td><td>15,231</td></tr>
<tr><td>ත්‍රිකුණාමලය</td><td>34,554</td><td>14,248</td><td>210</td><td>58,655</td><td>4,588</td><td>-</td><td>5,500</td><td>979</td></tr>
<tr><td>පොළොන්නරුව</td><td>24,938</td><td>10,308</td><td>255</td><td>12,408</td><td>4,451</td><td>-</td><td>55,639</td><td>10,529</td></tr>
<tr><td>අම්පාර</td><td>74,174</td><td>18,008</td><td>200</td><td>207,452</td><td>2,720</td><td>-</td><td>34,550</td><td>3,249</td></tr>
<tr><td>මාතලේ</td><td>38,492</td><td>6,711</td><td>472</td><td>54,356</td><td>5,096</td><td>-</td><td>39,153</td><td rowspan="3">8,509</td></tr>
<tr><td>මහනුවර</td><td>23,095</td><td>14,375</td><td>284</td><td>32,613</td><td>3,058</td><td>-</td><td>23,492</td></tr>
<tr><td>නුවරඑළිය</td><td>15,397</td><td>5,174</td><td>188</td><td>21,742</td><td>2,038</td><td>-</td><td>15,661</td></tr>
<tr><td>ගාල්ල</td><td>25,893</td><td>20,626</td><td>-</td><td>84,173</td><td>4,707</td><td>-</td><td>32,135</td><td>6,294</td></tr>
<tr><td>මඩකලපුව</td><td>81,536</td><td>17,474</td><td>1,387</td><td>47,435</td><td>6,519</td><td>-</td><td>39,495</td><td>6.300</td></tr>
<tr><td>යාපනය</td><td>28,767</td><td>11,721</td><td>350</td><td>43,012</td><td>1,971</td><td>-</td><td>37,016</td><td rowspan="5">82,638</td></tr>
<tr><td>කිලිනොච්චි</td><td>32,016</td><td>3,054</td><td>200</td><td>58,192</td><td>-</td><td>-</td><td>10,000</td></tr>
<tr><td>මන්නාරම</td><td>18,860</td><td>4,150</td><td>68</td><td>25,010</td><td>359</td><td>-</td><td>6,523</td></tr>
<tr><td>මුලතිව්</td><td>82,313</td><td>598</td><td>-</td><td>28,739</td><td>-</td><td>-</td><td>2,850</td></tr>
<tr><td>වව්නියාව</td><td>28,686</td><td>6,002</td><td>-</td><td>54,540</td><td>1,056</td><td>-</td><td>13,958</td></tr>
<tr><td></td><td>1,513,203</td><td>357,744</td><td>7,605</td><td>2,162,094</td><td>307,372</td><td>1,000</td><td>2,116,569</td><td>350,141</td></tr>
</table>

## 1.1.8 මීගමුව බීජ පොල් ඒකකයේ මෙහෙයුම් ප්‍රගතිය

මීගමුව බීජ පොල් ඒකකය විසින් 2013 වර්ෂයේදී බීජ පොල් 6,259,000 ප්‍රවාහනය සිදු කර ඇති අතර එයින් බීජ 4,252,586 ක් 2013/මහ කන්නය සඳහා වන අතර බීජ 2,006,414 ක් 2014/යල කන්නය සඳහා වේ. මෙම බීජ පොල් වලින් ප්‍රජා තවාන් සඳහා බීජ පොල්153,600 ක් ප්‍රවාහනය සිදු කර ඇත.

වගුව 1.1.11 - මීගමුව බීජ පොල් ඒකකයේ මෙහෙයුම් ප්‍රගතිය

| | ආදායම්/ වියදම් කටයුතු | ආදායම්/ වියදම් (රු.) |
|---|---|---|
| | **ආදායම්** | |
| 1 | තවාන් හා ආදර්ශ පොල් උයන් වලට බීජ පොල් ප්‍රවාහනය | 17,567,442.00 |
| 2 | විවිධ වැඩසටහන් සඳහා පොල් පැළ ප්‍රවාහනය | 4,292,337.00 |
| 3 | වෙනත් ප්‍රවාහන කටයුතු | 6,482,574.00 |
| | **ප්‍රවාහන කටයුතු මුළු ආදායම්** | **28,342,353.00** |
| | **වියදම්** | |
| 1 | ඉන්ධන සඳහා | 17822,723.66, |
| 2 | වාහන වල ටයර් සඳහා | 1319,504.10, |
| 3 | වාහන වල ටියුබ් සඳහා | 167405.00, |
| 4 | වාහන වල සේවා කටයුතු සඳහා | 963747.20, |
| 5 | වාහන අලුත්වැඩියා කටයුතු | 1249,475.53, |
| 6 | ලොරි රථ සඳහා බැටරි යෙදීම | 57424.00, |
| | **මුළු වියදම්** | **21,580,279.49** |
| | **වර්ෂයේ ලාභය** | **6762,073.51,** |



රූපසටහන 1.1.12 - මීගමුව බීජ පොල් ඒකකයේ මෙහෙයුම් ආදායම් ප්‍රතිශතය




## 1.1.9 තවාන් සංවර්ධන කටයුතු

පැල අවශ්‍යතාවය වැඩිවනවාත් සමඟම නිපදවන පැළ ධාරිතාව වැඩිකිරීම සඳහාත්, පවතින ධාරිතාව පවත්වාගෙන යමින් තවාන් වල ආදායම් ඉහල නැංවීමත් අරමුණු කරගෙන සෑම තවානකම යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සහ අනෙකුත් ඉදිකිරීම සිදු කරනු ලබයි. ඉලක්කගත සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ සීමාකාරී සාධකයක් ලෙස ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම බලපෑ හෙයින් අත්‍යාවශ්‍ය කෘෂිකාර්මික සංවර්ධන කටයුතු (උදා-තවාන් ජල සම්පාදනය සහ භෝග ආරක්ෂණ කටයුතු) සඳහා වැඩි ප්‍රමුඛතාවය දී කටයුතු කරන ලද අතර ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු ඉතා සීමා සහිතව සිදුකරන ලදී.

## 1.1.10 ඉදිරි සැලසුම් සහ අපේක්ෂිත ඉලක්ක

විශේෂයෙන්ම ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය ස්වයංමූල්‍ය අංශයක් ලෙස තම කටයුතු පවත්වා ගෙන යන අතර, මෙහිදී තවාන්වල ආදායම් තත්වය වර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග කෙරේ වැඩි අවධානයක් යොමුව ඇත. තවාන් වල යටිතල පහසුකම් සංවර්ධනයද, ඒ අරමුණු ඔස්සේ සිදු කෙරෙන අතර මෙහිදී පළතුරු හා අතුරු බෝග පැළ නිෂ්පාදනය පුළුල් කිරීමට කටයුතු ආරම්භ කර ඉදිරි වර්ෂයේදී පැල නිෂ්පාදනය හා නිකුත් කිරීමට අපේක්ෂිතය.

තවාන්වල සත්ව පාලනය හා වෙනත් විකල්ප ආදායම් වර්ධනය කෙර්ද අවධානය යොමු කර කටයුතු කර ගෙන යමින් පවතී.

එසේම උතුරු නැගෙනහිර ප්‍රදේශවල අළුතින් පොල් පැල තවාන් ඇති කිරීමත් ඒ තුලින් එම ප්‍රදේශවල සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය පැළ ප්‍රමාණය සැපයීමත් ඉලක්ක කොට කටයුතු කරගෙන යමින් පවතී.

## 1.2. කප්රුකයි - සිප්ණැනයි සහනාධාර වැඩසටහන



2013 වසරේදී මෙම වැඩසටහන යටතේ දිවයිනේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි ගෙවත්තේ පොල් පැළ 1 -2 දක්වා වගාකිරීමට ප්‍රමාණවත් භූමියක් සහිත 6 වසරේ ඉගෙනුම ලබන සිසුන් වෙත නොමිලේ පොලි බෑග් පොල් පැළ ලබාදෙන ලදී.

මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වනුයේ පාසැල් සිසුන්ට පොල් වගාව පිළිබඳ උනන්දුවක් ඇති කිරීමත්, පාසල් දරුවන් රටේ ආර්ථික සංවර්ධන හා ජාතික නිෂ්පාදනයේ පාර්ශවකරුවන් බවට පත්කිරීම, ගෙවත්තෙහි පොල් පැළයක් සිටුවීම හා එය මනාව රැකබලා ගැනීම තුලින් දරුවන් ඇතුලුව දෙමව්පියන් තුලද පොල් වගාව පිළිබඳව උනන්දුවක් ඇතිකිරීමත්, ගෘහස්ථ මාළු පොල් අවශ්‍යතාව ගෙවත්තෙන්ම සපුරා ගැනීමත්ය.

6 වසරේ ඉගෙනුම ලබන සිසුවෙකු පොල් පැළ ලබා ගැනීමෙන් වසර 5 කට පසු උසස් පෙළ අධ්‍යාපන වරම් ලැබීමේ කඩඉමට පැමිණීමත් සමගම පොල් පැළය ද ඵලදරණ මට්ටමට පැමිණේ. මෙම වැඩසටහන යටතේ වසර 5 කට පසු ඉතාම සාර්ථකව පොල් පැළ නඩත්තු කල සිසු - සිසුවියන් සඳහා දිස්ත්‍රික්ක මට්ටමේ තේරීමකට ලක් කර උසස් පෙළ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව පිරිනැමේ.

පොල් වගාව සඳහා පාසල් සිසුන්ගේ දායකත්වය ඇතිව පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන ආසියානු පැසිපික් පොල් ප්‍රජා ජාත්‍යන්තර සමුළු වාරයේදී ද විශේෂ ඇගයීමකට ලක් වී ඇත.

2013 වර්ෂය තුල ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදෙන ලද සමස්ථ ඉලක්කය පොල් පැළ 350,000 ක් විය. මෙම වැඩසටහන යටතේ පාසැල් 4133 ක් හා සිසුන් 182,189 වෙත පොල් පැළ 357,744 නොමිලේ නිකුත් කර ඇත. ඉලක්කයට සාපේක්ෂව සමස්ථ ප්‍රගතිය 102.2% කි. කප්රුකයි සිප්ණැනයි වැඩසටහන සඳහා මූල්‍ය ඇස්තමේන්තුව රුපියල් මිලියන 75.075 ක් වූ අතර 2013 වර්ෂයේදී රුපියල් මිලියන 62.80 ක මූල්‍ය වියදමක් මෙම වැඩසටහන සඳහා දරා ඇත.

**වගුව 1.2.1- මෙම වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහත සඳහන් වගුවෙන් දක්වා ඇත.**

| ප්‍රාදේශීය කාර්යාලය | ඉලක්කය (පැළ) | ප්‍රගතිය (පැළ) |
|---|---:|---:|
| මොණරාගල | 25,000 | 25,115 |
| මාතර | 6,000 | 7,050 |
| කුරුණෑගල | 26,000 | 29,070 |
| කුලියාපිටිය | 13,000 | 12,845 |
| කෑගල්ල | 17,000 | 16,920 |
| ගම්පහ | 25,000 | 26,409 |
| කළුතර | 30,000 | 30,512 |
| මාරවිල | 16,000 | 19,834 |
| රත්නපුර | 21,000 | 21,420 |
| හම්බන්තොට | 13,500 | 15,110 |
| අනුරාධපුර | 25,000 | 25,160 |
| ත්‍රිකුණාමලය | 20,000 | 14,846 |
| පොළොන්නරුව | 12,000 | 10,308 |
| අම්පාර | 18,000 | 18,008 |
| මාතලේ | 25,000 | 26,260 |
| ගාල්ල | 22,000 | 20,626 |
| මඩකලපුව | 15,000 | 17,474 |
| යාපනය | 20,500 | 20,777 |
| එකතුව | **350,000** | **357,744** |




## 1.3. අක්කර 05 ට අඩු පොල් වගා සහනාධාර වැඩසටහන

### (නව වගා/ නැවත වගා/ යටි වගා)





නැවත වගාවක්



නව වගාවක්

යටි වගාවක්

අක්කර ¼ සිට අක්කර 5දක්වා පොල් වගාකිරීම සඳහා මෙම සහනාධාරය යටතේ වගාකරුවන්ට අවශ්‍ය පොල් පැළ නොමිලේ ලබාදේ .එසේම මෙම පැළ වගාකරු වෙත ප්‍රවාහනය කර දෙනු ලබන අතර පැළ නිකුත් කිරීමට පෙර පැළ සිටුවීම හා නඩත්තුව පිළිබඳ උපදෙස් ලබාදී සියළු වගාකරුවන් විද්‍යාත්මක පොල් වගාව පිළිබඳව දැනුවත් කරනු ලැබේ. 2013 වර්ෂයේදී මෙම වැඩසටහනේ ඉලක්කය අක්කර 17,500 ක් වූ අතර වැඩසටහන යටතේ අක්කර 23,644 ක් සඳහා පොල් පැළ මිලියන 1.51ක් නොමිලේ නිකුත් කර ඇත. ඉලක්කයට සාපේක්ෂව 135.06%ක ප්‍රගතියක් ලබා ඇත. මෙම වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 121.18 ක් වේ.

**වගුව 1.3.1- මෙම වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහතින් දක්වා ඇත.**

| ප්‍රාදේශීය කාර්යාලය | ඉලක්කය (පැළ) | ප්‍රගතිය (පැළ) |
|---|---|---|
| මොණරාගල | 67,200 | 74,405 |
| මාතර | 3,840 | 5,570 |
| කුරුණෑගල | 144,640 | 253,876 |
| කුලියාපිටිය | 128,000 | 180,473 |
| කෑගල්ල | 20,480 | 29,429 |
| ගම්පහ | 86,400 | 100,527 |
| කළුතර | 35,200 | 37,764 |
| මාරවිල | 115,200 | 153,212 |
| රත්නපුර | 32,000 | 41,800 |
| හම්බන්තොට | 61,440 | 77,265 |
| අනුරාධපුර | 46,080 | 69,021 |
| ත්‍රිකුණාමලය | 96,000 | 116,247 |
| පොළොන්නරුව | 17,600 | 24,938 |
| අම්පාර | 52,480 | 74,174 |
| මාතලේ | 40,960 | 76,984 |
| ගාල්ල | 20,480 | 25,893 |
| මඩකලපුව | 70,400 | 81,536 |
| යාපනය | 81,600 | 90,089 |
| එකතුව | **1,120,000** | **1,513,203** |




## 1.4.දිවිනැගුම ගෙවතු වගා සහනාධාර වැඩසටහන



ශ්‍රී ලංකාවේ ගෘහ ආර්ථික ඒකක දස ලක්ෂයක් නගා සිටුවා එම ගෘහ ඒකක ස්වයංපෝෂිත කරමින් රට සංවර්ධනය කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් දියත් කරන ලද පැළ වගාකිරීමේ වැඩසටහනට පොල් වගාකිරීමේ මණ්ඩලය අනෙකුත් රාජ්‍ය ආයතන අතුරින් ඉහළම දායකත්වය ලබා දෙන ලදී. 2013 වසර තුළදී බෙදා දෙන ලද පොල් පැළ ප්‍රමාණය 2,162,094 කි. එය දිවි නැගුම යටතේ පොල් පැළ නිකුත්කිරීමේ ඉලක්කය වූ පැළ මිලියන 2.5 ට සාපේක්ෂව 86.5 % ට ආසන්න ප්‍රගතියකි.

දිවිනැගුම වැඩසටහන යටතේ ලබාදෙන ලද පොල් පැළ සඳහා මුදල්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කරනු ලබන අතර ඉලක්කගත මුදල රුපියල් මිලියන 225.00 කි. මෙම වැඩසටහන යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දක්වා පොල් පැළ ප්‍රවාහනය කිරීම සහ පොල් පැළ විද්‍යානුකූලව සිටුවීම හා රැක බලාගැනීම සම්බන්ධව පැළලාභී වගාකරුවන් දැනුවත් කිරීම සිදුකර ඇත. මෙම සමස්ත වැඩසටහන සඳහා 2013 වර්ෂයේදී රුපියල් මිලියන 255.00 ක මුදලක් ඇස්තමේන්තු කරන ලද අතර මෙම වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 225.465 කි.

දිවිනැගුම වැඩසටහනෙහි වැඩිම ප්‍රගතිය කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය මගින් පෙන්වූ අතර මුළු ප්‍රගතියට සාපේක්ෂව එහි ප්‍රගතිය 26.59 % කි. පිළිවෙලින් පුත්තලම, අම්පාර, යාපනය ප්‍රාදේශීය කාර්යාලය මගින් දෙවන , තුන්වන හා සිව්වන ලෙස ප්‍රගතිය වාර්තා කර ඇත.



වගුව **1.4.1-** මෙම වැඩසටහනේ ප්‍රාදේශිය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහත සඳහන් වගුවෙන් දක්වා ඇත

| ප්‍රාදේශිය කාර්යාලය | ඉලක්කය (පැළ) | ප්‍රගතිය (පැළ) |
|---|---|---|
| මොණරාගල | 160,000 | 137,382 |
| කුරුණෑගල | 610,000 | 574,808 |
| කුලියාපිටිය | 90,000 | 75,367 |
| කෑගල්ල | 80,000 | 87,991 |
| ගම්පහ | 50,000 | 62,958 |
| කළුතර | 59,000 | 45,930 |
| මාරවිල | 400,000 | 252,279 |
| රත්නපුර | 45,000 | 48,652 |
| හම්බන්තොට | 100,000 | 98,486 |
| අනුරාධපුර | 150,000 | 74,924 |
| ත්‍රිකුණාමලය | 115,000 | 87,394 |
| පොළොන්නරුව | 11,000 | 12,408 |
| අම්පාර | 225,000 | 207,452 |
| මාතලේ | 105,000 | 108,711 |
| ගාල්ල | 80,000 | 84,173 |
| මඩකලපුව | 50,000 | 47,435 |
| යාපනය | 170,000 | 155,744 |
| එකතුව | **2,500,000** | **2,162,094** |




## 1.5. පූජා භූමිවල පොල් වගාකිරීමේ සහනාධාර වැඩසටහන



2013 වර්ෂයේ දී පන්සල් ඇතුලුව අනිකුත් සිද්ධස්ථාන (දේවස්ථාන, කෝවිල්, මුස්ලිම් දේවස්ථාන) වල පොල්පැළ වගාකිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. 2011, 2012 වර්ෂවලදී ශ්‍රී ලංකාවේ බොහෝ සිද්ධස්ථාන මෙම වැඩසටහනෙන් ආවරණය කළ අතර පූජා භූමි වැඩසටහන යටතේ පොල් පැල 4000 ඉලක්කයක් පමණක් 2013 වසරේදි ලබා දෙන ලදී.

එම ඉලක්කය ඉක්මවමින් පොල් පැල 7605 වසර තුලදී නිකුත් කර ඇත. ඒ අනුව මෙම වැඩසටහන 190.1%ක ප්‍රගතියක් ලබාගෙන ඇත. මේ සඳහා රුපියල් මිලියන 0.374 ක මූල්‍ය ඇස්තමේන්තුවක් ලබාදෙන ලද අතර මූල්‍ය වියදම රුපියල් මිලියන 0.647 වේ.

වගුව **1.5.1-** මෙම වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහතින් දක්වා ඇත.

| ප්‍රාදේශීය කාර්යාලය | ඉලක්කය (පැළ) | ප්‍රගතිය (පැළ) |
|---|---|---|
| මොණරාගල | 400 | 455 |
| මාතර | 120 | 0 |
| කුරුණෑගල | 120 | 323 |
| කුලියාපිටිය | 120 | 200 |
| කෑගල්ල | 160 | 375 |
| ගම්පහ | 160 | 240 |
| කළුතර | 320 | 30 |
| මාරවිල | 160 | 1700 |
| රත්නපුර | 160 | 220 |
| හම්බන්තොට | 200 | 240 |
| අනුරාධපුර | 240 | 276 |
| ත්‍රිකුණාමලය | 320 | 210 |
| පොළොන්නරුව | 160 | 255 |
| අම්පාර | 160 | 200 |
| මාතලේ | 160 | 944 |
| ගාල්ල | 160 | 0 |
| මඩකලපුව | 160 | 1387 |
| යාපනය | 720 | 550 |
| එකතුව | **4000** | **7605** |






**මාතර හා ගාල්ල දිස්ත්‍රික්කවල වැලිගම කොළ මැළවීමේ හා කුණුවීමේ රෝගයේ තර්ජන පැවති බැවින් මෙම වැඩසටහන ක්‍රියාත්මක නොවීය.

## 1.6. පොල් ඉඩම් පුනරුත්ථාපන හා නියං සහනාධාර වැඩසටහන

2012 වර්ෂයේදී ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව පොල් වගාවේ පාළු සිටුවීම සඳහා නොමිලේ පැළ ලබා දෙන ලදී. එසේම 2012 වර්ෂයේදී තිබූ දැඩි නියගය හේතුවෙන් විනාශ වූ පොල් වගාව නැවත ස්ථාපනය සඳහා නොමිලේ පොල් පැළ නිකුත් කරන ලදී. 2013 වසරේ පොල් ඉඩම් පුනරුත්ථාපන යටතේ පාළු සිටුවීම සඳහා ඉලක්කගත පැළ ප්‍රමාණය 300,000 විය. වර්ෂය තුළදී මෙම වැඩසටහන යටතේ අත්කර ගත් ප්‍රගතිය පැළ 293,154 කි.

මේ සඳහා මූල්‍ය ඇස්තමේන්තුව රු.මි. 28.05 ක් වූ අතර වියදම රුපියල් මිලියන 23.28 ක් විය. එසේම නියං සහනාධාර වැඩසටහන යටතේ පැළ 100,000 ක් නිකුත් කිරීම සඳහා ඉලක්ක කර තිබූ අතර එහි මූල්‍ය ඉලක්කය රුපියල් මිලියන 9.35 ක් විය. මෙම නියං සහනාධාර වැඩ සටහන යටතේ පොල් පැළ 14,218 ක් නිකුත් කරණ ලදී. මෙම වැඩසටහන් දෙකෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 26.225 කි.





වගුව 1.6.1- මෙම වැඩසටහනේ ප්‍රාදේශිය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි කර ඇත.

| ප්‍රාදේශිය කාර්යාලය | ඉලක්කය (පැළ) | පුනරුත්ථාපන හා නියං සහනාධාර වැඩසටහන (පැළ) |
|---|---|---|
| මොණරාගල | 8,000 | 8,209 |
| මාතර | 8,000 | 42,166 |
| කුරුණෑගල | 50,000 | 43,192 |
| කුලියාපිටිය | 50,000 | 78,208 |
| කෑගල්ල | 12,000 | 3,451 |
| ගම්පහ | 50,000 | 11,963 |
| කළුතර | 18,000 | 9,712 |
| මාරවිල | 45,000 | 48,545 |
| රත්නපුර | 12,000 | 11,349 |
| හම්බන්තොට | 20,000 | 10,028 |
| අනුරාධපුර | 8,000 | 4,345 |
| ත්‍රිකුණාමලය | 8,000 | 4,588 |
| පොළොන්නරුව | 5,000 | 4,451 |
| අම්පාර | 5,000 | 2,720 |
| මාතලේ | 18,000 | 10,192 |
| ගාල්ල | 12,000 | 4,707 |
| මඩකලපුව | 25,000 | 6,519 |
| යාපනය | 46,000 | 3,027 |
| එකතුව | **400,000** | **307,372** |




## 1.7.කප්රුක පුරවර වැඩසටහන



2013 වර්ෂයේදී නව කප්රුක පුරවර තුළ ප්‍රාථමික සමිති 1759 ක් ස්ථාපනය කිරීමේ ඉලක්කයක් ලබාදුන් අතර ඉන් 2491 ස්ථාපනය කරන ලදී. කලාප සමිති 125 ක් ඉලක්ක ගත කළ නමුත් ඉලක්කය ඉක්මවා කලාප සමිති 127 ක් පිහිටුවීමට පොල් වගාකිරීමේ මණ්ඩලයට හැකි විය. කප්රුක පුරවර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වැය කල මුදල් ප්‍රමාණය රුපියල මිලියන 173.48 කි.

එමෙන්ම කප්රුක පුරවර ප්‍රජා පොල් පැළ තවාන් සංකල්පය යටතේ ප්‍රදේශයේ පොල් වගාකරුවන්ට එම ප්‍රදේශයෙන්ම උසස් තත්වයේ බීජ පොල් පැළ ලබා ගැනීම සඳහා මව් පොල් ගස් තෝරා ගත් අතර, එයින් ලබා ගත් බීජ පොල් ප්‍රමාණය 2,856,806 කි. මෙම ව්‍යාපෘතිය මගින් කප්රුක පුරවර වගාකරුවන් විශාල සංඛ්‍යාවකට තම බීජ පොල් විකිණීමෙන් රුපියල් 116,829,280.00 ක ආදායමක් ලබා ගැනීමට ද හැකි විය. එසේම ප්‍රජා තවාන් මගින් පැළ 1,433,467 නිෂ්පාදනය කරන ලදී. මෙමගින් කප්රුක සමිති සාමාජිකයින් වෙත ලැබුණු මුදල් ප්‍රමාණය රුපියල් 29,082,620.00 කි.




ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කප්රුක පුරවර සාමාජිකයෙකුට ඩිමෝ ලොරි රථයක් ලබා දෙමින්

කප්රුක පුරවර තුල පොල් වගා වැඩසටහන යටතේ 2013 වර්ෂය සඳහා ලබා දී ඇති ඉලක්කය පැළ මිලියන 1.25 ක් වූ අතර පැළ මිලියන 2.12 ක් වගාකරුවනට නිකුත් කරන ලදී.

තවද කප්රුක පුරවර තුල ක්ෂේත්‍ර ආදර්ශණ පිහිටුවීම ද සාර්ථකව සිදුකරන ලද අතර ඒ යටතේ පිහිටුවීමට ඉලක්ක කරගත් තිබූ ආදර්ශණ ගණන 49 ක් වූ අතර ක්ෂේත්‍ර ආදර්ශණ 62 ක් පිහිටුවීමට හැකිවිය. මීට අමතරව පොල් වගාකරුවන්ගේ ජීවන තත්වය උසස් කිරිම සඳහා පොල් ආශ්‍රිත ද්‍රව්‍ය (උදාහරණ:- පොල් කටු අඟුරු, පොල් ලෙලි ) එකතු කිරිමේ ස්ථාන ද ආරම්භ කෙරිණි.

## 1.8. කප්රුක ණය ආයෝජන වැඩසටහන



මෙම වැඩසටහනේ මූලික අරමුණ වනුයේ සහනාධාර ක්‍රමයෙන් පොල් වගාකරුවන් ක්‍රමානුකූලව ඉවත් කරමින් තම පොල් ඉඩම උපරිම ඵලදායීත්වයෙන් යුතුව සංවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම සහ මගපෙන්වීමයි. පොල් වගාකිරීමේ මණ්ඩලය පෞද්ගලික හා රාජ්‍ය බැංකු 13 ක්ද සමග ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. ණය ලබාගත් වගාකරුවන් එම ණය ඵලදායි ලෙස හා එකඟ වූ ව්‍යාපෘතිවලට අනුව යොදවන්නේ ද යන්න පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිළධාරින් විසින් නිරතුරුව පරික්ෂා කෙරේ.

මෙම වැඩසටහන යටතේ අඩු පොලී අනුපාතයක් යටතේ ණය නිකුත් කෙරෙන අතර වගාකරුවනට වාර්ෂිකව පොලී සහනයක් ද ලබාදේ. වගාකරුවන් බැංකුවට ගෙවූ පොලියෙන් පළමු වසරේ 100% ක් ද දෙවන වසරේ 50% ක්ද වන අයුරින් පොලියෙන් කොටසක් වගාකරුවනට නැවත ගෙවනු ලැබේ.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වාර්ෂික සඵල පොලී අනුපාතය ව්‍යාපෘතිය අනුව 3.5% - 4% ක ඉතා අඩු අගයක් ගනී. කප්රුක ණය ආයෝජන වැඩසටහන වැවිලි ක්ෂේත්‍රයේ මෙන්ම සමස්ත කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ද මෙම ආකාරයට ක්‍රියාත්මක වන එකම සහන ණය වැඩසටහනයි.

පොල් වගාව, අතුරු බෝග වගාව, සත්ව පාලන, වාරි ජල සැපයීම, යාන්ත්‍රික උපකරණ ලබා ගැනීම ආදී ව්‍යාපෘති 11 කට මෙම වැඩසටහන යටතේ ණය ප්‍රතිපාදන ලබා දීම සිදු කෙරේ. මෙම වැඩසටහන යටතේ 2013 වසර තුළදී පොල් වගාකරුවන් 526 ක් සඳහා අක්කර 2514.04 සංවර්ධනයට රුපියල් මිලියන 138.36 ක ණය බැංකු මගින් නිකුත් කර ඇත. එසේම වගාකරුවන් සඳහා රුපියල් මිලියන 5.73 ක පොලී සහන ගෙවා ඇත.



වගුව 1.8.1 - මෙම වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහතින් දක්වා ඇත.

| ප්‍රාදේශිය කාර්යාලය | ඉලක්කය (අක්කර) | ප්‍රගතිය (අක්කර) |
|---|---|---|
| මොණරාගල | 95 | 26.75 |
| මාතර | 60 | 67.5 |
| කුරුණෑගල | 410 | 362.5 |
| කුලියාපිටිය | 430 | 497.5 |
| කෑගල්ල | 95 | 20.75 |
| ගම්පහ | 350 | 253.29 |
| කළුතර | 145 | 88 |
| මාරවිල | 430 | 631.75 |
| රත්නපුර | 75 | 27.5 |
| හම්බන්තොට | 100 | 100 |
| අනුරාධපුර | 125 | 38 |
| ත්‍රිකුණාමලය | 95 | 73 |
| පොළොන්නරුව | 75 | 29.3 |
| අම්පාර | 110 | 75.5 |
| මාතලේ | 80 | 35 |
| ගාල්ල | 135 | 2 |
| මඩකලපුව | 100 | 70.25 |
| යාපනය | 90 | 115.45 |
| **එකතුව** | **3,000** | **2514.04** |



## 1.9. කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීම සඳහා පොල් ඉඩම්වල ගවගාල් ඉදිකිරීමේ සහනාධාර වැඩසටහන



පොල් වගාව සඳහා කාබනික පොහොර යෙදීම ප්‍රචලිත කිරීමත්පොල් ඉඩමේ පාංශු ගුණාංග දියුණුකර පොල් එලදාව වැඩි කිරීමත්,නිදැල්ලේ යන ගවයින්ගෙන් පොල් පැළවලට සහ පොල් ඉඩමේ පසට වන හානිය අඩු කිරීමටත්, රටේ කිරි නිෂ්පාදනය වැඩිකිරීමටත් දායකවීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

පොල් ඉඩම් තුල එළ ගවයන් හෝ මීගවයන් ක්‍රමානුකූලව පාලනය කිරීම සඳහා නිර්දේශිත පරිදි ගවගාලක් ඉදිකිරීමට මෙම සහනාධාරය යටතේ මුදල් අධාර ලබාදෙන ලදී. අක්කර ½ ට වැඩි පොල් ඉඩමක් තිබීම හා ගවයන් දෙදෙනෙකුවත් අයවත්ව තිබිම මූලික සුදුසුකම වූ අතර ගොම සහ මුත්‍ර එකතු කිරීමේ පහසුකම් සහිතව පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ලබාදෙනු ලබන සැලැස්මට අනුව ගවගාල සම්පූර්ණයෙන් ඉදිකිරීම සහ ගවගාලේ වූ ගොම පොල් වගාවට යෙදීම අනිවාර්ය වු අතර එම කටයුතු නිසි පරිදි ඉටුකල වගාකරුවන්ට පමණක් ගවගාලක් සඳහා රු. 35,000/- ක මූල්‍ය සහනාධාරයක් ලබාදෙන ලදී.

2013 වසරේදී ගවගාල් 250 ක් සෑදීමට ඉලක්ක කර තිබූ අතර ප්‍රගතිය ගවගාල් 253 කි. මෙම වැඩසටහනට රුපියල් මිලියන 8.75 ක මූල්‍ය ඉලක්කයක් ලබාදුන් අතර 2013 දී රුපියල් මිලියන 4.405 වියදමක් දරා ඇත.



වගුව 1.9.1- මෙම වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහතින් දැක්වේ.

| ප්‍රාදේශීය කාර්යාලය | ඉලක්කය (ගණන) | ප්‍රගතිය (ගණන) |
|---|---|---|
| මොණරාගල | 11 | 8 |
| මාතර | 11 | 8 |
| කුරුණෑගල | 21 | 35 |
| කුලියාපිටිය | 25 | 25 |
| කෑගල්ල | 6 | 6 |
| ගම්පහ | 22 | 19 |
| කළුතර | 21 | 21 |
| මාරවිල | 25 | 26 |
| රත්නපුර | 6 | 6 |
| හම්බන්තොට | 10 | 12 |
| අනුරාධපුර | 12 | 11 |
| ත්‍රිකුණාමලය | 5 | 7 |
| පොළොන්නරුව | 15 | 12 |
| අම්පාර | 15 | 20 |
| මාතලේ | 8 | 8 |
| ගාල්ල | 6 | 8 |
| මඩකලපුව | 10 | 13 |
| යාපනය | 21 | 8 |
| එකතුව | **250** | **253** |




පොල් වගාව තුල සත්ව පාලනය ප්‍රවර්ධනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 250 ක් පැවැත්වීම සඳහා 2013 වර්ෂයේදී ඉලක්ක කර තිබූ අතර ඒ යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් 592 ක් පවත්වා ඇත.

## 1.10. පොල් වගාව සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා කාබනික පොහොර යෙදීම ප්‍රචලිත කිරීම සහ දිරිගැන්වීමේ සහනාධාර වැඩසටහන

පොල් ගසක වර්ධනය හා නිෂ්පාදනය සඳහා ශාඛ පෝෂක සෘජු බලපෑමක් කරයි. මෙම පෝෂක ලබාදීම සඳහා රසායනික පොහොර මෙන්ම කාබනික පොහොර යෙදීමටත් වගාකරුවන් උනන්දු කල යුතු වේ.

පසේ ගුණාත්මකභාවය (භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක ලක්ෂණ ) වැඩි දියුණු කර ඉදිරියට පවත්වාගෙන යාමටත්, දේශීය වශයෙන් ස්වාභාවිකව ලබාගත හැකි ලාභදායි ද්‍රව්‍ය කාබනික පොහොර ලෙස භාවිත කිරීමටත්, කාබනික පොහොර තම වගාවට යෙදීම සඳහා පොල් වගාකරුවන් උනන්දු කරවීමටත්, රටතුල ප්‍රධාන වශයෙන් සාමාජීය ප්‍රශ්ණයක් වන ඉවතලන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කර කාබනික පොහොරක් ලෙස පොල් වගාවට යොමු කිරීමත්, රසායනික පොහොර වෙනුවෙන් වැය කරන විදේශ විනිමය අඩුකර ගැනීමත් මෙම දිරිගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු අතර ප්‍රධාන වේ.

එසේම කාබනික ද්‍රව්‍ය පමණක් භාවිතා කර සිදු කරනු ලබන පොල් සඳහා ජාත්‍යන්තර වශයෙන් විශේෂ ඉල්ලීමක් ඇති බැවින් ද මෙම කාබනික ද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කරනු ලබන පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වැඩි මිලක් ලෝක වෙළඳපොලේ පවතින බැවින් ද කාබනික පොල් වගාව සිදු කරනු ලබන පොල් වගාකරුවන් දිරිමත් කිරීමද වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ තවත් අරමුණක් වේ.

2013 වර්ෂයේදී කාබනික පොහොර ප්‍රවර්ධනය සඳහා වූ විශේෂ සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක වූ අතර ඒ යටතේ වැඩසටහන් 3 ක් ක්‍රියාත්මක විය.



**කප්රුක සමිති හෝ සමිති සාමාජිකයන් වෙත කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීමේ වැඩසටහන**

මෙම වැඩසටහන යටතේ කාබනික පොහොර මළු 10,000 ක් නිෂ්පාදනය කිරීමට ඉලක්ක කර තිබූ අතර කාබනික පොහොර මළු 2622 ක් නිෂ්පාදනය කරන ලදී. එයින් පොහොර මළු 279 ක් නිෂ්පාදනය සඳහා සහනාධාර මුදල් ගෙවා ඇත.

**කාබනික පොහොර සමඟ අකාබනික පොහොර අනුපූරකයක් ලෙස භාවිතා කරන පොල් වගාකරුවන් දිරිගැන්වීමේ වැඩසටහන**

මෙම වැඩසටහන යටතේ පොල් ගස් /පැළ 895,000 කට කාබනික පොහොර යෙදීමට ඉලක්ක කරන ලද අතර පොහොර යොදා ඇති පොල් ගස් /පැළ ගණන 762,056 ක් වන අතර පොල් ගස් /පැළ 102,603 ක් වෙත කාබනික පොහොර යෙදීම වෙනුවෙන් 2013 වර්ෂයේදී සහනාධාර මුදල් ගෙවා ඇත.

**කාබනික පොල් වගාව සඳහා ජාත්‍යන්තර සහතික පත්‍ර ලබා ඇති පොල් වගාකරුවන් දිරිගැන්වීම් වැඩසටහන**

මෙම වැඩසටහන යටතේ කාබනික පොල් වගාව යටතේ ඇති පොල් ගස් / පැළ 25,000 ක් සඳහා කාබනික පොහොර යෙදීමට 2013 වර්ෂයේදී ඉලක්ක කරන ලද අතර පොල් ගස් /පැළ 53136 ක් සඳහා කාබනික පොහොර යොදා ඇති අතර 5962 ක් සඳහා කාබනික පොහොර යෙදීම වෙනුවෙන් 2013 සහනාධාර මුදල් ගෙවා ඇත.

## 1.11. පොල් ඉඩම්වල නල මගින් ජලය සැපයුම් පද්ධති ඉදිකිරීමේ සහනාධාර වැඩසටහන

පොල් වගාවේ වර්ධනය හා අස්වැන්නට ඍජුවම ජලය බලපායි. පොල් පර්යේෂණ ආයතනයේ අඩු වියදම් ජල සම්පාදන ක්‍රමයක් ලෙස නිර්දේශිත නල මගින් ජලය සැපයීම ප්‍රවර්ධනය කිරීම සඳහා නල ජල සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. වියළි ප්‍රදේශ පවතින මාරවිල, කුරුණෑගල, කුලියාපිටිය, හම්බන්තොට, මොණරාගල, අම්පාර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, අනුරාධපුරය, යාපනය, මඩකලපුව හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශවල මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් නිර්දේශිත ආකාරයට ජල නල පද්ධති ඉදිකිරීම සඳහා අක්කරයකට රු. 8000/- ක් බැගින් වන පරිදි උපරිම වශයෙන් අක්කර 5 දක්වා වූ ඉඩම් ප්‍රමාණයකට නලජල පද්ධති ඉදිකිරීම සඳහා සහනාධාර මුදලක් මෙම වැඩසටහන මගින් ලබාදේ.



2013 වර්ෂයේදී පොල් ඉඩම්වල නල මගින් ජලය සැපයුම් පද්ධති ඉදිකිරීම සඳහා භෞතික ඉලක්කය සහ ඇස්තමේන්තු මුදල පිළිවෙලින් අක්කර 1000ක් සහ රුපියල් මිලියන 8.00 ක් වූ අතර අක්කර 995 ක භෞතික ප්‍රගතියක් සහ රුපියල් මිලියන 2.42 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

**වගුව 1.11.1 -මෙම වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහත වගුවෙන් නිරූපණය වේ.**

| ප්‍රාදේශීය කාර්යාලය | ඉලක්කය(අක්කර) | ප්‍රගතිය (අක්කර) |
|---|---|---|
| මොණරාගල | 11 | 17 |
| මාතර | 10 | 4 |
| කුරුණෑගල | 220 | 186 |
| කුලියාපිටිය | 125 | 41 |
| මාරවිල | 350 | 469 |
| රත්නපුර | 15 | 15 |
| හම්බන්තොට | 75 | 72 |
| අනුරාධපුර | 15 | 15 |
| ත්‍රිකුණාමලය | 30 | 17 |
| පොළොන්නරුව | 15 | 12.5 |
| අම්පාර | 30 | 18.25 |
| මාතලේ | 15 | 16 |
| මඩකලපුව | 70 | 105.04 |
| යාපනය | 19 | 7 |
| එකතුව | **1000** | **995** |



## 1.12. අතුරු භෝග වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන



2013 වර්ෂයේදී අතුරු භෝග වගා දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් 120 ක් ඉලක්ක කෙරුනු අතර ප්‍රාදේශීය කාර්යාල මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් 220 ක් පවත්වා ඇත. 2013 වර්ෂය සඳහා මෙම වැඩසටහන සඳහා ඇස්තමේන්තු කල රුපියල් මිලියන 0.66 ක් වූ අතර එහි ප්‍රගතිය රුපියල් මිලියන 0.049 කි.

## 1.13. නාගරික ගෙවතු වගා සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලාංකිකයින්ගේ පොල් පාරිභෝජන අවශ්‍යතාවය ගම්බද මෙන්ම නගරයේද නොවනස්ව පවතින්නකි. එහෙත් නගරයේ වැවිය හැකි පොල් ගස් ගණන අවම බැවින් නගරයට පොල් ගෙන එනුයේ නාගරික නොවන ප්‍රදේශවලිනි. මේ තත්වය යටතේ රටෙහි පොල් අස්වැන්න අඩුවන කාලවලදී නගරයේ පොල් මිල ඉහළ යැමෙන් ජනතාව අපහසුවට පත්වනවා මෙන්ම රට තුළ ව්‍යාකූලභාවයක් ද හටගනී.



කෝට්ටේ ප්‍රදේශයේදී ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් නාගරික ජනයාට පොල් පැළ බෙදාදීම

මෙම තත්වය වටහාගත් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය නාගරික ගෙවතු වගා පොල් සංවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලෙස පොල් වගාකිරීමේ මණ්ඩලයට උපදෙස් දෙන ලදී.

මෙහි බලාපොරොත්තුව වනුයේ පළමුව කොළඹ නගරය තුළ සහ පසුව අනෙකුත් නගර තුළ ද ව්‍යාප්ත වන පරිදි නගරයේ පොල් සිටුවිය හැකි සෑම ස්ථානයකම දෙමුහුන් වර්ගයේ කුඩා පොල් පැළ වගා කිරීමයි. ශ්‍රී ලාංකාවේ වාර්ෂික ඒක පුද්ගල පරිභෝජනය පොල් ගෙඩි 116ක් වන බැවින් සෑම නාගරික ගෙවත්තකම ඉහළ අස්වැන්නක් ඇති දෙමුහුන් පොල් පැළ දෙකක් වගා කිරීමෙන් නගරයේ පොල් පිළිබඳ ගැටළුව සාර්ථකව විසඳෙනු ඇත.

| නගරය | නාගරික ප්‍රදේශය | පොල් පැළ ගණන |
|---|---|---|
| **කොළඹ** | කෝට්ටේ | 1000 |



කැස්බෑව ප්‍රදේශයේදී ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් නාගරික ජනයාට පොල් පැළ බෙදා දීම

## 1.14. කප්රුකයි - පරපුරයි පොල් වගාකිරීමේ වැඩසටහන



ශ්‍රී ලංකාවේ වාර්ෂිකව උපත ලබන දරුවන් ඉලක්ක කරමින් "කප්රුකයි පරපුරයි " වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර මේ යටතේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කාර්යාලවල ලියාපදිංචි වන මව්වරුන් හට උපදින සෑම දරුවෙක් වෙනුවෙන්ම පොල් පැළ 2 බැගින් නොමිලේ ලබාදේ. දරුවන් සමගම පොල් පැළ වර්ධනය දැකීමෙන් මවගේ මානසික සුවයත් , අවට පරිසරය හා දරුවා අතර සහ සම්බන්ධය තුලින් ලැබෙන ධනාත්මක සංකල්පය මවගේ සිතුවිලි තුලින් පරිසරය පිළිබඳ යහ පුරුදු අනාගත පරපුර තුල ජනිත කරවීමේත්, පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීමේත් අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

දරුවන් සමග වැඩෙන පොල් ගස පිළිබඳව දරුවාගේ වර්ධන සටහනට සමගාමීව පොල් පැළයේ වර්ධනය ද වර්ධන සටහනක සටහන් කරනු ලබයි. දරුවා පාසල් වියට පා තැබීම හා පොල් පැළයේ පීදීම ආරම්භය සනිටුහන් වීම යන ප්‍රතිඵල දෙකම එකවර සිදුවීමට මඟ හෙළිපෙහෙලි කරදීම අපගේ බලාපොරොත්තුවයි.

මෙම වැඩසටහන යටතේ පොල් පැළ වගාකිරීම සඳහා විභවතාවයක් ඇති ප්‍රදේශයක පොල් පැළ 1 – 2 ක් වගාකිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත, නව උපත්ලාභී දරුවන් වෙනුවෙන් මව්වරුන් සඳහා උපරිම වශයෙන් පොල් පැළ 2 ක් නොමිලේ නිකුත් කෙරේ. 2013 වර්ෂයේ මෙම වැඩසටහන යටතේ පොල් පැළ 1427 ක් නිකුත් කෙරිණි. වාර්ෂික මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 0.26 ක් වේ.

## 1.15. තැඹිලි වගා ප්‍රවර්ධන වැඩසටහන

විදේශ වෙළඳපළ සඳහා තැඹිලි වතුර අපනයනය සීඝ්‍රයෙන් ප්‍රචලිත වෙමින් පවතින බැවින් හා සෘජුවම තැඹිලි අපනයනය ද පුළුල් වී ඇති බැවින් තැඹිලි වගාව ප්‍රවර්ධනය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් උසස් තත්ත්වයේ තැඹිලි පැළ වගාකරුවන්ට ලබාදීම පිණිස තැඹිලි පැළ නිෂ්පාදනය මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. 2013 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ආකාරයට ප්‍රගතිය අත්පත් කරගෙන ඇත.

| වැඩසටහන | භෞතික | | | මූල්‍ය | | |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය (තැඹිලි බීජ) | ප්‍රගතිය (තැඹිලි බීජ) | % | ඉලක්කය රු.මි | ප්‍රගතිය රු.මි | % |
| තැඹිලි වගා ප්‍රවර්ධන වැඩසටහන | **10,000** | **3,826** | **38** | **0.27** | **0.095** | **35.42** |

## 1.16. අකාබනික පොහොර සහනාධාර ප්‍රවර්ධන වැඩසටහන

රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන සහන මිලට පොහොර නිකුත් කිරීමේ වැඩසටහන මගින් නිකුත් කරනු ලබන පොහොර පොල් වගාවට යෙදීම සඳහා පොල් වගාකරුවන් උනන්දු කරවීම සඳහා ක්‍රියාත්මක විය.
පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් පොල් පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් දියත් කරන ලද අතර 2013 වර්ෂය සඳහා ඉලක්කගත පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 450 ක් විය.2013 වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පුහුණු වැඩසටහන් 1704 ක් පවත්වා ඇත. 2013 වර්ෂයේදී මෙම වැඩසටහනට ලබාදුන් මූල්‍ය ඇස්තමේන්තුව රු. මිලියන 0.99 ක් වූ අතර රු මිලියන 0.34 ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.




# 02 වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දන වැඩසටහන

ශ්‍රී ලංකාවේ දකුණ ප්‍රදේශයේ මාතර දිස්ත්‍රික්කයට අයත් වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් මුලින්ම වාර්තා වු වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගී තත්ත්වය පසු කාලීනව ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කවලින්ද වාර්තා විය. වෛරසයකට බොහෝදුරට සමාන පයිටොප්ලාස්මා ව්‍යාධිකාරකය මඟින් මෙම රෝගය ඇති කෙරෙන අතර දැනට ලෝකයේ කිසිදු රටක පයිටොප්ලාස්මා සඳහා නිසි ප්‍රතිකාරයක් සොයාගෙන නොමැත.

මෙම රෝගය හඳුනා ගැනීමෙන් පසුව පොල් පර්යේෂණ ආයතනය, ශාක ආරක්ෂක පනත ක්‍රියාත්මක කිරීමේ නෛතික බලධරයා වන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ එක්ව මාතර, හම්බන්තොට හා ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවා කොට්ඨාශ 408 ක් රෝග කලාප වශයෙන් නම් කර ඇත.

එසේම රෝගය පිටතට බෝවීම වැලක්වීම සඳහා ගාල්ල දෙවට සිට හක්මන හරහා තංගල්ල දක්වා කි.මි.86 ක් දිග කි.මි. 3 පළල රෝග වැලක්වීමේ කලාපයක් නම් කරන ලදී. මෙම කලාපයේ සියළුම රෝගී ගස් ගලවා දැමු අතර මෙම කලාපයේ මායිම් වලින් පිටට පොල් ගසේ හි කිසිදු ජීව ද්‍රව්‍යක් ගෙනයාම ශාක ආරක්ෂක පනත යටතේ තහනම් කරන ලදී.

එසේම කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව මඟින් මෙම කුලයට අයත් අනෙකුත් භෝගයන් ප්‍රවාහනය සඳහා ද මෙම තහනම පනවා ඇත. මෙම රෝගය මුලිනුපුටා දැමීමේ අටියෙන් ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික් තුළ ඉඩමෙන් ඉඩමට ගොස් සමීක්ෂණයක් සිදුකළ අතර එහි දී රෝගී ගස් හා පැළ 344,000 ක් හඳුනා ගනු ලැබිණි. පොල් පර්යේෂණ ආයතනය විසින් දේශීය හා විදේශීය විශේෂඥවරුන්ගෙන් සමන්විත විවිධාකාර වු වැඩසටහන් හා උපදේශක සේවා මඟින් ලබාගත් තොරතුරු හා උපදෙස් අනුව රෝගී කලාපය තුළ සියලු රෝගී පොල් ගස් ගැලවීම ද ආරම්භ කරන ලදී. මේ සඳහා පොල් වගාකරුවන්ට ගස් ඉවත්කිරීම වෙනුවෙන් වන්දි මුදලක් ගෙවන ලද අතර අතුරුබෝග වගාව සඳහා විවිධ රාජ්‍ය ආයතන සමඟ එක්වී සහනාධාර ලබා දෙන ලදී.

මෙම රෝගය මර්ධනය සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග නොමැති බැවින් පොල් පර්යේෂණ ආයතනයේ උපදෙස් පරිදි 2008 වසරේ සිට පොල් ගස් ඉවත් කිරීම සිදුවූ අතර 2011 වසරේදී පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය ආරම්භ වීමෙන් පසුව රෝගී ගස් ඉවත් කිරීමේ සුවිශේෂී දැවැන්ත වැඩසටහනක් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එක්ව ආරම්භ කරන ලදී.

2008 - 2012 වසර 5 තුළ පොල් ගස් 172007 ත් පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් ඉවත් කර රු.මිලියන 332 මුදලක් වගාකරුවන් වෙත වන්දි වශයෙන් ප්‍රදානය කරන ලදී. ඊට අමතරව රෝගී ගස් 5666 ක් රසායනික ද්‍රව්‍ය එන්නත් කර විනාශ කරන ලදී.

මේ යටතේ 2013 වසර තුලදී පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් රෝගී ගස් 67481ක් ඉවත් කර රු.මිලියන 107.46 මුදලක් වගාකරුවන් වෙත වන්දි වශයෙන් ගෙවන ලදී. මෙයට අමතරව රෝගී ගස් 1599 ක් රසායනික ද්‍රව්‍ය එන්නත් කර විනාශ කරන ලදී.

| දිස්ත්‍රික්කය | සලකුණු කළ ගස් ගණන | ඉවත් කළ මුළු ගස් ගණන | ගෙවීම් කල ගස් ගණන | ගෙවූ මුදල (රු.) |
|---|---|---|---|---|
| මාතර | 37587 | 62,684 | 50,819 | 101,607,000.00 |
| ගාල්ල | 2994 | 2,698 | 2,496 | 4,992,000.00 |
| හම්බන්තොට | 2099 | 2,099 | 429 | 858,000.00 |
| **එකතුව** | **42,680** | **67,481** | **53,744** | **107,457,000.00** |

මේ අනුව වැලිගම රෝග කළමනාකරණ වැඩසටහනේ සුවිශේෂී ජයග්‍රහණයක් සනිටුවහන් කරමින් 2013.12.31 වන විට රෝගී ගස් ලෙස සැළකුණු පැළ, සියලු ගස් ඉවත් කිරීම හෝ විනාශ කිරීම සිදුකරන ලදී. එම ගස් ප්‍රමාණය 245,512 කි.

2013 වර්ෂයේදී වැලිගම කොළ මැලවීමේ හා කොළ කුණුවීමේ රෝග මර්ධන වැඩසටහනේදී රෝගී ගස් ඉවත් කිරීමට අමතරව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි රෝගයෙන් හානියට පත් වගාකරුවන්ට රෝගයට ප්‍රතිවිරෝධී කුන්දිරා පොල් පැළ ලබාදීමත් රෝගී පොල් ගස් ඉවත් කරනු ලැබූ පොල් ඉඩම්වල සිටුවීම සඳහා අතුරු භෝග සිටුවීමටත් පියවර ගන්නා ලදී. ඒ අනුව 2013 වර්ෂයේදී පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් බෙදා දෙනු ලැබූ කුන්දිරා සමස්ථ පොල් පැළ ප්‍රමාණය 33516 කි. මීට අමතරව අතුරු වගාව සඳහා කුරුදු පැළ 180,000 හා ගම්මිරිස් පැළ 10,000ක් සහ හෙක්ටයාර 125ක් සඳහා වගාකරුවන් 143 දෙනෙකුට පළතුරු පැළ බෙදාදෙන ලදී.




# 03 ව්‍යාප්ති වැඩසටහන

කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ආයතනයක සම්පත් බෙදා හැරීම , තාක්ෂණය ලබා දීම, තොරතුරු හුවමාරුව, විවිධ සන්නිවේදන කටයුතු සඳහා එකී ආයතනයේ නිළධාරීන් හා සංවර්ධන ඉලක්කගත කණ්ඩායම් හා වගාකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් හා තොරතුරු හුවමාරුවක් අවශ්‍ය වේ. මේ සඳහා එකී ආයතනයේ ව්‍යාප්ති සේවය කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකරනු ලබයි. පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති සේවය යනු ආයතනයේ ප්‍රධානම කාර්යභාරයකි. මෙය සම්බන්ධීකරණය වී ඇත්තේ පහත ආකාරයටයි.

**ව්‍යාප්ති හා ගොවිපල සංවර්ධන අංශය - ප්‍රධාන කාර්යාලය**
(නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-ව්‍යාප්ති හා සංවර්ධන) + (සහකාර සාමාන්‍යාධිකාරි - ව්‍යාප්ති හා සංවර්ධන)

**සැලසුම් අංශය**
(සහකාර සාමාන්‍යාධිකාරි - සැලසුම් හා

**තොරතුරු ඒකකය- ප්‍රධාන කාර්යාලය** (පොල් සංවර්ධන නිළධාරීන්)

**ප්‍රාදේශීය කාර්යාල 18**
(ප්‍රාදේශීය කළමණාකරුවන්) + (සහකාර ප්‍රාදේශීය කළමණාකරුවන් (තාක්ෂනික) + (ගොවිපළ සැලසුම් නිළධාරීන්)

**පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය - ලුණුවිල**
(විෂයානුබද්ධ විශේෂඥ / විෂයානුබද්ධ නිළධාරීන්)
**දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය**
(පුහුණු නිළධාරීන්)
**නැගෙනහිර පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය**
(පුහුණු නිළධාරීන්)

**පොල් සංවර්ධන නිළධාරි කාර්යාල 325** (පොල් සංවර්ධන නිළධාරීන්) + ( ක්ෂේත්‍ර නිළධාරීන්)

සමස්ත සංයුක්ත සැලැස්මට අනුකූලව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම හා අදාල සංවර්ධන සැලැසුම් මෙන්ම ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන බෙදාහැරීමේ සැලැස්මද සැලසුම් අංශය මඟින් සිදුකෙරෙන අතර එය ව්‍යාප්ති හා සංවර්ධන අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ ඒකාබද්ධතාවය හා අධීක්ෂණය යටතේ සිදුකෙරේ. ඊට අනුකූලව මෙම සියළු තොරතුරු ලිඛිතව හා චක්‍රලේඛන අනුසාරයෙන් ප්‍රාදේශීය කාර්යාල වෙත යැවෙන අතර ප්‍රාදේශීය කළමණාකරුවන් විසින් තම බල ප්‍රදේශය තුළ සංවර්ධන හා ව්‍යාප්ති වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙහි අධීක්ෂණ නිලධාරීන් වශයෙන් ප්‍රාදේශීය කළමනාකරුට අමතරව සහකාර ප්‍රාදේශිය කළමණාකරුවන් හා ගොවිපළ සැලසුම් නිළධාරීන් ක්‍රියාකරනු ලැබේ.

ඔවුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ වාර්ෂිකව හා මාසිකව පොල් සංවර්ධන නිළධාරීන් හා ක්ෂේත්‍ර නිළධාරීන්ගේ ව්‍යාප්ති කටයුතු සංවිධානය කෙරෙන අතර මේ සඳහා අවශ්‍ය පූර්ණ සහයෝගය, සම්පත් ලබා දිම හා මඟ පෙන්වීම පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය හි විෂයානුබද්ධ නිළධාරීන් මඟින් සිදුකෙරේ.

මේ හැරණු විට ප්‍රධාන කාර්යාලයේ ව්‍යාප්ති සහ සංවර්ධන අංශය සහ තොරතුරු ඒකකය ජාතික මට්ටමින් හා ප්‍රධාන කාර්යාලයීය මට්ටමින් වැඩසටහන් හා සේවා ලබා දීම සිදුකෙරේ.





**විවිධ කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින්**

2013 ව්‍යාප්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය මට්ටමේ නිළධාරී කාර්යාල වන පොල් සංවර්ධන නිළධාරී කාර්යාල, මෙම වසර තුළ දී 225 ක් ක්‍රියාත්මක වුව ද 2013.12.31 වන විට පොල් සංවර්ධන නිළධාරීන් 168 දෙනෙකු පමණක් ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු කරන ලදී.

මෙම වසර තුළදී පොල් සංවර්ධන නිළධාරීන් මඟින් ඒක පුද්ගල හමුවීම් 120,169 ක් සිදුකොට ඇති අතර කණ්ඩායම් සාකච්ඡා, ක්‍රම ආදර්ශණ, ගොවි පුහුණු පංති ආදී කණ්ඩායම් ව්‍යාප්ති ක්‍රම 14,891 ක් මඟින් වගාකරුවන් හමුවීම් 695,444 ක් සිදු කර ඇත.

# 3.1. 2013 වර්ෂයේ පැවැත්වූ පුහුණු වැඩසටහන්

## 3.1.1 පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, ලුණුවිල



ලුණුවිල පොල් පර්යේෂණ ආයතනයට ආසන්න පරිශ්‍රයක පිහිටුවා ඇති පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් පොල් වගා ක්ෂේත්‍රයේ පුහුණු හා ව්‍යාප්ති වැඩසටහන් ඒකාබද්ධව මෙහෙයවනු ලැබේ.

මේ අනුව එම කටයුතු සඳහා සහකාර සාමාන්‍යාධිකාරී (පුහුණු) හා විෂයානුබද්ධ විශේෂඥ නිළධාරී 03 ක් විෂයානුබද්ධ නිළධාරින් 04 දෙනෙකු විසින් ඉටු කරනු ලබයි.

ප්‍රාදේශීය කාර්යාල මඟින් මෙහෙයවනු ලබන වර්ෂයේ සංවර්ධන සැළැස්ම පාදක කරගත් ව්‍යාප්ති සැලැස්මට අමතරව පුහුණු මධ්‍යස්ථානය මඟින් ද සෘජුවම ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගයෙන් විශේෂිත වැඩසටහන් කිහිපයක් ඉටු කරයි. එසේම පුහුණු මධ්‍යස්ථානයේ නිළධාරීන්ගේ සේවය පොල් වගාකරුවන්ට මෙන්ම පොල් වගාකිරීමේ මණ්ඩලයේ සියළුම අංශයන් වෙත ද ලබා දේ.



පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින්

ප්‍රාදේශීය කාර්යාලවලින් සිදු වන ව්‍යාප්ති වැඩසටහන්වල ප්‍රගතිය ද පුහුණු මධ්‍යස්ථානය මඟින් ඇගයීමට ලක් කෙරේ. එසේම සමස්ත පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා පුහුණු ආධාරක නිෂ්පාදනය කරනුයේ ද පුහුණු මධ්‍යස්ථානය මඟිනි.

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය තෘතික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කරන ලද ආයතනයකි. ඒ අනුව පාඨමාලා පැවැත්වීමට හා සහතික ලබාදීම සඳහා වෘත්තීය වලංගුභාවය ආයතනය සතුවේ.

## 3.1.1.1 පොල් වගාකිරීමේ මණ්ඩලයේ තාක්ෂණික නිලධාරීන් හා තාක්ෂණික නොවන නිලධාරීන් සඳහා පුහුණු කිරීම

### ප්‍රාදේශීය කළමනාකරුවන්, සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් හා පොල් සංවර්ධන නිලධාරීන් සඳහා "වැලිගම කොළ මැලවීමේ රෝගය පිළිබඳ දැනුවත් කිරීම"

මේ තුලින් රෝග ලක්ෂණ හඳුනාගැනීමට කුසලතාවය ඇති කළ අතර ඒ අනුව යම් ප්‍රදේශයක එවැනි ලක්ෂණ දුටු වහාම වාර්තා කිරීමට උපදෙස් ලබා දුනි. මෙවන් වැඩසටහන් 10 ක් සැළසුම් කළ අතර ඉන් 09 ක් පැවැත්වුනි.

### අභ්‍යාසලාභී උපාධිධාරීන් සඳහා පුහුණුව

පොල් වගාකිරීමේ මණ්ඩලයට බඳවා ගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් සංවර්ධන කටයුතු වල නියැලෙන බැවින් ඔවුන්ට පොල් වගාව පිළිබඳ දෙදින නේවාසික පුහුණු වැඩසටහන් 03 පවත්වා ඇත.

### පර්යේෂණ ව්‍යාප්ති සංවාද

ප්‍රාදේශීය කළමනාකරුවන්, සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්, ගොවිපල සැළසුම් නිලධාරීන්, පොල් සංවර්ධන නිලධාරීන්, නේවාසික තවාන් භාර නිලධාරීන්, තවාන් නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා මෙය පැවැත්විණි. මෙහිදී පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ හා ඊට සබැඳි පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති ගැටළු පිළිබඳ විසඳුම් සෘජුවම පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂක ඇතුළු පර්යේෂණ නිලධාරීන් සමඟ සාකච්ඡා කෙරිණි. මෙවන් වැඩසටහන් තුනක් පවත්වා ප්‍රාදේශීය කාර්යාල 10 ක් ආවරණය කර ඇත.

### ප්‍රාදේශීය කළමනාකරුවන් හා සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් සඳහා කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණුව

මෙය එක් දින පුහුණු වැඩසටහන් ලෙස ප්‍රධාන කාර්යාලයේදීම පවත්වන ලදී. එහිදී කාර්යාල කළමනාකරණය හා විවිධ කාර්යාල තුල ඇති යන්ත්‍ර හා විද්‍යුත් උපකරණ නඩත්තුවද පුහුණු කරන ලදී.

### විෂයානුබද්ධ නිලධාරීන් සඳහා පුහුණුව

දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම පිළිබඳ දින 03ක පුහුණුවක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේදී ලබා දෙන ලදී. මේ තුලින් පර්යේෂණ තොරතුරු නිවැරදිව රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම පිළිබඳ අවබෝධය ලැබිණි.

### වතු කළමනාකරුවන් සඳහා පුහුණු වැඩසටහන

පර්යේෂණ ව්‍යාප්ති සංවාදයක් ආකාරයට වතු කළමනාකරුවන් සඳහා ද පොල් වගාවේ නව තාක්ෂණය පිළිබඳ අවබෝධය ලබා දෙන ලදී. ඒ තුලින් නිසි පොල් ඉඩම් කළමනාකරණය පිළිබඳව දැනුම හා කුසලතා වර්ධනය කෙරිණි.

### තවාන් නිලධාරීන් සඳහා තාක්ෂණික දැනුම යාවත්කාලීන කිරීමේ පුහුණුව

තවාන් නිලධාරින් සඳහා දෙදින පුහුණු වැඩසටහනක් මඟින් පොල් වගාවේ තාක්ෂණය පිළිබඳ දැනුම හා කුසලතා යාවත්කාලීන කරන ලදී.

### නවක පොල් සංවර්ධන නිලධාරීන් සඳහා මූලික පුහුණුව

මෙම පුහුණු වැඩසටහනේ කාලය දින 15ක් වූ අතර මෙවැනි වැඩසටහන් 02ක් පැවැත්වුණි. ඒ අනුව දින 30ක් මේ සඳහා යොදා ගැනිණි. මෙහිදී නවක පොල් සංවර්ධන නිලධාරීන් සඳහා පොල් වගාවක් පාලනය කිරීමට පොල් ඉඩමක ඵලදායීතාවය ඉහළ දැමීමට අදාලව සියළුම විෂය දැනුම හා ප්‍රායෝගික දැනුම ලබා දෙන ලදී. එසේම ආයතනික ව්‍යුහය කාර්යභාරය හා වගකීම පිළිබඳවත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ මූල්‍ය හා පරිපාලන නීති රීති පිළිබඳවත් දැනුවත් කරන ලදී.

### රියදුරන් සඳහා අවශ්‍ය දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන

මෙම වැඩසටහන තුලින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ රියදුරන් සඳහා වාහන නඩත්තුව රිය පැදවීම මාර්ග නීති රක්ෂණය හදිසි අනතුරු වලදී ක්‍රියා කළ යුතු ආකාරය විනයගරුක බව හා ධාවන සටහනක් නඩත්තුව ආදිය පිළිබඳව රියදුරන් දැනුවත් කරන ලදී.

## 3.1.1.2 පොල් වගාකරුවන් සඳහා පුහුණු කිරීම්

### පොල් වගාකරුවන් සඳහා දෙදින පුහුණු කිරීම්

මෙම පුහුණු වැඩසටහන නේවාසික වැඩසටහන වන අතර ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී සිදු කෙරේ. මේ සඳහා වගාකරුවන්, රාජ්‍ය නිලධාරින්, තාක්ෂණික විද්‍යාලවල සිසුන් හා විවිධ වූ පොල් වගා දැනුම අවශ්‍ය පිරිස් සහභාගී වේ. පළමු දිනය තුල න්‍යායාත්මක දැනුම වර්ධනය කරන අතර දෙවන දිනයේදී ප්‍රායෝගික අධ්‍යයනයක නිරත වේ.

එහිදී අතුරුභෝග වගාව පිළිබඳවත් පොල් ඉඩම් වල සත්ත්ව පාලනය පිළිබඳවත් පොල් පැළ නිෂ්පාදනය පිළිබඳවත් දැනුවත් කරන ලදී. මෙවන් වැඩසටහන් 15 ක් සැළසුම් කළ අතර ඉලක්ක අභිභවා යමින් දින දෙකේ පුහුණු 21 පවත්වා ඇත. මෙහිදී වරකට 30 දෙනෙකු සඳහා පුහුණුව ඉලක්ක කල අතර ඒ අනුව පුහුණු කළ පුද්ගල සංඛ්‍යාව 417 කි. පුහුණු දින ගණන 42 කි.

### පොල් වගාකරුවන් සඳහා එක් දින පුහුණු වැඩසටහන

මෙම වැඩමුළු තුලින් පොල් වගාකරුවන් සඳහා පොල් වගාවක් නිවැරදිව ආරම්භ කිරීම හා නඩත්තුව පිළිබඳව දැනුවත් කරන ලදී. මෙය ක්ෂේත්‍ර දින වශයෙන් ආදර්ශන සහිතව ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහනකි. මෙවැනි එක් දින ක්ෂේත්‍ර පුහුණු 15 සැළසුම් කළ අතර ඉන් 14 ක් පවත්වා ඇත. ඒ තුලින් පොල් වගාකරුවන් 1557 දෙනෙකු පුහුණු කරන ලදී.

### කුඩා පරිමාණ පොල් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා පුහුණුව

මේ යටතේ පොල් ආශ්‍රිත ආහාර වර්ග සහ ඉදල් හා කොහු සෑදීම පිළිබඳ කජ්රුක පුරවර සාමාජිකයින් දැනුවත් කරන ලදී. මෙහිදී මෙම කර්මාන්ත පිළිබඳ උවමනා හා ලැදි පිරිස් යොමු කරවන ලදී. දින දෙකේ එවන් වැඩසටහන් 07 සැළසුම් කළ අතර ඉන් 05 ක් පවත්වා ඇත. ඒ තුලින් 183 දෙනෙකු පුහුණු කරන ලදී.

### වර්ෂය තුල බඳවා ගන්නා ලද නවක උපාධිධාරි අභ්‍යාසලාභින් සඳහා පොල් වගා පුහුණුව

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන කටයුතු සඳහා දායක වන බැවින් ඔවුන් සඳහා එක් දින පොල් වගා පුහුණුවක් ලබා දෙන ලදී. එවන් වැඩසටහන් 10 ක් සැළසුම් කළ අතර ඉන් 10 ක්ම පවත්වා ඇත. ඒ අනුව පුහුණු කළ සංඛ්‍යාව 471 කි.

## 3.1.1.3 ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් මෙහෙයවන ජාතික මට්ටමේ පුහුණු වැඩසටහන්

### ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කරවනු ලබන ජාතික ව්‍යාප්ති වැඩසටහන

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ථ ව්‍යාප්ති වැඩසටහන සඳහා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සම්බන්ධීකරණය මහපෙන්වීම සිදු කෙරේ. එසේම ව්‍යාප්ති ප්‍රගති වාර්තා සැකසීම සිදු කෙරේ.
මේ යටතේ ඉටුකරනු ලබන ප්‍රධාන පුහුණු වැඩසටහන් කාණ්ඩ හතරකි. එනම් අඛණ්ඩ පුහුණු වැඩසටහන, පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන, රාජ්‍ය කාර්යාල කාර්ය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන හා ග්‍රාමීය සංවිධාන සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහනයි. මේ සඳහා අවශ්‍ය අවස්ථාවලදී පුහුණු මධ්‍යස්ථානයෙන් සම්පත්දායකයින් යොමු කෙරේ.

### අඛණ්ඩ පුහුණු වැඩසටහන්

මෙම වැඩසටහන පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු කාර්ය මණ්ඩලය හා ප්‍රාදේශීය කාර්යාල ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය ඒකාබද්ධව ක්ෂේත්‍රයේදී පැවැත්වේ. එක් දින වැඩසටහන් තුනක් හා ක්ෂේත්‍ර අධ්‍යයනයක් ඇතුලත්ව සිව් දින පුහුණු වැඩසටහනක් වශයෙන් මෙය ක්‍රියාත්මක කෙරේ. මෙය ප්‍රාදේශීය මට්ටමට ගොස් පවත්වනු ලබන වැඩසටහනක් බැවින් පුහුණු මධ්‍යස්ථානයට පැමිණීමට අපහසු වගාකරුවන් අතර ඉතා ජනප්‍රිය වැඩසටහනකි. මෙවැනි වැඩසටහන් දින 40 සැළසුම් කළ අතර ඉන් 27 ක් පවත්වා ඇත. පුහුණු වූ සංඛ්‍යාව 1391 කි.

### පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන

ප්‍රාදේශීය කාර්යාල හරහා පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 85 පැවැත්වීමට සැලසුම් කර තිබුණු අතර ඉන් 48 ක් සම්පූර්ණ කර තිබිණි. පුහුණු කළ සංඛ්‍යාව 3320 කි.

### රාජ්‍ය කාර්යාල කාර්ය මණ්ඩල නිලධාරී පුහුණුව

මෙම වැඩසටහන්වල මුළු ඉලක්කය 85 වූ අතර ඉන් 55 ක් සම්පූර්ණ කර ඇත. පුහුණු කළ පුද්ගල සංඛ්‍යාව 6012 කි.

### ග්‍රාමීය සංවිධාන සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන

ප්‍රාදේශීය මට්ටමේ සංවිධානගත විවිධ වූ සංගම් සමිති අලලා මෙම පුහුණු කිරීම් පැවැත්වේ. එවැනි වැඩසටහන් 85 ඉලක්ක කළ අතර ඉන් 51 ක් සම්පූර්ණ කර ඇත. පුහුණු ප්‍රතිලාභීන් ගණන 3945 කි.

## 3.1.4 වැඩමුළු පැවැත්වීම

පුත්තලම දිස්ත්‍රික්කයේ ආරච්චිකට්ටුව ප්‍රදේශය ආවරණය කරමින් 355 දෙනෙකුගේ සහභාගිත්වයෙන් විශේෂ වැඩමුළුවක් පවත්වන ලදී. එහිදී රෝග පළිබෝධ මර්දනය, පොහොර යෙදීම, තෙතමන සංරක්ෂණය, ජල සම්පාදනය ආදී විවිධ ක්ෂේත්‍ර ආදර්ශන භාවිතා කළ අතර මීට පෞද්ගලික අංශයේ පොල් වගා ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ නිෂ්පාදන සමාගම්ද ආදර්ශන ඉදිරිපත් කරන ලදී.

## 3.1.5 ජාතික මට්ටමේ රෝග පළිබෝධ කළමනාකරණ වැඩසටහන්

මෙමඟින් පොල් වගාව ආශ්‍රිත රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන් විශාල සංඛ්‍යාවක් දීප ව්‍යාප්තව සංවිධානය කර පැවැත්වුණි. ඒ පහත ආකාරයට වේ.

- **රතු කුරුමිණි හානි කළමනාකරණ ව්‍යාපාර පැවැත්වීම**

මේ යටතේ වැඩසටහන් 05ක් සැළසුම් කළ අතර ඉන් 03 ක් පවත්වා ඇත. ඒ මොණරාගල,ඇඹිලිපිටිය හා රබේ යන ස්ථානවල වේ. එම ව්‍යාපාර තුන යටතේ පැවැත්වූ පුහුණු පංති ගණන පහත පරිදිය.

ස්ථානීය පුහුණු වැඩසටහන් ගණන = 56
සහභාගි වූ වගාකරුවන් ගණන = 3131
බෙදාදුන් පෙරමෝන උගුල් ගණන = 3000

- **පොල් වගාවේ කළු කුරුමිණි හානි කළමනාකරණය**

මේ යටතේ සැළසුම් කළ වැඩසටහන් ගණන 18 ක් වන අතර එය අභිබවා වැඩසටහන් 20 ක් පවත්වා ඇත. මෙම දැනුවත් කිරීම් තුල කළු කුරුමිණි පෙරමෝන උගුල හඳුන්වාදීම ප්‍රධාන තැනක් ගත් අතර එය පොල් පර්යේෂණ ආයතනයේ අළුත් නිර්දේශයක් විය. මේ යටතේ නිකුත් කළ පෙරමෝන බට ගණන 1303 කි. දැනුවත් කළ පුද්ගලයින් ගණන 913 ක් වේ.

- **පොල් දළඹු හානි කළමනාකරණය**

පොල් දළඹු හානි කළමනාකරණය කරන ලද ඉඩම් අක්කර ගණන 203 ක් වන අතර මුදාහරින ලද දළඹු ව්‍යාධිජනක බට ගණන 850 කි.

- **පොල් වගාවේ මයිටා හානි කළමනාකරණය**

මෙම වැඩසටහන යටතේ නව මයිටා විලෝපික අභිජනන මධ්‍යස්ථානයක් මුලතිව් දිස්ත්‍රික්කයේ විවෘත කරන ලදී. ඒ අනුව විද්‍යාගාර මුළු සංඛ්‍යාව 06ක් දක්වා වර්ධනය විය. 2013 වර්ෂය තුල මුදාහරින ලද මයිටා විලෝපික පැකට් සංඛ්‍යාව 100532 ක් වන අතර විද්‍යාගාර උපදෙස් ලබා දීමේ වැඩ සටහන් 09 ක් පවත්වා නිලධාරින් 82 ක් දැනුවත් කර ඇත.

මයිටා විලෝපිකයින්ගේ සාර්ථකත්වය අත්හදාබැලීම සඳහා ආදර්ශන 18 ක් සැළසුම් කළ අතර එයින් 10ක් ස්ථාපිත කරන ලදී. ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් 04 ක් සිදුකර වගාකරුවන් 415 ක් දැනුවත් කර ඇත.

- **වෙනත් කාලීන පළිබෝධ හානි කළමනාකරණය**

මේ යටතේ කොරපොතු කෘමි හානිය පිළිබඳ වගාකරුවන්ට උපදෙස් ලබාදී ඇත.

## 3.1.6 ජාතික මට්ටමේ මාධ්‍ය වැඩසටහන

ජාතික මට්ටමේ මාධ්‍ය වැඩසටහන යටතේ ප්‍රදර්ශන 12 ට සහභාගී වීමට සැළසුම් කළ අතර එම ඉලක්කය අභිබවා යමින් ප්‍රදර්ශන 16ක් සඳහා අවශ්‍ය මාධ්‍ය උපකරණ සපයමින් සම්බන්ධ වී ඇත. මේ තුලින් පොල් වගාකරුවන් හා පාසල් සිසුන් විශාල සංඛ්‍යාවකට පොල් වගා දැනුම ලබා දී ඇත. ඒ පහත ආකාරයටය.

මාධ්‍ය උපකරණ හා ප්‍රදර්ශන ද්‍රව්‍ය සපයන ලද ජාතික මට්ටමේ ප්‍රදර්ශන පහත පරිදි වේ.

- අධ්‍යාපන ප්‍රදර්ශනය - පන්නල ජාතික පාසැල
- දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය (අම්පාර)
- අධ්‍යාපනික වෙළඳ ප්‍රදර්ශනය - රත්නපුරය
- කළුතර මතුගම මධ්‍ය මහා විද්‍යාලීය ප්‍රදර්ශනය
- කප්රුක පුරවර කුලියාපිටිය බිංගිරිය
- කිලිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලීය ප්‍රදර්ශනය
- කප්රුක පුරවර මඳුරන්කුලිය
- කටුනේරිය නතාලේ ප්‍රදර්ශනය
- කඩාමෝට්ටෙ නවෝදය - කඩාමෝට්ටය මුස්ලිම් විද්‍යාලය - පුත්තලම
- මඩහපොල මහින්ද මහා විද්‍යාලීය අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය
- බිංගිරිය මල් වසන්තය
- මාතර තෙලිජ්ජවිල පුහුණු මධ්‍යස්ථානයේ කෘෂිකර්ම ප්‍රදර්ශනය
- මාතර කැකුණඳුර සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ කෘෂි ප්‍රදර්ශනය
- මඩකලපුව පාසිකුඩා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ ප්‍රදර්ශනය
- වාරියපොල කෘෂි විද්‍යාලීය ගොවි සතිය ජාතික කෘෂිකර්ම ප්‍රදර්ශනය
- මුන්දලම, කනමුල්ල මුස්ලිම් විද්‍යාලීය අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය

### 3.1.6.1 අත්පත්‍රිකා ,අත්පොත් ,බැනර් ,පෝස්ටර් තුලින් තාක්ෂණය බෙදාහැරීම

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සෑම ප්‍රාදේශීය කාර්යාලයක් හරහාම හා දැයට කිරුළ වැනි ප්‍රදර්ශන හරහා බෙදාහරිනු ලබන අත්පත්‍රිකා (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින්) නිර්මාණය කිරීම හා මුද්‍රණ කටයුතු මෙහෙයවීම හා බෙදාහැරීම කරනු ලබන්නේ ලුණුවිල පුහුණු මධ්‍යස්ථානය මඟිනි. මේ තුලින් විශාල ජනතාවක් පොල් වගාව පිළිබඳ දැනුවත් කෙරේ.

2013 වසරේදී මුද්‍රණය කරන ලද හා බෙදාහරින ලද පත්‍රිකා හා මාධ්‍ය ප්‍රදර්ශන පහත පරිදි වේ.

| වර්ණ තාක්ෂණික අත්පත්‍රිකා | 862200 |
|---|---|
| **EXT (ව්‍යාප්ති) පෝරම පොත්** | 800 |
| **අත් පත්‍රිකා (කළු සුදු)** | 25000 |
| **සහතික පත්‍ර මුද්‍රණයන්** | 905 |
| **පො.සං.නි. කාර්යාල සඳහා තාක්ෂණික බැනර්** | 49 |
| **තවාන් සඳහා තාක්ෂණික බැනර්** | 96 |
| **පාසිකුඩා සඳහා නාමපුවරු (පොල් ලී)** | 125 |

## 3.2. මැදමුලන දක්ෂිණ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය

ගාල්ල, මාතර, හම්බන්තොට ඇතුළුව දකුණු ප්‍රදේශයේ සහ මොණරාගල දිස්ත්‍රික්යේ පොල් වගාකරුවන් දැනුවත් කිරීම සහ පුහුණු වැඩසටහන් මෙහෙයවීම සඳහා මෙම මධ්‍යස්ථානය පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් මැදමුලන පරිශ්‍රයේ සිට ක්‍රියාත්මක වේ.

| පුහුණු වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|
| 48 | 2304 |

## 3.3. නැගෙනහිර පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය

නැගෙනහිර පළාතේ මඩකළපුව දිස්ත්‍රික්යේ සුන්දර පාසිකුඩා වෙරළ තීරයට යාබදව පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයනෙහි මෙම මධ්‍යස්ථානය පිහිටුවා ඇති අතර පොල් සංස්කෘතික උද්‍යානයට ඒකාබද්ධව මෙම පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ.
සිංහල හා දමිළ භාෂා දෙවර්ගයෙන්ම මෙම පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම විශේෂත්වයකි. ඒ අනුව 2013 වර්ෂයේදී පහත පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

| පුහුණු වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|
| 05 | 74 |



# 04 ආදර්ශ පොල් උයන්

පොල් වගාකිරීමේ මණ්ඩලය සතුව ආදර්ශ පොල් උයන් 12ක් පවතින අතර එම පොල් උයන්වලින් වැඩි කොටස වයඹ පළාත කේන්ද්‍ර කර ගනිමින් පිහිටුවා ඇත.

මෙම ආදර්ශ පොල් උයන් මගින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් පැළ තවාන්වල පැළ නිෂ්පාදනයට අවශ්‍ය උසස් තත්වයේ බීජ නිෂ්පාදනය කරන අතරම සෑම ආදර්ශ පොල් උයනක්ම පොල් වගාකරුවන්ගේ අවශ්‍යතා සපුරාලන කේන්ද්‍රීය මධ්‍යස්ථාන ලෙස කටයුතු කරනු ලැබේ.

ඒ අනුව පොල් වගාව, විවිධ අතුරුබෝග වගාව, සත්ත්ව පාලනය, වැනි කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල යෙදෙමින් පොල් වගාකරුවන්හට පොල් වගා කළමණාකරණය පිළිබඳ තාක්‍ෂණික හා ප්‍රායෝගික දැනුම සහ අවබෝධය ලබාදෙමින් පොල් ඉඩමක් උපරිම ඵලදායිතාවය ලබාගත හැකි ආදර්ශණ ඒකක වශයෙන් නඩත්තු කරනු ලබයි.

මෙම ආදර්ශ පොල් උයන් ලාභදායී මට්ටමක පවත්වා ගනිමින් පොල් වගාකිරීමේ මණ්ඩලයට ආදායමක් සපයන ප්‍රධාන සැපයුම් මාර්ගයක් ද වේ.

මණ්ඩලය මගින් ආදර්ශ පොල් උයන් 12 ක් පාලනය වන අතර, මෙම ආදර්ශ පොල් උයන්වලින් හතක් කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් වන අතර, කොරෙයි, පාසිකුඩා, කොහොඹාන නැගෙනහිර පළාතේ ද, පලෙයි ආදර්ශ පොල් උයන උතුරු පළාතේද පිහිටා ඇත.

දිවයිනේ තිබූ ආරක්‍ෂක තත්ත්වය මත නැගෙනහිර පළාතේ කොරෙයි , පාසිකුඩා සහ යාපනය අර්ධද්වීපයේ පිහිටි පලෙයි ආදර්ශ පොල් උයන් වසර කිහිපයක සිට නිසි කළමණාකරණයක් නොපැවතුනද, 2011 වර්ෂය වන විට සෑම ආදර්ශ පොල් උයනක්ම සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන ඇත.

සමස්ථයක් ලෙස සැලකීමේදී 2013 වර්ෂයේ සම්පූර්ණ ඵලදරණ ගස් ගණන 114484 ක් වූ අතර, ලබාගත් වාර්ෂික පොල් අස්වැන්න ගෙඩි 4,592,119 කි. පසුගිය වසරේ පැවති දැඩි පාරිසරික පසුබෑම යටතේ 2012 වර්ෂය හා සැසඳීමේදී පොල් ගෙඩි 2724695 ක අඩුවීමකි. එය ප්‍රතිශතයක් වශයෙන් ගත්කළ 37 % ක අගයකි.

මෙම වර්ෂය තුළ ගසකට ලැබූ සාමාන්‍ය පොල් ගෙඩි ගණන 40ක් වූ අතර, ගෙඩියක සාමාන්‍ය නිෂ්පාදන වියදම රුපියල් 15.37. ක් විය. සාමාන්‍ය විකුණුම් මිළ රුපියල් 32.05 වූ අතර, ගෙඩියකට ලැබූ සාමාන්‍ය ලාභය රුපියල් 16.68 කි. ඒ අනුව ආදර්ශ පොල් උයන්වලින් ලැබූ සමස්ථ ශුද්ධ ආදායම රුපියල් 50,252,726.66/- කි.

### පසුගිය වසර 05 ක ආදර්ශ පොල් උයන්වල වාර්ෂික පොල් ඵලදාව (2009 -2013)

| ආදර්ශ පොල් උයන | 2009 | 2010 | 2011 | 2012 | 2013 | වසර 05 ක සාමාන්‍යය | 2012 වර්ෂය සමඟ වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| නාගන්සෝල | 1232281 | 957441 | 978476 | 806573 | 356454 | 866245 | -56 |
| රන්දෙනිය | 961879 | 699215 | 880477 | 769928 | 407812 | 743862.2 | -47 |
| ලේනව | 888590 | 801933 | 978130 | 959772 | 406994 | 807083.8 | -58 |
| බෝපිටිය | 388817 | 357679 | 327924 | 380707 | 326189 | 356263.2 | -14 |
| ගර්ට්ලන්ඩ් | 885204 | 866933 | 656812 | 979484 | 735081 | 824702.8 | -25 |
| මහයාය | 1138455 | 982891 | 910520 | 1064918 | 955478 | 1010452.4 | -10 |
| ඩේසිවැලි | 847441 | 815829 | 889008 | 1155594 | 780740 | 897722.4 | -32 |
| කොරෙයි | 252910 | 185200 | 192505 | 70136 | 212527 | 103390.8 | 203 |
| පාසිකුඩා | 111208 | 86464 | 160409 | 400821 | 142456 | 235081.8 | -64 |
| කොහොඹාන | 349698 | 96531 | 185903 | 300970 | 155249 | 217366.8 | -48 |
| පලෙයි | - | - | 110611 | 277322 | 65347 | 140150 | -76 |
| මුන්දලම | 90993 | 81414 | 61884 | 150589 | 47792 | 61798.4 | -68 |
| එකතුව | **7147476** | **5931530** | **6332659** | **7316814** | 4592119 | 6264119.6 | -37 |

## ආදර්ශ පොල් උයන් හා එහි භූමි භාවිතය

| ආදර්ශ පොල් උයන | දිස්ත්‍රික්කය | කෘෂි දේශගුණික කලාපය | ඉඩම් අක්කර ප්‍රමාණය | පොල් අක්කර ප්‍රමාණය | ඵලදරණ පොල් අක්කර ප්‍රමාණය | අනෙකුත් බෝග අක්කර | පාරවල් ගොඩනැගිලි ආදිය අක්කර | පර්වත හා වන ගා අක්කර |
|---|---|---|---|---|---|---|---|---|
| නාගන්සෝල | කුරුණෑගල | අතරමැදි වියළි | 406 | 347 | 321 | 07 | 25 | |
| රන්දෙනිය | කුරුණෑගල | වියළි | 360 | 311 | 202 | 03 | 08 | 19 |
| ලේනව | කුරුණෑගල | වියළි | 483 | 361 | 271 | 39 | 43 | 34 |
| බෝපිටිය | කුරුණෑගල | අතරමැදි තෙත් | 142 | 104 | 74 | 10 | 07 | 08 |
| ගර්ට්ලන්ඩ් | කුරුණෑගල | අතරමැදි වියළි | 405 | 388 | 194 | 15 | 01 | 01 |
| මහයාය | කුරුණෑගල | අතරමැදි තෙත් | 331 | 290 | 185 | 16 | 23 | 01 |
| ඩේසිවැලි | කුරුණෑගල | අතරමැදි තෙත් | 306 | 279 | 216 | 15 | 05 | 06 |
| කොරෙයි | අම්පාර | වියළි | 469 | 276 | 88 | 76 | 06 | 106 |
| පාසිකුඩා | මඩකළපුව | වියළි | 238 | 149 | 78 | 31 | 20 | 38 |
| කොහොඹාන | අම්පාර | වියළි | 154 | 102 | 82 | 40 | 07 | 04 |
| පලෙයි | කිළිනොච්චිය | වියළි | 634 | 418 | 90 | 05 | 21 | 190 |
| මුන්දලම | පුත්තලම | වියළි | 14 | 14 | 11 | - | - | - |
| එකතුව | | | 3947 | 2692 | 1491 | 257 | | |

## වසර 5 ක පොල් ඵලදාව ප්‍රස්ථානුරූපීව




## ආදර්ශ පොල් උයන්වල නඩත්තු කරනු ලබන සත්ත්ව පාලන ව්‍යාපෘතින්

| ආදර්ශ පොල් උයන | සත්ත්ව වර්ගය | පට්ටි වස්සන් | වැස්සියන් | දෙනුන් | වස්සන් | කරත්ත ගව | කිකිළියන් |
|---|---|---|---|---|---|---|---|
| නාගන්සෝල | මී ගව | 01 | 26 | 25 | 28 | 02 | - |
| | එළු | 02 | 57 | 32 | 56 | - | - |
| රන්දෙනිය | එළ ගව | | 36 | 37 | 33 | 01 | - |
| | මී ගව | 01 | 10 | 02 | 02 | 02 | - |
| ලේනව | එළගව | 02 | 39 | 54 | 14 | - | - |
| ගර්ට්ලන්ඩ් | එළගව | 04 | 49 | 52 | 20 | 04 | - |
| | මී ගව | 01 | 03 | 03 | 01 | - | - |
| | බැටළු | 02 | - | 24 | 28 | - | - |
| | කුකුල් | - | - | - | - | - | 579 |
| මහයාය | මී ගව | 01 | 67 | 46 | 26 | 02 | - |
| ඩේසිවැලි | එළගව | 01 | 03 | 05 | 02 | - | - |
| කොරෙයි | මී ගව | 01 | 15 | 13 | 21 | 02 | - |
| පාසිකුඩා | එළගව | 05 | 06 | 02 | 10 | 04 | - |
| | මී ගව | 01 | 01 | 08 | 08 | - | - |
| කොහොඹාන | මී ගව | - | 08 | 06 | 09 | - | - |

## ආදර්ශ පොල් උයන්වල වාර්ෂික ආදායම සහ වියදම - 2013

| ආදර්ශ පොල් උයන | පොල් ආදායම | බීජපොල් ආදායම | පොල් පැළ ආදායම | සත්ත්ව පාල ආදායම | අතුරු බෝග ආදායම | වෙනත් ආදායම | මුළු ආදායම | මුළු වියදම | 2013.12.31 දිනට ශුද්ධ ලාභය |
|---|---|---|---|---|---|---|---|---|---|
| මහයාය | 18,896,077.94 | **21,171,262.68** | 17,214,585.00 | 2,001,129.81 | 140,582.29 | 7,990,845.40 | **67,414,483.12** | 37,340,398.37 | 30,074,084.75 |
| බෝපිටිය | 10,009,776.19 | - | 17,324,100.00 | - | 145,296.00 | 965,117.51 | **28,444,289.70** | 18,300,250.54 | 10,144,039.16 |
| රන්දෙණිය | 5,975,782.87 | 4,110,864.92 | 19,236,100.00 | 122,662.00 | 100,459.00 | 899,315.05 | **30,445,183.84** | 29,628,171.22 | 817,012.62 |
| නාගන්සෝල | 5,342,215.48 | 3,242,651.32 | 10,528,050.00 | 1,049,806.00 | 50,485.00 | 206,701.02 | **20,419,908.82** | 21,597,815.57 | (1,177,906.75) |
| ගර්ට්ලන්ඩ් | 13,039,147.89 | 9,834,657.81 | 21,454,925.00 | 3,379,372.90 | 397,943.00 | 472,471.10 | **48,578,517.70** | 29,129,693.74 | 19,448,823.96 |
| ලේනව | 7,831,433.88 | 6,836,601.35 | 19,226,500.00 | 580,494.92 | 11,675.00 | 297,948.50 | **34,784,653.65** | 29,613,672.14 | 5,170,981.51 |
| කොරෙයි | 2,822,936.57 | 2,548,740.00 | 5,525,000.00 | 557,698.25 | 87,870.00 | - | **11,542,244.82** | 8,088,995.20 | 3,453,249.62 |
| ඩේසිවැලි | 11,843,373.86 | 12,584,120.51 | 9,465,375.00 | 113,019.87 | 54,645.00 | 22,306.88 | **34,082,841.12** | 27,656,084.80 | 6,426,756.32 |
| මුන්දලම | 1,146,972.70 | 463,418.86 | 1,285,475.00 | - | 17,490.00 | 4,941.32 | **2,918,297.88** | 3,731,094.08 | (812,796.20) |
| පාසිකුඩා | 1,873,388.30 | 1,341,000.00 | 8,806,225.00 | 124,624.00 | 11,260.00 | 1,771,994.70 | **13,928,492.00** | 10,605,078.66 | 3,323,413.34 |
| කොහොඹාන | 3,504,611.13 | 889,808.62 | 23,782,850.00 | 25,994.00 | 213,579.00 | 10,950.00 | **28,427,792.75** | 26,565,314.98 | 1,862,477.77 |
| පලෙයි | 1,201,696.88 | 665,395.00 | 10,336,875.00 | - | - | 27,718.03 | **12,231,684.91** | 12,913,534.44 | (681,849.53) |
| ප්‍රධාන කාර්යාලය | 6,000.00 | - | - | - | - | 6,439,328.77 | **6,445,328.77** | 34,240,888.68 | (27,795,559.91) |
| එකතුව | **83,493,413.69** | **63,688,521.07** | **164,186,060.00** | **7,954,801.75** | **1,231,284.29** | **19,109,638.28** | **339,663,719.08** | **289,410,992.42** | **50,252,726.66** |

2013 වර්ෂයේදී පොල් වගාකිරීමේ මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් අතරින් බෝපිටිය,ගර්ට්ලන්ඩ්, මහයාය හා කොහොඹාන ආදර්ශ පොල් උයන්වල පොල් යටි වගා වැඩසටහන ක්‍රියාත්මක කළ අතර පලෙයි ආදර්ශ පොල් උයනේ පොල් නව වගාව ආරම්භ කරන ලදී. පුරප්පාඩු සිටුවීම කොරෙයි හා පාසිකුඩා ආදර්ශ පොල් උයන් තුළ ක්‍රියාක්මක කරන ලදී.

## 4.1 වෙනත් ව්‍යාපෘතීන්

### රබර් වගාව

කුරුණෑගල ,බෝපිටිය පිහිටි බෝපිටිය ආදර්ශ පොල් උයනේ අක්කර 22 රූඩ් 03 ක් පුරා පැතිරුණු තද පාෂාණ සහිත භූමි භාගයක රබර් වගාවක් පවතී. එයින් කිරි කපන අක්කර ප්‍රමාණය අක්කර 05කි. 2013 වර්ෂයේ දී මෙම රබර් වගාවෙන් කිරි පයින්ට් 19620 ක් ලබාගෙන ඇති අතර, එයින් වියළි රබර් සීට් 5904 ක් නිෂ්පාදනය කර ඇත. ඒ අනුව මෙම වර්ෂයේ රබර් ආදායම රු: 753,908.18 කි.

### ආදර්ශ පොල් උයන්වල ඒකාබද්ධ කෘෂි වන වගා ව්‍යාපෘතිය

ගෝලීය හරිත ආවරනය පාලනය කිරීමේ ව්‍යාපෘති යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්වලද පෞද්ගලික අංශය හා ඒකාබද්ධව පොල් වගාව ආශ්‍රිතව කෘෂි වන වගා ඇතිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවා ඇත. මේ යටතේ 2013 වර්ෂයේ ක්‍රිස්ටල් ගාමන්ට් ආයතනය සමඟ එක්ව ගර්ට්ලන්ඩ් , පාසිකුඩා හා පලෙයි ආදර්ශ පොල් උයන්වල (අක්කර 35 ක පමණ) ග්ලිරිසිඩියා හා වන වගා ව්‍යාපෘති ආරම්භ කරන ලදී.



## කප්තුරුපාය

පොල් වගාව සම්බන්ධයෙන් අවශ්‍ය කරනු ලබන ශිල්පීය හා තාක්ෂණික දැනුම ලබාගැනීමට ආදර්ශ පොල් උයන් සඳහා පැමිණෙන පොල් වගාකරුවන් වෙත එම ශිල්පීය හා තාක්ෂණික දැනුම මෙන්ම ආදර්ශ පොල් උයන්වල නිෂ්පාදනය කරනු ලබන පොල් ආශ්‍රිත නිෂ්පාදන වන මුදවාපු කිරි, කුකුල් මස්, බිත්තර වැනි සත්ත්ව නිෂ්පාදන වර්ග, ආදර්ශ පොල් උයන්වල වගා කරන විශේෂ අතුරුබෝග වර්ග, කෙසෙල්, අන්නාසි වැනි පළතුරු වර්ග වඩාත් ලාභදායීව සහ පාරිභෝගිකයන්ගේ ආකර්ශණීය ආකාරයට මිළදී ගැනීමට මෙම කප්තුරුපාය වෙළඳසැල මගින් අවස්ථාව සලසා ඇත.

එසේම "කප්තුරුපාය" සංකල්පය තුළත් පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ.

1. ආදර්ශ පොල් උයන්වල නිෂ්පාදනය කරනු ලබන විවිධ නිෂ්පාදන අතරමැදියන්ගෙන් තොරව කෙලින්ම පාරිභෝගිකයන් වෙත ලබාදීම.
2. වගාකරුවන් වෙත අවශ්‍ය කරනු ලබන ශිල්පීය දැනුම සහ නවතම තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම.
3. පොල් ඉඩමක උපරිම ඵලදායිතාවය ලබා ගතහැකි ආකාරය පෙන්නුම් කරන ක්ෂේත්‍ර ආදර්ශණ පැවැත්වීම
4. පොල් වගාව සඳහා අවශ්‍ය කරනු ලබන සියළු රෝපණ ද්‍රව්‍ය විශ්වාසනීය ලෙස වගාකරුවන් වෙත ලබාදීම.
5. ආදර්ශ පොල් උයන් මගින් නිෂ්පාදනය කරන විවිධ බද්ධ පැළ ගොවීන් වෙත අඩු මිළට සහ විශ්වාසනීය ලෙස ලබාදීම.
6. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
7. සෘජු හා වක්‍ර රැකියා අවස්ථා බහුල කිරීම.

මේ යටතේ මහයාය ආදර්ශ පොල් උයනේ, මැදමුලන තවාන් පරිශ්‍රයේ හා බත්තරමුල්ල පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කර්යාලයේ "කප්තුරුපාය" වෙළඳ සැල් 03ක් දැනටමත් ආරම්භ කර ඇත. එහි 2013 වර්ෂයේ ආදායම් වියදම් විශ්ලේෂණය පහත දක්වා ඇත.

| | මුළු ආදායම | මුළු වියදම | ලාභය |
|---|---|---|---|
| **මහයාය** | 7,961,138.94 | 6,984,229.23 | 976,909.71 |
| **ප්‍රධාන කාර්යාලය** | 5,037,499.34 | 4,669,766.66 | 367,732.68 |
| **මැදමුලන** | 231,042.25 | 138,704.91 | 92,337.35 |

## පාසිකුඩා පොල් ආශ්‍රිත සංස්කෘතික උද්‍යානය

දිවයිනේ නැගෙනහිර පළාතේ පාසිකුඩා සංචාරක කලාපය දේශීය හා විදේශීය සංචාරකයන්ගේ ආකර්ශණයට ලක්ව ඇති සංචාරක කලාපයකි.
එම වෙරළ තීරයට යාබදව පිහිටා ඇති මණ්ඩලය මගින් පාලනය කරන පාසිකුඩා ආදර්ශ පොල් උයන දිවයිනේ පොල් ආශ්‍රිත සංචාරක ව්‍යාපෘතිය සඳහා සුදුසුම ස්ථානය ලෙස හඳුනාගෙන ඇත.
ඒ අනුව පාසිකුඩා සංචාරක තීරයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන්ගේ අවධානයට ලක්වන අයුරින් පාසිකුඩා පොල් ආශ්‍රිත සංස්කෘතික මධ්‍යස්ථානය ක්‍රියාත්මක කරනු ලබයි.




ඒ අනුව පොල් වගාව, පොල් වගාව ආශ්‍රිතව පවත්වාගෙන යා හැකි විවිධ එළවළු හා පළතුරු වැනි අතුරු වගාවන් වගා ඇති අතර, සංචාරක උද්‍යානයට පැමිණෙන සංචාරකයන් සඳහා ඔවුන්ගේ අවශ්‍යතා අනුව එම නිෂ්පාදන අලෙවි කිරීම ද සිදු කරනු ඇත.
එසේම පොල් ආශ්‍රිත කර්මාන්ත වශයෙන් පොල් මීරා නිෂ්පාදනය, කොහු කෙඳි නිෂ්පාදනය, පොල් තෙල් නිෂ්පාදනය වැනි සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රදර්ශණය කරන අතර, අදාල නිෂ්පාදන අලෙවි කිරීමද සිදු කරනු ඇත.

1. දේශීය හා විදේශීය සංචාරකයන් පොල් වගාව හා කර්මාන්තය කෙරෙහි ආකර්ශණය කරගැනීම.
2. පොල් වගාකරුවන්ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම.
3. ප්‍රදේශයේ තරුණයන් සඳහා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සැලසුම් කිරීම.
4. පාසිකුඩා ආදර්ශ පොල් උයන උපරිම ඵලදායීත්වයක් ලැබෙන අයුරින් සංවර්ධනය කිරීම.
5. පොල් ආශ්‍රිතව ආදායම් ලැබීමේ නව සංකල්පයන් හඳුන්වාදීම

මෙම ව්‍යාපෘතිය යටතේ විද්‍යාත්මක හා කෘෂිකාර්මික දැනුම මෙන්ම දේශීය සංස්කෘතිය විදහා දක්වන නැටුම් ගැයුම්වලින් පිරි විනෝදාත්මක වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ලැබේ.
දේශීය සංචාරකයන් සඳහා සහන මිළ ගණන් යටතේ නවාතැන් පහසුකම් සැපයීම සිදු කරන අතර, මේ වන විට සංචාරක බංගලා 04 ක් පවත්වාගෙන යනු ලැබේ.

| පාසිකුඩා සංචාරක නිවස්නයේ ආදායම | | |
|---|---|---|
| ආදායම රු. | වියදම රු. | ලාභය රු. |
| **1,752,329.00** | 751,849.00 | 1,000,479.99 |

### කුඹුරුප්පිඩි තවාගේ නිල නිවාසයේ වැඩ කටයුතු ආරම්භ කිරීම.

නැගෙනහිර පළාතේ, පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන කඩිනම් සංවර්ධන කාර්යයන්වල නියැලෙන ක්ෂේත්‍ර නිලධාරීන්ට නවාතැන් ගැනීම සඳහා සුදුසු ස්ථානයක් නොතිබූ අතර එම තත්වය අවබෝධ කර ගැනීමෙන් අනතුරුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය කාර්යාල භූමියේ මෙම නිළ නිවාසය ඉදිකෙරෙමින් පවතී.

### ආදර්ශ පොල් උයන්වල සියළුම කාර්ය මණ්ඩල සහ නේවාසික තවාන් භාර නිලධාරීන් සියළු දෙනාම ස්ථාන මාරු කිරීම.

මණ්ඩලය මඟින් පාලනය කරනු ලබන ආදර්ශ පොල් උයන්වල සහ පොල් පැළ තවාන්වල සේවයේ යොදවා සිටි සේවකයින්ගෙන් බහුතරය එකම ස්ථානයක දීර්ඝ කාලයක් සේවය කළ අය වේ. කළමනාකාරීත්වය විසින් මෙම තත්වය සඳහා මැදිහත්වීමෙන් පසුව සේවකයින්ගේ ද අභිමතය පරිදි වඩාත් කාර්යක්ෂම සේවාවක් ඉටු කිරීම සඳහාත්, නව මුහුණුවරකින් රාජකාරී ඉටු කිරීම සඳහාත් මෙම ස්ථාන මාරු කිරීම් ක්‍රියාත්මක කරනු ලැබීය.

### පාසිකුඩා සහ පලෙයි නව නිළධාරී නිවාස විවෘත කිරීම

උතුරු නැගෙනහිර පළාත්වල ක්ෂේත්‍ර රාජකාරීවල නියැලෙන, මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා නවාතැන් පහසුකම් සළසාදීම සඳහාත් යාපනය හා පාසිකුඩා වෙරළ තීරයට පිවිසෙන දේශීය සංචාරකයින් සඳහා සාධාරණ මිල ගණන් යටතේ විශ්වාසදායී නවාතැන් පහසුකම් සපයාදීම සඳහා මෙම නිල නිවස්න ඉදිකර ඇත.

### කතරගම නව නිලධාරී නිවස්නයේ ඉදිකිරීම් ආරම්භ කිරීම

මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය කාර්යාලයට නුදුරින් පිහිටා ඇති කතරගම ප්‍රදේශය දැනට පොල් වගාව අවම තත්වයක පවතින ප්‍රදේශයකි. මෙම තත්වය හඳුනාගැනීමෙන් පසු ඉදිරියේදී පොල් වගාව කඩිනමින් සංවර්ධනය කිරීම සඳහා සැළසුම් කර ඇත. ඒ අනුව අදාළ ක්ෂේත්‍ර රාජකාරීවල නියැලෙන ක්ෂේත්‍ර නිලධාරීන්ට නවාතැන් පහසුකම් සළසා ගැනීම සඳහාත් දේශීය සංචාරකයින්ට සහන මිලට නවාතැන් පහසුකම් සැළසීම සඳහාත් මෙම නිල නිවාසය ඉදිකිරීමට කටයුතු කර ඇත.



# 05 පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ කටයුතු

1971 අංක 46 දරණ පොල් සංවර්ධන ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ ඇති බලතල අනුව 1972 මාර්තු 03 වෙනි දින නිකුත් කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව පොල් වගා කිරීමේ මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර වඩාත් විධිමත්ව හා ඵලදායිතාවයෙන් යුක්තව සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය සහය අදාල අංශ වෙත ලබාදීම සඳහා පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය විසින් විධිමත් පරිදි මනා ලෙස මෙහෙයවනු ලබයි.

මෙම මණ්ඩලය ප්‍රාදේශීය කාර්යාල 18 ක්, පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන 03 ක්, මීගමුව බීජ නිෂ්පාදන ඒකකය, තවාන් 38 ක් හා ආදර්ශ පොල් උයන් 12 කින් සමන්විත වේ.

මෙම සියලු ආයතනවලට අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, උසස්කිරීම්, ස්ථානමාරු කිරීම්, පුහුණු කිරීම් ඇතුළු සියලු පරිපාලන කටයුතු, සුභ සාධන කටයුතු හා සංවර්ධන කටයුතු ද සේවක මණ්ඩල හැකියාවන් වර්ධනය කිරීම ද සේවක දිරි ගැන්වීමේ වැඩ සටහන් මෙහෙයවීම ද ඇතුළු සියළුම පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ කටයුතු පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය මඟින් සිදුකෙරේ.

2013 වර්ෂය තුලදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපති වශයෙන් සරත් කීර්තිරත්න මහතා කටයුතු කරන ලදී. මෙම වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08 ක් පවත්වා ඇත.

මෙම වර්ෂය තුලදී සාමාන්‍යාධිකාරී ලෙස ටී.වී.ඩී.ඩී.එස්. කරුණාරත්න මහත්මිය සේවය කරන ලදී.

# කාර්ය මණ්ඩල ව්‍යුහය

2013 වර්ෂය තුලදී මණ්ඩලයේ ඉලක්ක සපුරාගැනීම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය දායක වී ඇත.

| ජ්‍යෙෂ්ඨ කළමනාකාර | 05 |
|---|---|
| කළමනාකාර | 34 |
| කනිෂ්ඨ කළමනාකාර | 41 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණ) | 192 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) | 136 |
| ප්‍රාථමික ශ්‍රේණිය (ශිල්පීය) | 26 |
| ප්‍රාථමික ශ්‍රේණිය (ශිල්පීය නොවන) | 74 |
| දැනට තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන සේ පවතින තනතුරු | 06 |
| වතු පාලන සේවයේ සේවකයින් | 1021 |
| එකතුව | **1535** |

## බඳවා ගැනීම්

මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව මෙම වසර තුල පුරප්පාඩුව පැවති තනතුරු රාශියක් සඳහා බඳවා ගැනීමට කටයුතු සිදු කරන ලදී. ඒ අනුව 2013 වසර තුලදී නව පත්වීම් ලබාදුන් සංඛ්‍යාව, පත්වීම් භාරගත් සංඛ්‍යාව සහ පත්වීම් ලැබ සේවයට වාර්තාකල සංඛ්‍යාව පහත පරිදි වේ.



| තනතුර | පත්වීම් ලබාදුන් සංඛ්‍යාව | පත්වීම් ලබාගත් සංඛ්‍යාව | සේවයට වාර්තා කළ සංඛ්‍යාව |
|---|---|---|---|
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී** | 02 | 02 | 02 |
| **සහකාර සාමාන්‍යාධිකාරී** | 04 | 04 | 04 |
| **කළමනාකරු** | 07 | 07 | 07 |
| **විෂයානුබද්ධ විශේෂඥ** | 02 | 02 | 02 |
| **ප්‍රාදේශීය කළමනාකරු** | 14 | 14 | 14 |
| **ගිණුම් නිලධාරී** | 12 | 11 | 10 |
| **ගොවිපල සැලසුම් නිලධාරී** | 14 | 14 | 12 |
| **පොල් සංවර්ධන නිලධාරී** | 120 | 86 | 72 |
| **නේවාසික තවාන්භාර නිලධාරී** | 12 | 12 | 08 |
| **එකතුව** | **187** | **152** | **131** |

මෙම ලබාදුන් පත්වීම් අතුරින් නව බඳවා ගැනීම් 97 වන අතර අභ්‍යන්තර උසස්වීම් 34 ක් වේ.

### පුහුණු වැඩසටහන්

2013 වසරේ දී මණ්ඩලයේ විවිධ අංශවල සේවයේ නියුතු නිලධාරීන්ගේ අභිප්‍රේරණය හා ආකල්ප, කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් විවිධ ආයතනවලට නිලධාරීන් 17 දෙනෙකු පුහුණු පාඨමාලා /වැඩමුළු/ සම්මන්ත්‍රණ සඳහා යොමුකර ඇති අතර ඔවුන් විසින් එම පුහුණු වැඩසටහන් සාර්ථකව නිමාකර ඇත.

එමෙන්ම මෙම වසර තුල නව පත්වීම් ලැබූ පොල් සංවර්ධන නිලධාරීන් හා නේවාසික තවාන්භාර නිලධාරීන් හට ලුණුවිල පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික පුහුණුවක් ලබාදීමට කටයුතු කරන ලදී.

### සේවක ඉවත්වීම්

පෞද්ගලික හේතූන් මත 2013 වසරේ දී සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති) එක් අයෙකුත් රෝපණ ද්‍රව්‍ය හා නිෂ්පාදන සහකාරවරයෙකු, පොල් සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු සහ කළමනාකාර සහකාර දෙදෙනෙකු ද මණ්ඩලයේ සේවයෙන් ඉල්ලා අස්වී ඇත.

මණ්ඩලයේ අභිවෘද්ධිය සඳහා තම හැකියාවන් හා දක්ෂතාවයන් කැපකරමින් කාර්යක්ෂමව මනා සේවාවක් ඉටුකර වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා නිලධාරීන් / සේවකයින් 36 දෙනෙකු මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම ලබා ඇත. මෙම නිලධාරීන් / සේවකයින් හට හිමිවිය යුතු පාරිතෝෂික හා අනෙකුත් ප්‍රතිලාභයන් නියමිත කාලය තුලදී නොපමාව ඔවුන් වෙත ලබාදීමට පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය අදාල පියවර ගන්නා ලදී.

### ස්ථාන මාරු

ස්ථාන මාරු ලබාගැනීමට කැමැත්තක් දක්වන හා එකම සේවා ස්ථානයක දීර්ඝ කාලයක් සේවය කරනු ලබන නිලධාරීන් / සේවකයින් හට ස්ථාන මාරු අවස්ථාවක් ලබාදීමේ අරමුණු පෙරදැරිව පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය විසින් අනුගමනය කරන ක්‍රියාපරිපාටිය අනුව 2013 වසරේ දී ද ස්ථාන මාරු මණ්ඩලය මගින් අදාල කටයුතු කරන ලදී. ඒ අනුව වාර්ෂික ස්ථානමාරු මණ්ඩලය ගන්නා ලද තීරණ මෙන්ම සේවා අවශ්‍යතාවයන් හා සේවක අභියාචනා මත සහකාර ප්‍රාදේශීය කළමනාකරු(ව්‍යාප්ති) වරයෙකුට, පොල් සංවර්ධන නිලධාරීන් 89 කට, ක්ෂේත්‍ර නිලධාරීන් 02 කට, එක් කාර්යාල කාර්ය සහයකයෙකුට හා මුරකරුවෙකුට 2013 වසරේ දී ස්ථාන මාරු ලබාදී ඇත.

### ප්‍රවාහන සංචිතය

2013 වසරේ ක්‍රියාත්මක වූ ප්‍රවාහන සංචිතය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| මෝටර් රථ | - | 03 |
| ඩබල් කැබ් | - | 40 |
| ජීප් රථ | - | 05 |
| වෑන් රථ | - | 01 |
| ලොරි රථ | - | 17 |
| ත්‍රී රෝද රථ | - | 01 |
| ට්‍රැක්ටර් (රෝද 04) | - | 47 |
| ට්‍රැක්ටර් (රෝද 02) | - | 25 |
| ට්‍රැක්ටර් ට්‍රේලර් | - | 78 |
| යතුරු පැදි | - | 68 |
| බස් රථ | - | 04 |
| බැකෝයන්ත්‍ර | - | 02 |
| | | 291 |

මෙම මණ්ඩලය මගින් දැනට ආරම්භකර ඇති ව්‍යාප්ති හා සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් වාහන නොතිබුණු බැවින් 2013 වර්ෂයේ තිබුණු කැබ් රථ 34 ට අමතරව 2013 වර්ෂයේ නව කැබ් රථ 06 ක් ලබාගෙන අදාල සංවර්ධන කටයුතු සඳහා යොදවා ඇත.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සංවර්ධන කාර්යයන් සපුරා ගැනීම සඳහා ඉහත සඳහන් ප්‍රවාහන සංචිතය සතු සම්පත් අඩු පිරිවැයකින් පවත්වාගෙන යාමට පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය කටයුතු කර ඇත.




**පලෙයි ප්‍රදේශයේ ඉදිකෙරුණු නව නිලධාරී නිවස්නය ගරු ඇමතිතුමාගේ සුරතින් විවෘත කෙරුණු අවස්ථාව**

මේ අනුව පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය 2013 වර්ෂය තුල පවතින අවම සම්පත් උපරිම ලෙස කළමනාකරණය කරමින් මණ්ඩලයේ ප්‍රමුඛ කාර්යභාරය වන පොල් වගා ව්‍යාප්ත කරලීමේ කටයුත්ත සඳහා මනා සහයෝගයක් ලබාදීමට කටයුතු කර ඇත.



# 06. අභ්‍යන්තර විගණනය

## 6.1 අභ්‍යන්තර විගණනයේ අරමුණ

පොල් වගාකිරීමේ මණ්ඩලය ළඟා කර ගැනීමට අපේක්ෂිත දැක්ම, මෙහෙවර , පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා සංවිධානය කටයුතු කර තිබේද යන්නත් අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය වර්ෂය පුරා කාර්යක්ෂමව හා ඵලදායීව තිබේද යන්නත් වත්කම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදමින් ප්‍රාදේශීය ඒකක අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යන්නේ දැයි පිළිබඳවත් සිදුකරනු ලබන ඇගයීමක් ලෙස අර්ථකථනය කළ හැකිය.

## 6.2 මෙම වර්ෂය තුල සිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ

අභ්‍යන්තර විගණන විෂය පථයට අදාල කාර්යභාරය හා රාජකාරි ඉහල ගුණාත්මක තත්වයකින් හා අඛණ්ඩ පදනමක් මත 2013 වර්ෂය තුල ඉටුකර ඇත.එහිදී ආයතනය තුල ඵලදායී කාර්යසාධනය තහවුරු කිරීම සඳහා මූල්‍ය විගණනය,පද්ධති විශ්ලේෂණය,කාර්යසාධන විශ්ලේෂණය සහ විශේෂ විමර්ශන කෙරෙහි අවධානය යොමු කර ඇත.

ඒ අනුව 2013 වර්ෂය තුල දී මූලික විගණන සැලැස්මට අනුකූලව බොහෝ දුරට විගණනය කිරීමට උත්සාහ ගත් අතර ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් පොදු කාර්යාලයන් විගණනය කොට වැරදි හා අඩුපාඩු නිරීක්ෂණය කොට පෙන්වා දීමට හැකිවිය.

## 6.3 සාමාන්‍ය විගණන පරීක්ෂණ

### 6.3.1 ප්‍රධාන කාර්යාලයේ සිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ

ප්‍රධාන කාර්යාලයේ 971 ජංගම ගිණුම හා ප්‍රධාන මුදල් පොත ආශ්‍රිත ගනුදෙනු පරීක්ෂාව.
වසර 10 කට වඩා පැරණි වාහන සම්බන්ධ විගණන වාර්තාව.
ප්‍රධාන කාර්යාලයේ වැටුප් සම්බන්ධ විශේෂ විගණන පරීක්ෂණය.
ප්‍රධාන කාර්යාලයේ ගබඩාව සම්බන්ධ විගණන පරීක්ෂණය.
ප්‍රධාන කාර්යාලයේ සේවයට පැමිණීම සම්බන්ධ විගණන පරීක්ෂණය.
2013 පළමු කාර්තුවේ ප්‍රගතිය.
පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ස්ථාවර වත්කම් (වාහන) පිළිබද විගණන වාර්තාව.
අර්ථ සාධක අරමුදල් ගෙවීම සම්බන්ධව පරීක්ෂණ ( පරීක්ෂණ 62).
වාහන අලුත්වැඩියා සම්බන්ධ විගණන පරීක්ෂණය (ලේනව ආදර්ශ පොල් උයන).
සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය සම්බන්ධ විගණන පරීක්ෂණය .
ප්‍රධාන කාර්යාලයේ පොහොර මිලදී ගැනීම සම්බන්ධ විගණන පරීක්ෂණය.

අනුරාධපුර, ගාල්ල, රත්නපුර, හම්බන්තොට හා අම්පාර ප්‍රාදේශීය කාර්යාලයන් 05කත්, මහායාය, නාගන්සෝල, ලේනව, මුන්දලම, ගර්ට්ලන්ඩ්, කොහොඹාන, කොරෙයි හා ඩේසිවැලි යන ආදර්ශ පොල් උයන් 08කත් කළාවැව, මැදමුලන, මයුරපුර, අට්ටවිල්ලුව, ඇඹිලිපිටිය හා උහන යන තවාන් 06කත් විගණන පරීක්ෂණ සිදුකළ අතර පදවිය, රත්ගම, අම්බන්ගොඩ, ඇඹිලිපිටිය, ගොඩකවෙල, වලස්මුල්ල හා තිස්සමහාරාමය යන පොල් සංවර්ධන නිළධාරී කාර්යාල නිරීක්ෂණය කරන ලදී. ඊට අමතරව ගාල්ල හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශ තුල ක්ෂේත්‍ර පරීක්ෂාවන් 02ක් සිදුකරන ලදී.

ඒ හැර හදිසි හා විශේෂ පරීක්ෂණයන් කිහිපයක් ද කරන ලදී. ඒ සඳහා විශේෂයෙන් නම් කළ පැමිණිලි හෝ පෙත්සම් හෝ ගැටළු සහගත තත්වයන් පාදක වී ඇත.

1. කප්රුක පුරවර වැඩසටහන යටතේ, චක්‍රලේකයන්ට අනුකූලව ඉඩම් සඳහා ගෙවීම් නිර්දේශ කිරීම පිළිබඳව ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයට අයත් වැකේ පොල් සංවර්ධන නිලධාරී කාර්යාලයේ නිලධාරීන් දැනුවත් කිරීම
2. මාතලේ ප්‍රාදේශීය කාර්යාලයට අයත් හසලක ප්‍රදේශයේ ප්‍රජා පොල් පැළ තවානේ බීජ පොල් පැළවීමේ ප්‍රතිශතය අඩුවීම සම්බන්ධයෙන්, බීජ පොල් තේරීමේ සිට පෞද්ගලික තවානට බීජ පොල් ලබාදීමේ ක්‍රියාවලිය විධිමත්ව අධීක්ෂණය කරන ලෙස අදාළ නිළධාරීන්ට උපදෙස් ලබාදීම.
3. පොල් පැළ ප්‍රවාහනය සම්බන්ධයෙන් සිදුව ඇති ටෙන්ඩර් පටිපාටියේ සුළු අඩුපාඩු සම්බන්ධයෙන් රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ නිළධාරීන්ව දැනුවත් කිරීම.
4. කාර්යාලයීය ලිපි ලේඛණ හා තවානේ පාලන කටයුතු පිළිබඳව මැදමුලන පොල් පැළ තවානේ සිදුව ඇති විවිධ අඩුපාඩු සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සඳහා හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරීන්ව දැනුවත් කිරීම.

5. පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලයට අයත් මින්නේරිය ප්‍රජා පොල් පැළ තවානේ බීජ පොල් පැළවීමේ ප්‍රතිශතය අඩුවීම සම්බන්ධයෙන් බීජ පොල් තේරීමේ සිට පෞද්ගලික තවානට බීජ පොල් ලබාදීමේ ක්‍රියාවලිය විධිමත්ව අධීක්ෂණය කරන ලෙස අදාළ නිළධාරීන්ට උපදෙස් ලබාදීම.
6. පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලයට අයත් මැදිරිගිරිය ප්‍රදේශයේ පොල් පැළ තවානෙන් බීජ පොල් ප්‍රවාහන ගාස්තු සම්බන්ධ ක්‍රියාවලිය විධිමත් කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කිරීම.
7. යැපීම් දීමනා ගෙවීම සම්බන්ධයෙන් හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලයේ මතුව තිබූ ගැටළු සම්බන්ධයෙන් චක්‍ර ලේඛානුකූලව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදීම.
8. හලාවත වැව්ලි සමාගමෙන් පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යලය විසින් බීජ පොල් මිලදී ගැනීමේදී හටගෙන තිබූ ගිණුම්කරණ දෝෂයක් නිවැරදි කිරීමට කටයුතු කිරීම.

ඉහත සඳහන් ඒකකවල සිදුකරන ලද විගණන කටයුතුවලදී මූල්‍ය වංචා හෝ බරපතල ගණයේ විෂමාචාර ක්‍රියාවන් හෙළිදරවු නොවූ අතර , අනාවරණය වූ සාමාන්‍ය වැරදි හා අඩුපාඩු සභාපතිතුමා වෙත වාර්තා කර ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

## 6.4 විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම

**අරමුණු**

අභ්‍යන්තර හා බාහිර විගණනය මගින් හෙළිදරව් වන වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළමනාකාරීත්වය වෙත මග පෙන්වීමක් සිදු කිරීම හා මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය කාර්යක්ෂම හා ශක්තිමත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම විගණන කමිටු රැස්වීමේ ප්‍රධාන අරමුණවේ.

PED – 55 චක්‍ර ලේඛය අනුව විගණන කමිටු 04 ක් වත් පැවැත්විය යුතු අතර ඊට අනුකූලව මෙම වර්ෂය තුල විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.



**කමිටු සංයුතිය**

| | |
|---|---|
| සභාපති | - ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය |
| සාමාජික | - ඩී.එම්.එල්. බණ්ඩාරනායක මහතා, අතිරේක ලේකම්, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය |
| සාමාජික | - කේ.බී. ගුරුගේ මහතා, ප්‍රධාන ගණකාධිකාරී, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය |
| ලේකම්/කැඳවුම්කරු | - ටී.වී.ඩී.ඩී.එස්. කරුණාරත්න මිය, සාමාන්‍යාධිකාරී, පොල් වගාකිරීමේ මණ්ඩලය |
| නිරීක්ෂක | - ලලනි ගුණතිලක මිය, රජයේ විගණන අධිකාරී, රජයේ විගණන අංශය |
| පහසුකම් සැපයීම | - බී.ඒ.ඩබ්. බමුණුආරච්චි මයා, අභ්‍යන්තර විගණක, පොල් වගාකිරීමේ මණ්ඩලය |

අභ්‍යන්තර විගණන පරීක්ෂණ මගින් හෙළිදරව් වන වැරදි සහ අඩුපාඩු හා රජයේ විගණන අංශයේ විගණන විමසුම් ද විගණන කමිටුවේදී සාකච්ඡා කර අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසු එම වාර්තාව අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යැවේ.

## 6.5 ඉදිරි සැලසුම්

විවිධ මිලදී ගැනීම් සම්බන්ධව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට අවශ්‍ය පරීක්ෂණ සිදුකිරීම

ප්‍රධාන කාර්යාලයේ හා බාහිර ඒකකවලට හඳුන්වා දෙන පොදු ආකෘති පත්‍රවල වෙනස්කම් සම්බන්ධයෙන් විගණන පරීක්ෂණ සිදු කිරීම.

ආදර්ශ පොල් උයන්වල හා තවාන්වල ගස් සංගණන ලේඛණ, පොල් අස්වනු ලේඛණ,විවිධ ආදායම් ලේඛණ නඩත්තුව පිළිබඳව, සහ සත්ව පාලන ව්‍යාපෘති විගණනය සඳහා පරීක්ෂණ පුළුල් කිරීම.

පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ස්ථාවර වත්කම්(ඉඩම් හා ගොඩනැගිලි) පිළිබඳ විගණන පරීක්ෂණ සිදු කිරීම.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ අවසාන ගිණුම් කොටස් වශයෙන් විගණන කිරිම.



# 07. ගිණුම් ප්‍රකාශනය

පොල් වගා කිරිමේ මණ්ඩලයේ සමස්ථ කාර්යයන් 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ විධිවිධානයන්ට අනුකූලව හා නියමිත චක්‍රලේඛ, මුදල් රෙගුලාසි සහ පිළිගත් 2009 වසරේ නිකුත් කළ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව වාර්ෂික මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම, සැලසුම් කිරීම, මෙහෙය වීම, ලේඛණ ගත කිරීම සහ ආදාල අංශ වෙත වාර්තා කිරීම මූල්‍ය කළමණාකරණ අංශයේ ක්‍රියාදාමයි.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ)ගේ මෙහෙයවීමෙන් මූල්‍ය අංශයේ සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය) සහ ගිණුම් නිළධාරින් වශයෙන් සහායක කාර්ය මණ්ඩලය සමඟ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල තුළ මූල්‍ය කටයුතු මෙහෙයවීම සහ වාර්තා කිරීම සිදු වේ.
2013 වර්ෂය තුළ මණ්ඩලයේ පුනරාවර්ථන වියදම් සහ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 279.6 ක ප්‍රමාණයක් ද , පොල් සංවර්ධන කාර්යන් ඇතුළු අනෙකුත් සංවර්ධන කාර්යයන් සඳහා රුපියල් මිලියන 389.038 ක් මණ්ඩලය විසින් දරා ඇති අතර, වැලිගම කොළ මැලවීමේ රෝගය මැඩපැවැත්වීමේ කාර්යය සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 14.914 ක් මණ්ඩලය වෙත මෙම වර්ෂය තුළ ලැබී ඇත. මෙයට අමතරව මණ්ඩලයේ ආදර්ශ බීජ පොල් උයන් පාලනය මඟින් රුපියල් මිලියන 71.337 ශුද්ධ ලාභයක් උපයා ගෙන ඇති අතර, තවාන් පාලනයෙන් ලැබුණු ශුද්ධ ලාභය රුපියල් මිලියන 91.244 ක් සහ විවිධ ආදායම් රුපියල් මිලියන 20.191 ක් ද මණ්ඩලයේ සමස්ත ලැබීම්වලට ඇතුළත්ය.
මණ්ඩලයේ 2013 වර්ෂය තුළ දරණ ලද පුනරාවර්ථන වියදම රුපියල් මිලියන 379.103 වූ අතර, පොල් සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන සහනාධාර වටිනාකම රුපියල් මිලියන 647.673 කි. මෙම වර්ෂයේ ව්‍යාප්ති වැඩසටහන් සඳහා දරණ ලද මුළු මුදල රුපියල් මිලියන 35.866 ක් වූ අතර , කප්රුක ආයෝජණ ණය ක්‍රමය යටතේ වගාකරුවන් වෙත ගෙවන ලද පොලී සහන මුදල රුපියල් මිලියන 6.049 ක් විය. වර්ෂය අවසානයට මණ්ඩලයේ මුළු වත්කම්වල වටිනාකම රුපියල් මිලියන 1871.794 කි.

- 1 -

**පොල් වගාකිරීමේ මණ්ඩලය**

## 2013.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | | 2013 Rs. | | 2012 Rs. |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 02 | 380,060,559.71 | | 318,600,359.12 | |
| නොමිනි වැඩ | 03 | 31,996,700.68 | | 9,603,346.06 | |
| ආයෝජන (කෙටි කාලීන) | 04 | 11,958,823.00 | | 10,560,867.16 | |
| කප්රුක ප්‍රතිමූල්‍ය ආයෝජන(කෙටි) | 04 | 546,738,367.69 | | 501,225,132.44 | |
| විලම්භිත වියදම් | 05 | 233,377,068.58 | | 208,832,536.77 | |
| | | | **1,204,131,519.66** | | **1,048,822,241.55** |
| කල්බදු ඉඩම් | 06 | 5,433,408.79 | **5,433,408.79** | 5,580,257.68 | **5,580,257.68** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 07 | 408,253,095.86 | | 401,759,494.94 | |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 08 | 194,505,537.23 | | 204,518,007.69 | |
| ඉදිරියට කළ ගෙවීම් | 09 | 229,385.12 | | 1,609,134.68 | |
| තැන්පත් (කෙටි කාලීන) | 10 | 4,043,147.98 | | 1,940,902.98 | |
| ආයෝජන (කෙටි කාලීන) | 11 | 10,270,087.65 | | 403,733.36 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 12 | 59,418,259.88 | | 91,890,712.23 | |
| ජංගම ගිණුම | 13 | (14,490,272.38) | | (4,038,177.53) | |
| | | | **662,229,241.34** | | **698,083,808.35** |
| **මුළු වත්කම්** | | | **1,871,794,169.79** | | **1,752,486,307.58** |
| **අඩු කළා : වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු දෑ | 14 | 48,249,900.90 | | 29,152,496.17 | |
| උපචිත වියදම් | 15 | 41,899,079.35 | | 27,066,414.80 | |
| වෙන් කිරීම් කෙටි කාලීන | 16 | 5,602,602.00 | | 3,264,237.20 | |
| | | **95,751,582.25** | | **59,483,148.17** | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| වෙන් කිරීම් දිගු කාලීන | 16 | 197,601,944.72 | | 184,921,384.51 | |
| | | **197,601,944.72** | | **184,921,384.51** | |
| **මුළු වගකීම්** | | | **293,353,526.97** | | **244,404,532.68** |
| **මුළු ශුද්ධ වත්කම** | | | **1,578,440,642.82** | | **1,508,081,774.90** |
| **ශුද්ධ වත්කම්/ ද්‍රවශීලතාවය** | | | | | |
| **ඒකාබද්ධ අරමුදල** | | | | | |
| ප්‍රාග්ධන අරමුදල | 17 | 316,124,313.35 | | 320,935,189.75 | |
| පොදු අරමුදල | 18 | 476,339,169.93 | | 439,484,464.20 | |
| ප්‍රාග්ධන අරමුදල(කප්රුක) | 19 | 476,859,448.56 | | 439,302,677.32 | |
| කප්රුක ආයෝජන | 20 | 68,330,662.60 | **1,337,653,594.44** | 67,572,395.25 | **1,267,294,726.52** |
| **සංචිත** | | | | | |
| ප්‍රාග්ධන සංචිත | 21 | 67,545,410.98 | | 67,545,410.98 | |
| අයභාර සංචිත (අ.පො.උ) | 22 | 173,241,637.40 | | 173,241,637.40 | |
| | | | **240,787,048.38** | | **240,787,048.38** |
| **මුළු ශුද්ධ වත්කම්/ ද්‍රවශීලතාවය** | | | **1,578,440,642.82** | | **1,508,081,774.90** |

### පොල් වගාකිරීමේ මණ්ඩලය
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| | සටහන | | 2013 Rs. | | 2012 Rs. |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | | | |
| පුනරාවර්ථන වැය ප්‍රධාන | | | **279,600,000.00** | | **270,198,000.00** |
| ප්‍රාග්ධන වැය - ප්‍රධාන | | | **389,038,000.00** | | **214,620,000.00** |
| පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය - වැලිගම ව්‍යාපාතිය | | | **14,914,469.38** | | **6,308,476.10** |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - දිවිනැගුම | | | **220,779,850.00** | | **215,461,620.00** |
| පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය - කාබනික පොහොර සහනාධාරය | | | **8,676,611.00** | | - |
| UNDP ව්‍යාපෘතිය | | | - | | **239,640.00** |
| | | | **913,008,930.38** | | **706,827,736.10** |
| **වෙනත් ආදායම්** | | | | | |
| පොහොර ව්‍යාප්ති ආදායම් | 23 | 161,699.24 | | 1,236,868.36 | |
| තවාන් අංශයේ ආදායම් | 24 | 91,244,892.76 | | 67,863,491.12 | |
| විවිධ ආදායම් | 25 | 20,030,331.74 | | 26,361,334.38 | |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | 26 | 2,766,201.00 | | - | |
| ආදර්ශ පොල් උයන් ආදායම. | 27 | 71,337,032.15 | **185,540,156.89** | 124,352,387.23 | **219,814,081.09** |
| | | | **1,098,549,087.27** | | **926,641,817.19** |
| අඩු කළා:- සහනාධාර ගෙවීම් | 28 | | 647,673,289.09 | | 570,576,760.14 |
| | | | **450,875,798.18** | | **356,065,057.05** |
| **අඩු කළා: මෙහෙයුම් ගෙවීම්** | | | | | |
| සේවක පඩිනඩි | 29 | 228,454,036.05 | | 217,876,094.73 | |
| ගමන් වියදම් | 29 | 1,846,512.69 | | 1,948,625.07 | |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය වියදම් | 29 | 20,689,247.45 | | 20,222,476.70 | |
| නඩත්තු වියදම් | 29 | 15,453,807.13 | | 15,162,359.77 | |
| සැපයුම් වියදම් | 29 | 13,276,524.49 | | 11,140,548.06 | |
| ක්ෂය කිරීම් සහ වෙන් කිරීම් | 29 | 48,176,489.92 | | 41,663,343.57 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 29 | 51,206,418.54 | | 50,258,977.19 | |
| **මුළු මෙහෙයුම් වියදම** | | | **379,103,036.27** | | **358,272,425.09** |
| **මෙහෙයුම් කටයුතු වලින් ඉපයූ අතිරික්තය (ඌණතාවය) - 2013** | | | **71,772,761.91** | | **(2,207,368.04)** |

- 3 -

පොල් වගාකිරීමේ මණ්ඩලය

## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | | 2013 | | 2012 |
|---|---|---|---|---|
| | | රු. | | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | | | |
| වර්ෂයේ අතිරික්තය | | **71,772,762** | | **(2,207,368)** |
| **මුදල් නොවන ගණුදෙනු ගැලපීම** | | | | |
| වර්ෂයේ ක්ෂය වෙන් කිරීම් | 33,417,157 | | 27,563,548 | |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 37,845,329 | | 35,253,280 | |
| විගණන ගාස්තු වෙන් කිරීම් | 500,000 | | 500,000 | |
| වෙන් කිරීම් කම්කරු නඩු සඳහා | 2,077,245 | | - | |
| පොලි ආදායම් | (7,195,293) | | - | |
| වෙන් කිරීම් මුදල් පරිහරණ දිමනාව | 540,053 | | 500,000 | |
| දේපළ හා පිරියත විකුණුම් ලාභය | (2,766,201) | | - | |
| වෙන් කිරීම් වැඩුණු ගස් සඳහා ක්ෂය | 2,520,183 | | 2,045,658 | |
| බදු ඉඩම් සඳහා ලියා හැරීම් | 146,849 | | 146,849 | |
| ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් ක්ෂය ලියා හැරීම් | (13,987,377) | | | |
| වෙන් කිරීම් L.R.C. ඉඩම් සඳහා සහන බදු | 891,729 | **53,989,674** | 278,500 | **66,287,835** |
| | | **125,762,436** | | **64,080,467** |
| **පසුකාලීන අයිතමයන් ගැලපීම - පොදු ලෙජරය** | (36,268,056) | | (47,542,296) | |
| **කප්රුක ලේජරය** | (6,879,782) | **(43,147,838)** | 14,083 | **(47,528,213)** |
| **ගැලපීම** | | | | |
| මෙහෙයුම් ගිණුම කප්රුක (ඌණතාවය) | 39,287,054 | | 38,744,009 | |
| පොලි ආදායම් | (44,782,655) | | - | |
| ඇප ආවරණ අරමුදල (කප්රුක ) | 758,267 | **(4,737,334)** | 656,944 | **39,400,953** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | | **77,877,264** | | **55,953,207** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | | |
| තොග (වැඩිවීම)/ අඩු වීම | (6,493,601) | | (136,832,935) | |
| ණය ගැතියෝ (වැඩිවීම)/ අඩු වීම | 24,032,190 | | (38,621,423) | |
| තැන්පත් (වැඩිවීම)/ අඩු වීම | (2,102,245) | | - | |
| ජංගම ගිණුම් (වැඩිවීම)/ අඩු වීම | 10,452,095 | | 5,945,066 | |
| ආයෝජන (වැඩිවීම)/ අඩු වීම | (9,866,354) | | (19,705) | |
| බොල් ණය වෙන් කිරීම් (අඩු වීම) | 1,379,750 | | - | |
| ණය හිමියෝ (වැඩිවීම)/ අඩු වීම | 32,879,825 | **50,281,659** | 32,360,289 | **(137,168,708)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **128,158,923** | | **(81,215,501)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | | | |
| දේපළ මිලදී ගැනීම් වර්ධනය | (70,328,856) | | (81,777,629) | |
| දිගුකාලීන ආයෝජන අඩු වීම/ වැඩි වීම | (48,038,610) | | (34,717,821) | |
| පොලි ආදායම් අඩු වීම/ වැඩි වීම | 40,435,647 | | - | |
| දේපළ හා පිරියත විකුණුම් ආදායම | 2,766,225 | | - | |
| විලම්භිත වියදම් | (48,520,740) | | (69,924,210) | |
| නොනිම් වැඩ | (22,393,355) | **(146,079,689)** | (9,603,346) | **(196,023,006)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | **(17,920,766)** | | **(277,238,507)** |
| විගණන ගාස්තු ගෙවීම් | (620,418) | | (1,036,836) | |
| පාරි තෝෂිත ගෙවීම් | (25,164,769) | **(25,785,187)** | (34,234,748) | **(35,271,584)** |
| | | **43,705,952** | | **(312,510,091)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | | | |
| ප්‍රාග්ධන ප්‍රධාන - භාණ්ඩාගාර (කප්රුක) | 5,149,500 | | 7,400,000 | |
| ප්‍රාග්ධන ප්‍රධාන - භාණ්ඩාගාර | 6,084,000 | **11,233,500** | 36,380,000 | **43,780,000** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | | | |
| ශුද්ධ අඩුවීම් / වැඩිවීම් මුදල් හා මුදල් සමාන දෑ | | (32,472,452) | | (268,730,091) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 91,890,712 | | 360,620,803 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **59,418,260** | | **91,890,712** |

- 4 -

පොල් වගාකිරීමේ මණ්ඩලය

## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

| | ඒකාබද්ධ අරමුදල | ප්‍රාග්ධන අරමුදල | මාරුකළ සංචිත | එකතුව |
|---|---|---|---|---|
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,242,401,326 | 240,787,048 | - | 1,483,188,374 |
| ගිණුම් ප්‍රතිපත්තියේ වෙනස්වීම් | | | | - |
| සංශෝධන ශේෂය | | | | |
| | **1,242,401,326** | **240,787,048** | - | **1,483,188,374** |
| දේපළ ප්‍රත්‍යාගණනය කිරීමෙන් අතිරික්තය | - | - | - | - |
| අයෝජන ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඌණතාවය මුද | - | - | - | - |
| පරිවර්තනයේ වෙනස්කම් | - | - | - | - |
| | **1,242,401,326** | **240,787,048** | - | **1,483,188,374** |
| මුදල් කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා නොගත් | | | | - |
| ශුද්ධ ප්‍රතිලාභ හා පාඩු | 27,100,769 | - | - | **27,100,769** |
| | - | | | - |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ ඌණතාවය | (2,207,368) | - | - | **(2,207,368)** |
| | | | | - |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,267,294,727** | **240,787,048** | - | **1,508,081,775** |
| දේපළ ප්‍රත්‍යාගණනය කිරීමේ ඌණතාවය | - | - | - | - |
| ආයෝජන ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තය | - | - | - | - |
| මුදල් පරිවර්තනයේ වෙනස්කම් | - | - | - | - |
| | **1,267,294,727** | **240,787,048** | - | **1,508,081,775** |
| මුල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හඳුනා නොගත් | | | | |
| ශුද්ධ ප්‍රතිලාභ හා පාඩු | (1,413,894) | - | - | **(1,413,894)** |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය /ඌණතාවය | 71,772,762 | - | - | **71,772,762** |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,337,653,595** | **240,787,048** | - | **1,578,440,643** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. LP/K/CCB/1/13/04 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2014 දෙසැම්බර් 15 දින

සභාපති

පොල් වගාකිරීමේ මණ්ඩලය

**පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

-පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------

2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පොල් වගාකිරීමේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

2.2.1 ලැබිය යුතු ගිණුම්

---------------------

ජීප් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා සංස්ථාවකට රු.149,640 ක් 2005 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් ලබා දී තිබූ නමුත් එම සංස්ථාව වෙතින් අදාළ ජීප් රථයේ අලුත්වැඩියාව සිදුකරගෙන නොතිබුණි. කෙසේ නමුත් ලබා දී තිබූ අත්තිකාරම් ආපසු අයකර ගැනීමකින් තොරව අත්තිකාරම් ගිණුමේ තවදුරටත් පෙන්වා තිබුණි.

2

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.71,772,762 ක අතිරික්තයක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,207,368 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.73,980,130 ක වර්ධනයට සෙස් ප්‍රදානය රු.මිලියන 174 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.71,337,032 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඒ හා සසඳනවිට ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.124,352,387 ක් විය. ඒ අනුව ලාභයේ අඩුවීම රු.53,015,355 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ තවාන් ඒකකයේ රු.91,244,893 ක ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.67,863,491 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පොහොර ඒකකයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.161,699 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.1,236,868 ක් විය. ඉකුත් වර්ෂයට වඩා පොහොර අලෙවි ආදායම රු.මිලියන 1 කින් අඩුවීම මෙයට හේතු වී තිබුණි.

3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

(අ) බාහිර පුද්ගලයන් 07 දෙනෙකු විසින් එකතුව රු.13,664,405 ක වන්දි ඉල්ලා මණ්ඩලයට එරෙහිව අධිකරණවල නඩු 08 ක් පවරා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් බාහිර ආයතන හා පුද්ගලයන් 04 දෙනෙකුට එරෙහිව එකතුව රු.2,807,891 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 04 ක් පවරා තිබුණි.

3

**4. මෙහෙයුම් සමාලෝචනය**

4.1 කාර්යසාධනය

ව්‍යාප්ති හා සංවර්ධන අංශය, ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය, සැලසුම් අංශය, පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය සහ මූල්‍ය කළමනාකරණ අංශය යනුවෙන් පොල් වගා කිරීමේ මණ්ඩලය අංශ 05 කින් සමන්විත වේ.

සමාලෝචිත වර්ෂය තුළ එක් එක් කාර්යයන්ගේ ඉලක්ක සහ සපුරා ගැනීම් සාරාංශ කර පහත දැක්වේ.

(අ) සහනාධාර ගෙවීම්

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සහනාධාර වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කර තිබූ අතර, වර්ෂය අවසානයේදී සහනාධාර වැඩ සටහන් වල භෞතික ඉලක්කය හා ප්‍රගතිය පහත පරිදි විය.

(i) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ සහනාධාර වැඩසටහන් අතුරෙන් නාගරික ගෙවතු වගා වැඩසටහන හා කප්රුකයි පරපුරයි වැඩසටහන යන සහනාධාර වැඩසටහන් දෙක වර්ෂයේ අවසාන කාර්තු දෙක තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර, එම වැඩසටහන් දෙකට අදාලව පොල් පැල බෙදා දීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි. එහි භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 20 හා සියයට 6 ක් විය.

(ii) පවතින පොල් ඉඩම් වලින් වැඩි නිෂ්පාදනයක් ලබාගැනීම, පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ අරමුණ වූ අතර ඒ වෙනුවෙන් පාංශු ඛාදනය අඩු කිරීම, තෙතමන සංරක්ෂණය කිරීම, පාළු සිටුවීම වැනි කෘෂි විද්‍යාත්මක කටයුතු කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේදී පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් පාළු සිටුවීම සඳහා පොල් පැල බෙදාදීම පමණක් සිදුකර තිබුණි. මෙසේ පොල් පැල ලබාදීම තුළින් පමණක් පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම ප්‍රමාණවත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂයේදී ගවගාල් 250 කට සහනාධාර ලබාදීම සඳහා ඉලක්ක කර තිබුණත් සහනාධාර ලබා දී තිබුණේ ගවගාල් 128 කට පමණක් වීම නිසා එහි භෞතික ප්‍රගතිය සියයට 51 ක් විය.

(iv) සමාලෝචිත වර්ෂයේදී පොල් ඉඩම්වල නල ජල පද්ධති ඉදිකිරීමේ වැඩසටහන යටතේ අක්කර 1000 ක් වෙනුවෙන් සහනාධාර ලබාදීමට ඉලක්ක කර තිබුණත් සහනාධාර ලබා දී තිබුණේ අක්කර 510 කට පමණක් වීම නිසා එහි භෞතික ප්‍රගතිය සියයට 51 ක් විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ආ) ආදර්ශ පොල් උයන්

------------------------

සමාලෝචිත වර්ෂයේදී ආදර්ශ පොල් උයන් ලෙස වතු 12 ක් මණ්ඩලය විසින් කළමනාකරණය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ මුළු පොල් ඵලදාව ගෙඩි මිලියන 4.59 ක් විය. එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 38 ක පසුබෑමකි. මෙයට හේතුව ලෙස "වියළි අතරමැදි කලාපයේ පිහිටා ඇති ආදර්ශ පොල් උයන්වල අස්වනු අඩුවීමට ප්‍රධාන හේතුව අධික උෂ්ණත්වය හා දැඩි නියං සහිත කාලගුණ තත්ත්වය බව " සභාපතිවරයා දක්වා තිබුණි.

(ii) සාමාන්‍ය තත්ත්වයන් යටතේ පොල් වගා බිම් අක්කරයකින් වාර්ෂිකව අවම වශයෙන් පොල් ගෙඩි 4,500-5,000 ත් අතර ප්‍රමාණයකින් පොල් ඵලදාවක් ලබා ගතහැකි වුවත් සමස්ථයක් ලෙස මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් වලින් මහයාය පොල් උයන හැර අනෙකුත් සියළුම ආදර්ශ උයන්වල ඵලදාව එම සාමාන්‍ය මට්ටමවත් ළඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(iii) ආදර්ශ පොල් උයන් ලෙස නඩත්තු කරන පොල් වතු 12 න් පොල් උයන් 04 ක් හැර අනෙකුත් පොල් වතු වල ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි 50 කට වඩා අඩු අගයන් ගෙන තිබුණි.

(iv) ආදර්ශ පොල් උයන් 08 ක වැටුණු පොල් ප්‍රතිශතය සියයට 30 සිට සියයට 41 දක්වා පරාසයක විය.

(v) සමස්ථයක් ලෙස ආදර්ශ පොල් උයන්හි ඇස්තමේන්තුගත පොල් ඵලදාව ගෙඩි මිලියන 6.57 ක් විය යුතුව තිබූ නමුත් සත්‍ය පොල් ඵලදාව ගෙඩි මිලියන 4.59 ක් වී තිබුණි. ඒ අනුව විචලනය ගෙඩි මිලියන 1.97 ක් එනම් සියයට 30 ක් විය. මෙසේ ආදර්ශ පොල් උයන්හි ඇස්තමේන්තුගත හා සත්‍ය පොල් ඵලදාව අතර ඉහළ විචලනයක් පැවතීමෙන් පොල් ඵලදා සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීම නිසි පරිදි සිදුවී නොතිබුණු බව නිරීක්ෂණය කරනු ලැබේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඇ) වතු කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වතුවල ප්‍රගතිය විමර්ශනය කිරීම සඳහා වූ ජාලගත තොරතුරු පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේදී වතු කළමනාකරුගේ මුර පදය භාවිතා කරමින් වතු කළමනාකරු හෝ ඔහුගේ යටත් නිලධාරීන් විසින් අදාළ දත්ත පද්ධතියට ඇතුළත් කර තිබූ අතර, එහිදී ජාලයට ප්‍රවේශවීම සටහන් කරන ලේඛනයක් පවත්වා නොගැනීම හා මෙම දත්ත වෙනමම සටහන් කර තබාගැනීමේ ක්‍රමවේදයක් නොතිබීම නිසා තොරතුරු වල විශ්වාසදායී බව හා එහි වගකීම පැවරීම සම්බන්ධයෙන් ගැටලු ඇතිවිය හැකිව තිබුණි.

(ii) ආදර්ශ පොල් උයන්හි භූමිය ක්ෂේත්‍ර වලට වෙන්කර එසේ වෙන්කරන ලද කොටස එක් එක් ක්ෂේත්‍ර නිලධාරීන්ට පවරා තිබුණි. ඒ අනුව නිලධාරීන් දෛනිකව එම කොටස තුළ සිදුකරනු ලබන කාර්යයන් ක්ෂේත්‍ර පොතෙහි සටහන් කළයුතු අතර, එය වතු කළමනාකරුගේ අධීක්ෂණයට යොමුවිය යුතුය. කෙසේ නමුත් ක්ෂේත්‍ර නිළධාරීන් විසින් දෛනිකව නිසි පරිදි ක්ෂේත්‍ර පොත් නඩත්තු කර නොතිබූ අතර, එය වතු කළමනාකරුගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි.

(ඈ) පොල් වගාව සඳහා ඉඩම් යෝග්‍යතා වර්ගීකරණය

මණ්ඩලය සතු ආදර්ශ පොල් වගාව සඳහා ඉඩම් යෝග්‍යතා වර්ගීකරණයක් සිදුකර නොතිබුණු අතර, මේ නිසා උපරිම ඵලදාවක් ලබාගැනීමට අනුගමනය කළයුතුවන උපක්‍රමයන් නිවැරදිව හඳුනාගැනීමේ ගැටලුද, පොල් ඵලදාව නිවැරදිව ඇස්තමේන්තු කිරීමට මගපෙන්වීමක් ලබාගැනීමටද නොහැකිවී තිබුණි.

(ඉ) ආදර්ශ පොල් උයන්හි මයිටා හානිය පාලනය

පොල් මයිටා මර්දනය කිරීමේ අන්තර් නිර්දේශයන් හැරුණුවිට තිරසාර ජෛව විද්‍යාත්මක ක්‍රමයක් ලෙස විලෝපිත මයිටාව පොල් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වා දී තිබූ අතර, මණ්ඩලය විලෝපිත මයිටා මධ්‍යස්ථාන 07 ක් පවත්වාගෙන ගොස් තිබුණි. කෙසේ වුවද මණ්ඩලය පවත්වාගෙන යන ආදර්ශ පොල් උයන් 12 හි කලටි/කුරුවල්/කුඩා ගෙඩි ප්‍රමාණයන් ඉහළ යාමට මයිටා හානිය බෙහෙවින් බලපා තිබුණි.

6

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

4.2.1 අරමුදල් ආයෝජනය

මණ්ඩලය විසින් රු.20,000,000 ක මුදලක් 2011 වර්ෂයේදීත් රු.24,000,000 ක මුදලක් 2012 වර්ෂයේදීත් සත්දින තැන්පතුවල ආයෝජනය කර තිබුණි. 2011 වර්ෂයේ ආයෝජිත රු.20,000,000 ක් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලබාගෙන තිබුණි. මෙසේ රු.මිලියන 44 ක මුදලක් කෙටිකාලීන තැන්පත්වල වසර 02 කට ආසන්න කාලයක් ආයෝජනය කිරීම නිසා දිගුකාලීනව ආයෝජනය කිරීමෙන් ලබාගත හැකිව තිබූ පොළී ආදායමක් මණ්ඩලයට අහිමි වී ගොස් තිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ත්‍රිකුණාමලය හා පාසිකුඩා නිලධාරී නිල නිවාස ඉදිකළ ආයතන විසින් වැට් බදු සහිත බිල්පත් ඉදිරිපත් කර නොතිබියදී, මණ්ඩලය එම ආයතන වෙත රු.905,031 ක වැට් බදු ද ඇතුළත් කර ගෙවීම් කර තිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 925 ක් වූ අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 580 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන අනුමත තෘතීයික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ තනතුරු පිළිවෙලින් 10 ක් හා 283 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 52 ක්ද පුරප්පාඩුව පැවතිණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මානව සම්පත් කළමනාකරණය

(ඇ) තවාන් කළමනාකරණය

(ඈ) වතු කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

7

**පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු සඳහා පිළිතුරු වාර්තාව**

**2.2.1. ලැබිය යුතු ගිණුම්**

අංක 31 – 9900 දරණ ජීප් රථය අළුත්වැඩියා කටයුතු සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට අයත් ගරාජය වෙත යොමු කර තිබුණි. එම යොමු කිරීමත් සමඟ ඔවුන්ගේ ඉල්ලීම පරිදි මුළු ඇස්තමේන්තුව වූ රු: 199520 /- ක වටිනාකමින් 75% ක අත්තිකාරම් ලෙස රු: 149640 ක් චෙක්පත් මගින් ගෙවීම් කර ඇත.

මෙම අළුත්වැඩියා කටයුතු නිසි පරිදි සිදු නොවීම හේතුවෙන් අදාළ වාහනයේ අවශ්‍යතාව මත සහ වාහනයේ ආරක්‍ෂාව යන කරුණු පදනම් කරගෙන මෙම වාහනය මණ්ඩලයට ආපසු රැගෙන එන ලදී. එම රැගෙන එන විට ඉටුකර තිබුණු අළුත්වැඩියා කටයුතුවල වටිනාකමරු: 89550/- ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව ගෙවා තිබුණු අත්තිකාරම් මුදලින් තවදුරටත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් අය විය යුතු මුදල රු: 60090/- ක් විය. මෙම ගනුදෙනුව රාජ්‍ය ආයතන දෙකක් තුළ සිදු වී ඇති බැවින්, නීති උපදෙස් ලබාගැනීමෙන් පසු ඉ දිරි කටයුතු සඳහා යොමු කිරීමට තීරණය කර ඇත.

**3.3. ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

මෙම සියළු නඩු දැනට විභාග වෙමින් පවති අතර, එම තීරණ අනුව ඉදිරියේදී කටයුතු කිරීම සඳහා මණ්ඩලය විසින් කටයුතු කරනු ඇත.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

**(අ). සහනාධාර ගෙවීම්.**

**i කප්රුකයි පරපුරයි වැඩසටහන**

2013 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වලින් බොහෝමයක භෞතික ප්‍රගතිය 100% ඉක්මවා තිබිණි. කප්රුකයි පරපුරයි වැඩසටහන නව වැඩසටහනක් වූ අතර මෙම වැඩසටහන ආරම්භ වූයේ 2013 වර්ෂයේ අවසාන කාර්තුවේය. එය එම වැඩසටහනේ ප්‍රගතියට බලපාන ලදි.තවද කප්රුකයි පරපුරයි වැඩසටහන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා එක්ව ක්‍රියාත්මක කරන වැඩසටහනක් වූ බැවින් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය ලේකම්වරුන්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්, පලාත් සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය නිළධාරින්,පවුල් සෞඛ්‍ය සේවා නිළධාරින් දැනුවත් කර ඔවුන්ගේද සම්බන්ධීකරණ ඇතුව ක්‍රියාත්මක කළ යුතු විය. අන්තර් අමාත්‍යාංශ වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ බැවින් මෙම වැඩසටහන සම්බන්ධීකරණය කිරීමේ දී විවිධ ප්‍රායෝගික ගැටලුකාරී තත්ත්වයන්

ඇති විය. කෙසේ වුව ද 2014 වර්ෂයේ දී විවිධ ක්‍රමවේද උපයෝගි කර ගැනීම මඟින් මෙම වැඩසටහනේ ප්‍රගතිය 45% දක්වා ඉහළ අගයකට ගෙන ඇත.

ii **නාගරික ගෙවතු වගා වැඩසටහන**

නාගරික ගෙවතු වගා වැඩසටහන ද නව වැඩසටහනක් වූ අතර එය ආරම්භ වුයේ 2013 වසරේ අවසාන කාර්තුවේදීය. එය එම වැඩසටහනේ ප්‍රගතිය අඩු වීමට බලපාන ලදි. තවද 2013 වසරේ දී නාගරික ගෙවතු වගා වැඩසටහන ආරම්භ වුයේ කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමේ අරමුණින්ය. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ද පළාත්පාලන ආයතන දැනුවත් කර එම ආයතනවලද සම්බන්ධීකරණයෙන් හා සහයෝගයෙන් ක්‍රියාත්මක කළ යුතු විය. අන්තර් ආයතන සම්බන්ධීකරණයේ දී ඇති වූ ප්‍රායෝගික ගැටලු නිසා ද මෙම වැඩසටහනේ ප්‍රගතිය අඩු විය. කෙසේ වෙතත් 2014 වසරේ දී මෙම වැඩසටහනට අදාළ ප්‍රගතිය 184% ඉහළ අගයක් වාර්තා කර ඇත.

iii කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව කප්රුක නවෝදය සංයුක්ත සැලැස්ම සකස් කර ඇත. මෙම සැලැස්ම අනුව පොල් ඉඩමක තිබිය යුතු ප්‍රශස්ථ පොල් ගස් ගණන නඩත්තු කිරීම වැදගත් කරුණක් ලෙස හඳුනාගෙන ඇත. පොල් ඉඩමක කළයුතු පුනරුත්ථාපන කටයුතු අතරින් පාළු සිටුවීම අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුත්තක් වන අතර, එමඟින් පොල් ඉඩම් ඵලදායිතාව වැඩි කළ හැක. ඒ අනුව 2013 වසරේදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන සහනාධාරයේදී පාළු පැළ සිටුවීමේ පුනරුත්ථාපන ක්‍රමවේදයට ප්‍රමුඛත්වයක් ලබාදෙන ලදී. කෙසේ වෙතත් 2013 වසරේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති වැඩ සටහන් මඟින් අනිකුත් පුනරුත්ථාපන කටයුතු පිළිබඳවද වගාකරුවන් දැනුවත් කර, ඒ සඳහා උනන්දු කරන ලදී.

Iv 2013 වසරේ දී ගවගාල් සහනාධාර යටතේ භෞතිකව ගවගාල් 214 ක් ඉදිකර ඇත. එයින් ගවගාල් 128 කට පමණක් සහනාධාර මුදල් ගෙවා ඇත. ඉතිරි ගවගාල් 86 ඉදිකර අවසන් බව 2013 වසරේ අවසන් කාලයේදී වගාකරුවන් විසින් දැනුම් දුන් බැවින්, ඒ සඳහා ගෙවීම් සිදු කිරීමට

ප්‍රමාණවත් කාලයක් නොතිබිණි. එම ගවගාල් සඳහා මුදල් ගෙවීම 2014 වසරේ මුල් කාර්තුවේ දී අවසන් කරන ලදී. ඒ අනුව 2013 වසරේ ගවගාල් සහනාධාර වැඩ සටහනේ භෞතික ප්‍රගතිය 214 ක් විය යුතු වේ.

V 2013 වසරේ දී භෞතිකව පොල් ඉඩම් අක්කර 1088 ක ජල නල සම්පාදන පද්ධති ඉදිකරනු ලැබු නමුත් වසරේ අවසාන කාර්තුවේ දී ප්‍රතිපාදන සීමා වීම මත අක්කර 510 ක් සඳහා පමණක් සහනාධාර ගෙවන ලදී. කෙසේ වෙතත් 2014 පළමු කාර්තුවේ දී ඉතිරි සහනාධාර මුදල් ගෙවා නිම කරන ලදි.

(ආ) ආදර්ශ පොල් උයන්

i මණ්ඩලයේ ආදර්ශ බීජ පොල් උයන් වලින් පොල් උයන් 7 ක් පිහිටා ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මෙම ඉඩම් පිහිටි ප්‍රදේශ වියළි අතරමැදි කලාපයට අයත්ය. අනෙක් වතු 5 පිහිටා ඇත්තේ පුත්තලම, මඩකළපුව, අම්පාර සහ යාපනය ප්‍රදේශයේය. මෙම ප්‍රදේශවලට පසුගිය වර්ෂයේ බලපෑ වැසි රහිත කාළගුණ තත්ත්වය හේතුවෙන් සමාලෝචන වර්ෂයේ පොල් එලදාව අඩුවීමක් සිදුවිය. සමස්ථයක් ලෙස සලකනවිට මෙම වර්ෂයේදී දිවයිනේ සමස්ථ පොල් එලදාව පහත වැටී තිබුනු අතර, මෙමම මණ්ඩලයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පවතින පුද්ගලික හා රාජ්‍ය වතු වලද මෙම අනුපාතයට ආසන්න අගයකින් පොල් එලදාව අඩු වී ඇත.

ii පොල් පර්යේෂණ ආයතනය විසින් නිකුත් කර ඇති “ පොල් වගාව සඳහා පොහොර භාවිතය සහ ඉඩම් යෝග්‍යතාවය “ යන ප්‍රකාශනයේ පොල් වගාව සඳහා ඉඩම් යෝග්‍යතාව අනුව $S_1$ සිට $S_5$ පාංශු කාණ්ඩ 5 කට වර්ගීකරණය කර ඇත. මෙම වර්ගීකරණය අනුව ඒ ඒ කාණ්ඩවලට අයත් හොඳින් නඩත්තු කරන ලද ඉඩම්වල පොල් එලදාව දක්වා ඇත. එම වර්ගීකරණය අනුව මණ්ඩලය විසින් පාලනය කරනු ලබන පොල් ඉඩම් අයත් කාණ්ඩ පහත සඳහන් පරිදි වේ.

| ඉඩම් පංතිය | විභව ඵලදාව අක්කරයට ගෙඩි | ඒ් ඒ් කාණ්ඩවලට අදාළ මණ්ඩලයේ වතු පිහිටීම | පොල් වගා බිම් ප්‍රමාණය |
|---|---|---|---|
| $S_1$ | 6000 ට වැඩි | - | - |
| $S_2$ | 5000 – 6000 | - | - |
| $S_3$ | 4000 – 5000 | මහයාය, ඩේසිවැලි, බෝපිටිය | 723.26 |
| $S_4$ | 2000 – 4000 | කොරෙයි, පාසිකුඩා, පලෙයි, කොහොඹාන, ගර්ට්ලන්ඩ්, මුන්දලම, රන්දෙණිය, ලේනව, නාගන්සෝල | 2633.3 |
| $S_5$ | 1000 - 2000 | - | - |

මෙම වගුව අනුව මණ්ඩලය විසින් පාලනය වන සියළුම වතු පිහිටා ඇත්තේ අක්කරයට ගෙඩි 2000 – 5000 ත් අතර ප්‍රමාණයක් ලැබෙන $S_3$ - $S_4$ යන ඉඩම් ප්‍රදේශවලය. ඒ අනුව මණ්ඩලය විසින් දැනට ලබන පොල් ඵලදාව සාමාන්‍ය මට්ටමක පවතින අතර, දැනට ක්‍රියාත්මක කරන විශේෂිත සංවර්ධන ක්‍රම හේතුවෙන් ඉදිරි වර්ෂ වලදී මෙම පොල් ඵලදා ප්‍රමාණය ප්‍රසස්ථ මට්ටමක පවත්වා ගැනීමට බලාපොරොත්තු වේ.

iii 2013 වර්ෂයේදී සහ 2012 වර්ෂයේ අවසාන භාගයේ පැවති දැඩි නියඟය හේතුවෙන් දිවයිනේ සමස්ථ පොල් ඵලදාවේ පසුබෑමක් සිදු විය. විශේෂයෙන්ම මෙම නියඟය දැඩිව බලපෑ මණ්ඩලයේ වියලි ප්‍රදේශවල පිහිටි පාසිකුඩා, කොරෙයි, කොහොඹාන සහ පලෙයි වැනි වතුවලද, රන්දෙණිය, ලේනව, නාගන්සෝල යන වතුවලද මෙම වර්ෂයේදී පැවති නියං තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය පොල් ඵලදාව ලබා ගැනීම අපහසු විය. ඉදිරි වර්ෂවලදී මෙම ප්‍රසස්ථ මට්ටම පවත්වා ගැනීම සඳහා දැනට විධිවිධාන යොදා ඇත.

iv වැටුනු පොල් ප්‍රතිශතය වැඩිවීම හේතු කීපයක් නිසා සිදු වේ.

යටිවගා පවතින ක්ෂේත්‍රවල උසින් වැඩි ගස් පැවතීම හේතුවෙන් එම ගස්වල පොල් කැඩීම සඳහා කෙකි යොදා ගැනීම අපහසු වීම හා ගසට නැඟ පොල් කැඩීමෙන් ලැබෙන ආයදම සමඟ සැසඳීමේදී වාසිදායක නොවීම.

අධික නියං පවති කාලවල සමහර පොල් ගස් වල සාමාන්‍ය කාලයට පෙර පොල් වැටීමට පටන් ගැනීම.

වැටුනු පොල් සියල්ල නිසි ක්‍රමවේද අනුගමනය කර එක්රැස් කිරීමේ වැඩි පිළිවෙලක් යොදා තිබීම.

කෙසේ වෙතත් මෙම වැටුනු පොල් ප්‍රතිශතය අඩු මට්ටමක තබා හැනීම සඳහා මාසිකව පොල් කැඩීම, ඵලදාව වැඩි උස ගස්වලට නැග ඵලදාව නෙලීමට කටයුතු කිරීම වැනි ක්‍රමවේද යොදා ඇති බැවින්, ඉදිරි වැටුනු පොල් ඵලදා ප්‍රතිශතය අඩු කර ගැනීමට කටයුතු කර ඇත.

V 2010, 2011, 2012 යන වර්ෂවල සත්‍ය පොල් ඵලදාව පිළිවෙලින් ගෙඩි මිලියන 5.93, 6.33, 7.31 ක් ලෙස සාමාන්‍ය වර්ධනයක් සහිත අගයක් විය. මෙම දත්ත සමඟ සංසන්දනය කර 2012 වර්ෂයේ පැවති නියං තත්ත්වයද සැළකිල්ලිට ගෙන 2013 වර්ෂයේදී පොල් ඵලදාව ගෙඩි මිලියන 6.37 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. නමුත් බලාපොරොත්තු නොවූ ආකාරයට අසාමාන්‍ය ලෙස රටේ පොල් ඵලදාව විශාල ලෙස පහත වැටීම නිසා මණ්ඩලයටද බලාපොරොත්තු වූ ඇස්තමේන්තු ඵලදාව ලබා ගැනීමට නොහැකි විය.

4.1.(ඇ). වතු කළමණාකරණය

(1). පොල් වතු කළමණාකරණ ජාලගත මෙහෙයුම් පද්ධතියට දත්ත ඇතුලත් කිරීම සඳහා ජාලයට ප්‍රවේශවීමට එක් එක් ආදර්ශ පොල් උයනට වෙන වෙනම මුර පද ලබා දී ඇත. එක් ආදර්ශ පොල් උයනක ජාලයට ප්‍රවේශ වනු ලබන්නේ, කළමණාකරු හෝ ඔහු විසින් නම්කර ඇති එක් නිලධාරියෙකු පමණක් වන අතර, ඒ පිළිබඳ සම්පූර්ණ වගකීම කළමණාකරු සතුවේ. ඕනැම ආදර්ශ පොල් උයනක් මෙම ජාලයට ප්‍රවේශ වන සැම අවස්ථාවකම ජාලයට ප්‍රවේශ වී ඇත්තේ කවුරුන්ද යන්න පිළිබඳව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන

අමාත්‍යාංශයට නිරීක්ෂණය කිරීමේ හැකියාව පවතී. අවශ්‍යතාවයක් වුවහොත් අමාත්‍යාංශය මගින් එම තොරතුරු ආයතන ප්‍රධානියාට ලබාගත හැක. එසේ වුවද, මේ සඳහා වෙනම ලේඛනයක් නඩත්තු නඩත්තු කළයුතු බවට ආදර්ශ පොල් උයන් කළමණාකරුවන් වෙත උපදෙස් ලබාදී ඇත.

මේ වන විට පොල් වතු කළමණාකරණ ජාලගත මෙහෙයුම් පද්ධතියට ඇතුලත් කරන දත්ත සම්බන්ධයෙන් ආදර්ශ පොල් උයන්වල ලේඛන නඩත්තු කරනු ලබයි. අදාළ ආදර්ශ පොල් උයන් කළමණාකරු විසින් ජාලගත මෙහෙයුම් පද්ධතිය හා එම ලේඛන සංසන්දනය කිරීම සිදු කර නිවැරදි බවට සහතික කිරිම සිදු කෙරේ.

(2) සියලු ආදර්ශ පොල් උයන්වල සේවය කරන කාර්ය මණ්ඩලයේ දෛනිකව නඩත්තු කළයුතු ක්ෂේත්‍ර සටහන් යාවත්කාලීන කිරීමට සියලු ආදර්ශ පොල් උයන් භාර කළමණාකරුවන් වෙත දැනුම් දී ඇති අතර, අදාල ක්ෂේත්‍ර සටහන් පොත් පරීක්ෂා කිරීම කළමණාකරුගේ වගකීම බවද වැඩිදුරටත් චක්‍රලේඛ උපදෙස් මගින් ලබා දී ඇති අතර, එය නිවැරදිව සිදුවන්නේද යන්න පසුවිපරම් කිරීම මේ වන විට සිදුවෙමින් පවතී

4.1.(ඇ). පොල් වගාව සඳහා ඉඩම් යෝග්‍යතා වර්ගීකරණය.

මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් 12 ට අදාළව පාංශු ශ්‍රේණි හඳුනාගෙන ඇති අතර, විශ්ලේෂණාත්මක පාංශු සමීක්ෂණයක් සිදුකර දෙන ලෙස පොල් පර්යේෂණ ආයතනය වෙත දැනුම් දී ඇති අතර, ඒ අනුව දැනට පාංශු වර්ගීකරණ කටයුතු සිදුකරනු ලබන බව දන්වා සිටිමි.

පාංශු යෝග්‍යතා වර්ගීකරණය සිදු කර නොතිබුනද, ආදර්ශ පොල් උයන් සඳහා පොහොර යෙදීම සිදුකරනු ලබන්නේ, පොල් පර්යේෂණ ආයතනය මගින් සිදුකරන ලද ආන්තරික පොහොර නිර්දේශය (D. F. R. ) පදනම් කොට ගෙනය. එසේම පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයන්වලට අනුව සියලු කෘෂිකාර්මික කටයුතු තෙතමන සංරක්ෂණ කටයුතු, සමෝච්ඡ කාණු, වසුන්, අතුරුවගා ආදිය, සිදුකරනු ලබයි.

පොල් වගාකිරීමේ ආදර්ශ පොල් උයන්වල අස්වැන්න ඇස්තමේන්තු කරනුයේ, පසුගිය වසර 05 ක පොල් අස්වැන්නේ සාමාන්‍ය අගය හා පසුගිය වසරවල වර්ෂාපතනය, වර්ෂාපතන දින ගණන, පැළ වගාවල අස්වැන්න යන මූලික කරුණු පදනම් කරගෙනය. කෙසේ වුවද, කෘෂිකාර්මික බෝග වගාවන්හි ඇස්තමේන්තු කරන ප්‍රමාණයම අස්වැන්න ලබාගැනිමේ හැකියාවක් සාමාන්‍යයෙන් නොමැත. ඒ අනුව, පොල් අස්වැන්නේද එවැනි විචල්‍යතාවයන් සිදුවිය හැකිය. එසේවුවද, පසුගිය වර්ෂවල ඇස්තමේන්තු පොල් ඵලදාවට ආසන්න ඵලදාවක් ලබාගැනිමට හැකියාව ලැබී ඇත.

4.1.(ඉ). ආදර්ශ පොල් උයන්හි මයිටා හානි පාලනය.

විලෝපිත මයිටා භාවිතය ජෛව විද්‍යාත්මක ක්‍රමයක් වුවද, තිරසාර ප්‍රතිඵලයක් නොවේ. මෙහි ප්‍රතිඵල විවිධ පරිසර තත්ව යටතේ වෙනස් වේ. 100% ක මර්ධනයක් ද සිදු නොවේ. දිගින් දිගටම අඛණ්ඩව යෙදීම තුලින් පාලනයක් සිදු කර ගත හැකිය.

මේ වනවිට, සියලු ආදර්ශ පොල් උයන් සඳහා මයිටා ගහනය වැඩි ක්ෂේත්‍ර සඳහා විලෝපීය මයිටාවන් යෙදිමේ කාර්යයන් ආරම්භ කර ඇති අතර, පහත පරිදි සියලු ආදර්ශ පොල් උයන් සඳහා විලෝපීය මයිටා යොදා ඇත.

| ආදර්ශ පොල් උයන | යොදන ලද විලෝපීය මයිටා බැග් ගණන |
|---|---|
| **ගර්ට්ලන්ඩ්** | 400 |
| **කොහොඹාන** | 1010 |
| **ලේනව** | 1000 |
| **මහයාය** | 3000 |
| **පාසිකුඩා** | 2691 |
| **නාගන්සෝල** | 1500 |
| **කොරෙයි** | 1702 |
| **ඩෙසිවැලි** | 5352 |
| **පලෙයි** | 300 |
| **මුන්දලම** | 100 |
| **රන්දෙනිය** | 850 |
| **බෝපිටිය** | 330 |
| **මුළු එකතුව** | 18235 |

මෙම විලෝපිය මයිටාවන් යෙදීම, සෑම මාස 04කටම වරක් යෙදිය යුතු අතර, වසරකට හතර වතාවක් යෙදීම මගින් මයිටා පාලනයක් බලාපොරොත්තු විය හැක.

ඒ අනුව මෙම විලෝපීය මයිටා යොදන ලද ක්ෂේත්‍රවල මයිටා පාලනය වීම විවිධ පරාමිතික ඔස්සේ අධ්‍යයනය කරනු ලබන අතර, ඉදිරියේදී මෙහි ප්‍රතිඵල ලබාගැනීමට හැකි වේ.

4.2.3 තවාන් පරීක්ෂාව

මේ වනවිට සියලු තවාන් භාර නිලධාරීන් හට තවාන් නඩත්තු කටයුතු, කාර්යාල ක්‍රම, පොත්පත් හා ලේඛන නඩත්තුව, සම්බන්ධයෙන් මනා පුහුණුවක් ලබා දී ඇති අතර, අදාල තවාන් ප්‍රධාන කාර්යාලය මගින් පරීක්ෂා කිරීමේදී පිරික්සුම් ලේඛනයට අදාළව තවාන්වල සියලු පොත්පත් නිරතුරු පරීක්ෂාවකට ලක්කරනු ලබයි.

4.2. කළමණාකරණ අකාර්යක්ෂමතා

4.2.1 අරමුදල් ආයෝජනය

සත්දින තැන්පත් යනු කෙටි කාලීන තැන්පත් ක්‍රමයක් නොවේ. එනම් දින 7 ක් කල් දී මුදල් ආපසු ලබාගැනීමේ ක්‍රමය අනුව කරනු ලබන තැන්පතුවකි. කාලසීමාවක් නිශ්චිත නොවන තැන්පතු ක්‍රමයකි. මෙම සත්දින තැන්පත් හා ස්ථාවර තැන්පත් අතර, වෙනස වන්නේ ස්ථාවර තැන්පත් නිශ්චිත දිනයකදී කල් පිරීමත්, සත්දින තැන්පත් කල් පිරීමට නිශ්චිත දිනයක් නොමැති වීමත් ය. ස්ථාවර තැන්පත් මුදල් ආපසු ලබාගත් හැක්කේ නියමිත දිනට කල් පිරීමෙන් පසුවය. ඊට පෙර මුදල් ආපසු ගතහොත්, නියමිත පොලිය අහිමි වේ. නමුත් සත්දින තැන්පතුවක මුදල් ආපසු ගැනීම අවශ්‍ය වූ විට දින 7 ක කල්දීමක් තුළ මුදල් ආපසු ලබාගත හැකි අතර, ලබා දී ඇති පොලිය එලෙසම ගෙවනු ලබයි. මේ නිසා ක්ෂණික මුදල් ලබාගැනීම් සඳහා සුදුසුම තැන්පත් ක්‍රමය සත්දින තැන්පත් ක්‍රමය වන නිසා, මණ්ඩලය විසින් එම ක්‍රමයට අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට තෝරාගෙන ඇත. මෙහි සඳහන් තැන්පත් සඳහා රු: 1486681.51 ක් හා රු: 2941986.56 ක පොලියක් මණ්ඩලයට ලැබී ඇත. මේ නිසා මෙය කෙටිකාලීන ආයෝජන ක්‍රමයක් නොවන අතර, දින නියමයක් නොමැති අවශ්‍යතාවය අනුව ආපසු මුදල් ලබාගත හැකි ස්ථිර ආයෝජන ක්‍රමයකි. මේ සඳහා ස්ථිර ආයෝජන සඳහා ගෙවන පොලී අනුපාතයම ගෙවන බැවින් මණ්ඩලයට විශේෂ ආදායම් අහිමි වීමක් සිදු වී නැත.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ත්‍රිකුණාමලය නිල නිවාස ඉදිකිරීම් බිල්පත් ගෙවීමේදී පළමු, දෙවන හා තෙවන බිල්පත් සඳහා ගෙවන ලද වැට් බදු ප්‍රමාණය 4 වන බිල්පතින් සම්පූර්ණයෙන්ම අය කර ගෙන ඇත.

දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් අදාළ කොන්ත්‍රාත්කරු වැටු බදු ගෙවන්නකු බවට සහතික කර ඇති බැවින් සහ කොන්ත්‍රාත්කරු වැට් බදු ඉල්ලීම් කර ඇති බැවින්, පාසිකුඩා ඉදිකිරීම්වලට අදාල කොටස් ගෙවීම් කිරීමේදී වැට් බදු ගෙවීම නිවැරදි වේ.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

මණ්ඩලයට අදාළ වැටුප් හා සේවක සංඛ්‍යා අනුමැතිය ලැබීමෙන් පසු එතෙක් ප්‍රමාද වී තිබුණු සේවක පුරප්පාඩු පිරවීම ආරම්භ කර ඇත. ඉල්ලීම් කරන ක්ෂේත්‍ර නිලධාරී වැනි තනතුරු සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් නොලැබීම, බඳවා ගත් නිලධාරීන් සේවයෙන් ඉවත්වීම වැනි හේතූන් මත පුරප්පාඩු පිරවීම අසීරු වී ඇත.

සභාපති,

පොල් වගාකිරීමේ මණ්ඩලය.

# 08. විශේෂ වැඩසටහන්







## 08.01 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේදී ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම

අම්පාර හාඩි විදුහල් භූමියේදී පැවැත් වූ 2013 දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රදර්ශන කුටි අභිභවා ප්‍රථම ස්ථානය ලබා ගැනීමට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටියට හැකිවිය.

දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ ප්‍රදර්ශන කුටි 400ක් පමණ ඉදිකර තිබූ අතර පෞද්ගලික අංශයේ ආයතනවලට අමතරව රාජ්‍ය අංශයේ අමාත්‍යාංශ 53ක් මෙම ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කර තිබුණි. එසේම ප්‍රදර්ශනය නැරඹීමට ආ පිරිසෙන් වැඩිම ජනතා ආකර්ෂණයක් තිබූ කුටිය, සංවිධානාත්මකභාවය, අමුද්‍රව්‍ය භාවිත කළ ආකාරය ඇතුළු කරුණු 10ක් මුල්කොට මේ ජයග්‍රාහකයන් තෝරා ගනු ලැබීය.

පොල් ආශ්‍රිත ස්වභාවික අමුද්‍රව්‍ය හැකිතාක් යොදා ගනිමින් අලංකාර ලෙස නිමවා තිබීම අප ප්‍රදර්ශන කුටියේ ප්‍රධාන, කැපීපෙනෙන ලක්ෂණයක් වූ අතර පොල් පැළයක් රෝපණය කිරීමේ සිට පොල් ගසේ විවිධ කොටස් අපනයනය කිරීම දක්වා සකස් කරනු ලබන ආකාරය සජීවී නිදර්ශක මගින් අප ප්‍රදර්ශන භූමියෙන් නිරූපණය කර තිබිණි.